Department of Finance UOK
Finance Students' Association of University of Kelaniya
Finance Students' Association - University of Kelaniya

www.fcms.kln.ac.lk

# මූල්‍ය විමසුම

Finance
Review
2021




ලොව
"සතුට පිළිබඳ දර්ශකය"
ගැන දැනගනිමු

මානව සම්පතේ වටිනාකම
කාලීන ඇගයීම

උසස් පෙළ පන්තියට
පෙරවදනක්

## විභාගයට අත්වැලක්

සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න

## සිප්වරණ

ප්‍රශ්නෝත්තර
තරගාවලිය

මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# මූල්‍ය විමසුම

අ.පො.ස. උසස් පෙළ (2022) සම්මන්ත්‍රණ වැඩමුළුව නිමිත්තෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ, මූල්‍ය අධ්‍යයන අංශයෙහි, මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින් සිදුකරන ලද ප්‍රකාශනයකි.

**ISSN 2279-3089**

මෙහි පළකරන ලිපි පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයන් සතු වන බැවින් සංස්කාරකවරුන් හෝ මූල්‍ය අධ්‍යයන අංශය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

ලිපි සැපයීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ වාණිජ විෂය ධාරාව අරමුණු කොට ගෙන සම්පාදනය කර ඇති මූල්‍ය විමසුම උසස් පෙළ වාණිජ විෂය නිර්දේශය මත පදනම්ව සකසා ඇති අතර මෙහි ඉදිරි කලාප සඳහා ලිපි ඉදිරිපත් කිරීමට කථිකාචාර්යවරුන්ට සුහදව ඇරයුම් කර සිටිමු.


## ප්‍රධාන සංස්කාරක

එස්. එල්. සුදසිංහ

## සංස්කාරක මණ්ඩලය

එච්. එම්. එන්. පි. හේරත්

එච්. එම්. එ. එල්. ගුණසේකර

එච්. ජේ. ආර්. බුද්ධික

ඩබ්. පී .අයි. දේවින්දි ප්‍රේමරත්න

ඩී. එම්. යූ. එච්. දිසානායක

## අධීක්ෂණය

ආචාර්ය ආර්. අබේසේකර



විමසීම් : 011-2903553

සංස්කරණය : 2021 ඔක්තෝම්බර්



# පටුන


| | |
|---|---|
| අංශාධිපතිතුමාගේ පණිවිඩය | 01 |
| මූල්‍ය ශිෂ්‍ය සංගමයේ පණිවිඩය | 02 |
| සංස්කාරකතුමියගේ පණිවිඩය | 03 |
| විභාගයට අත්වැලක් : සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න | 04 |
| ලොව "සතුට පිළිබඳ දර්ශකය" ගැන දැනගනිමු | 07 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රශ්නයට ලකුණු උපරිමය ගනිමු | 10 |
| උසස් පෙළ පන්තියට පෙරවදනක් | 13 |
| ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන මූල්‍ය ආයතන පද්ධතිය | 15 |
| වෙළෙඳපොළ ක්‍රියාවලියට ආණ්ඩුවේ මැදිහත්වීම | 21 |
| ආර්ථිකයේ ජීවමය හදවත පිළිබඳ ඔබ දැනුවත් ද ? | 23 |
| මොකක්ද මේ වෙළෙඳපොළ අධිකාරිය කියන්නේ ? | 26 |
| හෙට දවස වෙනුවෙන් පරිභෝජනය කැප කිරීමට ඇති ඔබත් සූදානම් ද ? | 29 |
| "A"සාමාර්ථ තුනකින් නොව "A"සාමාර්ථ හතරකින් උසස් පෙළ ජය ගනිමු ! | 33 |

රාජ්‍ය අයවැය ලේඛනය 35

මුදල් වෙළෙඳපොළ 37

ඒක පුද්ගල ආදායම හා ලෝක බැංකු ආර්ථික ශ්‍රේණිගත කිරීම 39

මානව සම්පතේ වටිනාකම කාලීනව ඇගයීම 41

ඇත්තටම ව්‍යවසායකත්වය කියන්නේ මොකක්ද? 44

ජාතික ගිණුම් අමාරුයි ද? 47

චෙක්පත් ගැන ඔබ දැනුවත්ද? 50

සංකීර්ණ LKAS-16 සරලව ඉගෙන ගනිමු 55

නිවැරදිව ආයෝජන තීරණයක් ගනු ලබන්නේ කෙසේද? 61

උද්ධමනය හා එහි හැසිරීම පිළිබඳ ආර්ථික විද්‍යාත්මක විග්‍රහයක් 64

Covid-19 වසංගතයේ බලපෑම වෙළෙඳපොළ සමතුලිතය ට බලපෑවේ කෙසේද? 67

“සිප්වරණ” ප්‍රශ්නෝත්තර තරගාවලිය 70

අනුග්‍රාහක භවතුන්ගේ පණිවිඩ 71

සංවිධායක කමිටුව 74






# අංශාධිපතිතුමාගේ පණිවිඩය

පවතින Covid-19 වසංගත තත්ත්වය හමුවේ උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රායෝගික ගැටලු මග හරිමින් උසස් පෙළ විෂය නිර්දේශය මනාව ආවරණය කරමින් සිසුන්ට අවශ්‍ය ඉතා වටිනා දැනුම් සම්භාරයක් ලබා දීම මෙම සඟරාවේ ප්‍රධානතම අරමුණ වේ. මූල්‍ය අධ්‍යයන අංශයේ කථිකාචාර්ය මණ්ඩලය මෙන් ම විද්‍යාර්ථීන්ගේ සහයෝගිතාවෙන් නිර්මාණය කරනු ලබන මෙම සඟරාව වෙනත් වර්ෂයන්ට වඩා විශේෂත්වයක් ගනු ලබන්නේ එම නිසාවෙනි.

මෙම මූල්‍ය ලිපි ඇතුළත් සඟරාව, අනාගත ව්‍යාපාර ලෝකයට පිවිසීමට සැරසෙන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ කුසලතා, විශ්ලේෂණ කුසලතා, නිවැරදි තීරණ ගැනීමේ කුසලතා, තාර්කික චින්තනය මෙන්ම අභියෝග වලට මුහුණ දීමේ හැකියාව වර්ධනයට ද මහගු පිටිවහලක් වන බව නොඅනුමානයි .

අ.පො.ස. උසස් පෙළ (2022) සම්මන්ත්‍රණ වැඩමුළුවට සමගාමීව එළිදක්වනු ලබන මෙම "මූල්‍ය විමසුම" සඟරාව තම දැනුම වර්ධනය කර ගැනීමට උත්සාහ ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මනා අත්වැලක් වනවා මෙන්ම ඔබ සැමගේ සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි අපි නිරන්තරුවම විශ්වාස කරමු .

ආචාර්ය ආර්. අබේසේකර
අංශ ප්‍රධාන
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්ව විද්‍යාලය

# මූල්‍ය ශිෂ්‍ය සංගමයේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාල මූල්‍ය අධ්‍යයන අංශ ශිෂ්‍ය සංගමය විසින් “ශිල්ප 2021” අ.පො.ස උසස් පෙළ සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව අටවන වරටත් “මූල්‍ය විමසුම“ සඟරාව එළිදක්වනුයේ ඉතාමත් ගෞරවයෙනි.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ නොයෙකුත් බාධා මත සරසවි සිහිනය සැබෑ කර ගැනීමට වෙර දරන සිසු සිසුවියන්ට දැනුම පෝෂණය කිරීම සහ අත්වැලක් වීමේ අරමුණු පෙරදැරි කොට මෙම සඟරාව එළි දක්වන ලදී.

කැලණිය විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ සහ විද්‍යාර්ථීන්ගේ එකමුතුවෙන් එළිදක්වනු ලබන මෙම සඟරාව අ.පො.ස උසස් පෙළ වාණිජ විෂය ධාරාව හදාරන සිසුන් වෙනුවෙන් බිහි වූ වාණිජ පාඨ ග්‍රන්ථයක් ලෙස හැඳින්විය හැක.
මෙම සඟරාව යථාර්ථයක් කරගැනීම උදෙසා නන් අයුරින් සහයෝගය දුන් සෑම දෙනාටම ස්තුතිය පුද කරමු.

මෙම සඟරාව පරිශීලනය කොට දැනුම පෝෂණය කර ගනිමින් උසස් පෙළ විභාගය සාර්ථකව ජයග්‍රහණය කිරීමට ඔබ සැමට සුබ පතමු.

මූල්‍ය ශිෂ්‍ය සංගමය
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# සංස්කාරකතුමියගේ පණිවිඩය

උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම දැනුම පුළුල් කර ගැනීමට මෙන් ම නව දැනුම වර්ධනය කර ගැනීමට, නිවැරදි හා නව්‍ය ලිපි ඇතුළත් මූල්‍ය විමසුම සඟරාව මෙවරත් මූල්‍ය අධ්‍යයන අංශය මගින් අපි ඉතාමත් ගෞරවයෙන් යුතුව එළිදක්වනු ලබමු.

වත්මන් ශ්‍රී ලාංකික ආර්ථික තත්ත්වය හමුවේ, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව හා කළමනාකරණ සංකල්ප අධ්‍යනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් මතු වී තිබේ. එවැනි කාල වකවානුවක මෙම මූල්‍ය විමසුම සඟරාව එළිදැක්වීම ඉතා කාලෝචිත තීරණයකි.

උසස් පෙළ විෂය නිර්දේශය ආවරණය කරමින් ප්‍රකාශයට පත් වන මෙම මූල්‍ය විමසුම සඟරාව,මූල්‍ය අධ්‍යයනය අංශයේ කථිකාචාර්ය මණ්ඩලය මෙන් ම විද්‍යාර්ථීන්ගේ සාර්ථක වෑයමක් වන අතර එය යථාර්ථයක් බවට පත් කරගැනීමට නන් අයුරින් සහයෝගය ලබා දුන් ඔබ සැමට අපගේ හද පිරි ස්තූතිය සහ ගෞරවය පුද කර සිටිමු.

සඳලි සුදසිංහ මිය
කථිකාචාර්ය (සහකාර)
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# විභාගයට අත්වැලක්

## සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න

Covid-19 වසංගත තත්ත්වය හමුවේ 2021 අ.පො.ස. උසස් පෙළ විභාග කඩයිමට මුහුණ දීමට සිටින ඔබ සැම පෙර වසරවල විභාග අපේක්ෂකයන් හා සසඳන විට බාධක සහ අභියෝග රැසකට මුහුණදුන් දරුදැරියන් පිරිසකි. 2018 වසරේ දෙසැම්බර් මස අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවසන් කල ඔබ පුරා වසර දෙකකුත් මාස 10කට ආසන්න කාලපරිච්ඡේදයක් උසස් පෙළ කඩයිම් විභාගය සඳහා තම කාලය කැපකර ඇත. එහිදී ඔබට විවිධ ක්‍රම ඔස්සේ තම අධ්‍යාපන කටයුතු සඳහා යොමු වීමට සිදුවීම සහ පවතින වසංගත තත්ත්වය හමුවේ විවිධ අභියෝග වලට මුහුණ පා තම කැපවීම තුලින්ම තම සාර්ථකත්වය කරා යන ගමනක නිරත වේ. ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වන උසස් පෙළ කඩයිම් විභාගය යනු ඔබ උගත් සිද්ධාන්ත දැනුම හා එහි ප්‍රායෝගික භාවිතය ඉතා කෙටි කාලයක් තුළ තක්සේරු කරන මිනුම් දණ්ඩකි. ව්‍යාපාර අධ්‍යයනය විෂය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයක් වන අතර උසස් පෙළ කඩයිම් විභාගයේ ව්‍යාපාර අධ්‍යයන විෂයට පෙනී සිටින දරුවන්ට අත්වැලක් සැපයීම මෙම ලිපියේ අරමුණ වේ.

ව්‍යාපාර අධ්‍යයන ප්‍රශ්න පත්‍රය තුලින් ඔබගේ හැකියාව හා අවබෝධය විවිධ කෝණයන් ඔස්සේ මැන බලන බව ඔබ අවබෝධ කරගත යුතු අතර ප්‍රශ්න සැකසී ඇති ආකාරය පිළිබඳව ඔබ හොඳින් අවබෝධ කර ගැනීම සාර්ථකව පිළිතුරු සැපයීමට මගපෙන්වීමක් වෙයි. උසස් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ හැකියාවන් වල ප්‍රමාණාත්මක බව තක්සේරුකරණය ඔබ විසින්ම කිරීම අත්‍යවශ්‍ය වේ.

පහත ප්‍රශ්නවලට ඔබ ලබාදෙන පිළිතුර කුමක්ද**?**

| | |
|---|---|
| ප්‍රශ්න අංක එක - | මා කොතරම් සිද්ධි අධ්‍යයන ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ලබා එම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇත්ද? |
| ප්‍රශ්න අංක දෙක - | මගේ ව්‍යාපාර අධ්‍යයන න්‍යායාත්මක දැනුම භාවිතා කරමින් සිද්ධි අධ්‍යයන උපයෝගී කරගනිමින් ප්‍රශ්න විශ්ලේෂණාත්මකව විග්‍රහ කර පිළිතුරු ලිවීමේ හැකියාව කෙසේද? ඒ පිළිබඳ මා හට ස්වයං තක්සේරුවක් තිබේද? |

කිසියම් තොරතුරක් අර්ථකථනය කිරීමේ, තේරුම් ගැනීමේ, පැහැදිලි කිරීමේ හා පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී ඔබේ නිර්මාණශීලී හැකියාව පිළිබඳ තක්සේරු වන ආකාරයේ ප්‍රශ්න ඔබට දැකිය හැක. විශේෂයෙන් සිද්ධියක් තුලින් ප්‍රායෝගික දැනුම ඔබ උගත් මූලධර්ම සිද්ධාන්ත වෙනත් සමාන අවස්ථාවකට යොදා ගැනීමේ හැකියාව සැසඳීම, විශ්ලේෂණාත්මක බව තක්සේරු කරනු ලබයි.



සිද්ධි අධ්‍යයනය හා ඒ ආශ්‍රිත ප්‍රශ්න තවදුරටත් විග්‍රහය තුළින් අපට මෙය තවදුරටත් තහවුරු කරගත හැකිය.

## සිද්ධි අධ්‍යයනය 1

වයස අවුරුදු 60ක් වන කමනි විවිධ නිර්මාණාත්මක බතික් සාරි නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක නිරත වේ.නිර්මාණකරණය පිළිබඳව ඇය සතුව වසර 30ක දැනුමක් හා පළපුරුද්දක් ඇත.ඇය තම ලාභය වර්ධනය කර ගැනීමට සාරි සඳහා ඉතා ඉහළ මිලක් නියම කරනු ලැබුවත් ඇයගේ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. පවතින කොරෝනා වසංගතය හමුවේ වුවද ඇයගේ නිෂ්පාදන සඳහා ඉල්ලුමෙහි අඩුවක් නොමැති වූ අතර මංගත (online) ක්‍රමය හරහා ඉල්ලීම් කිරීමේ හැකියාව ද ගනුදෙනුකරුවන් විමසයි. නමුත් මංගත (online) ක්‍රමය හරහා ව්‍යාපාර කිරීම පිළිබඳව හා මූල්‍ය ගනුදෙනු කිරීම පිළිබඳව කමනි සතුව දැනුමක් නොතිබුණි. කමනි තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා උත්සාහ කරමින් සිටී.

**දැන් අප සිද්ධියට අදාළ ප්‍රශ්න දෙසට අවධානය යොමු කරමු.**

1)ඉහත සිද්ධි අධ්‍යයනයෙහි ඇතුළත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම විස්තර කරන්න.
2)ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු මොනවාද?
3)සාරි සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි සාධක දෙකක් සඳහන් කරන්න.
4)කමනි සතුව ඇති ශක්තියක් සඳහන් කර,ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදාගත හැකි දැයි පැහැදිලි කරන්න.
5)මංගත ක්‍රමය හරහා වෙළඳාම නිරත වුවහොත් කමනිට ලබා ගත හැකි වාසි දෙකක් හා අවාසි දෙකක් පැහැදිලි කරන්න.
6)කමනි තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද?
7)බතික් කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා දෙකක් හා තර්ජන දෙකක් ලියන්න.

## සිද්ධි අධ්‍යයනය 2

Talent බේකර්ස් සහ පුත්‍රයෝ නමින් බේකරි නිෂ්පාදන සහ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන වජිර මහතා තම බේකරි නිෂ්පාදන කටයුතු තම නිවසේම සිදු කරන අතර විකිණීමේ ව්‍යාපාරය කුලී පදනම මත ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබයි. මාසිකව රු.75000ක් කුලී ලෙස ගෙවීමට සිදු වන අතර 5km ක දුරින් එම විකිණීමේ ස්ථානය පිහිටා ඇත.ඔහුගේ බේකරි නිෂ්පාදන සඳහා ගනුදෙනුකරුවන් ඉතා කැමැත්තක් දක්වයි. වසර 10ක් ප්‍රසිද්ධ බේකරි නිෂ්පාදන සමාගමක අලෙවි කළමනාකරුවෙකු ලෙස සේවය කර මනා පළපුරුද්දක් ඇති වජිර නව නිෂ්පාදන හඳුන්වාදීම නිතතින් සිදු කරනු ලබයි.
බැංකු ණයක් මත තම ව්‍යාපාරය ආරම්භ කළ ඔහු නිෂ්පාදන තම නිවසේ සිට වෙළෙඳසැල දක්වා ප්‍රවාහනයට තම ලොරි රථය භාවිතා කරයි. පැවැති කොරෝනා වසංගතයේ පළමු රැල්ල සමයේ පැවැති තත්ත්වය හමුවේ මාස කිහිපයක් තම වෙළෙඳ කටයුතු වලින් ඉවත්ව සිටීමට වජිරට සිදුවීම නිසා විශාල පාඩුවක් සිදු විය.කිසිදු ආදායමක් නොමැති වුවද ගොඩනැගිලි කුලී ගෙවීමට සිදු විය.
නමුත් තෙවැනි රැල්ල සමය වන විට වජිර කුලී පදනම මත ගත් ගොඩනැගිල්ලක පැවැති තම නිෂ්පාදන විකිණීමේ ව්‍යාපාරය වසා දමා තම නිවසේ පැවැති නිෂ්පාදන ව්‍යාපාරය පමණක් පවත්වාගෙන යමින් තම ලොරි රථය යොදා ගනිමින් තමන්ම ජංගම රථ සේවාවක් පවත්වාගෙන ගියේය. එය ඉතා සාර්ථක බවත් එකදු දිනයකවත් තම නිෂ්පාදන කටයුතු වලට බාධා ඇති නොවූ බවත් වජිර තම බැංකු කළමනාකරු සමඟ පවසා ඇත.

**දැන් අපි මෙම සිද්ධියට අදාළ ප්‍රශ්න දෙසට අවධානය යොමු කරමු .**

1) **මෙම ව්‍යාපාරය** හිමිකාරිත්වය, අරමුණ, පරිමාණය, නිෂ්පාදන අංශය යන නිර්ණායක අනුව වර්ග කරන්න.
2) **වජිරගේ ව්‍යාපාරය** ඉටු කරනු ලබන්නේ පුද්ගල අවශ්‍යතාවයක් ද, නැතහොත් වුවමනාවක් ද, යන්න කෙටියෙන් විස්තර කරන්න .
3) **මෙම ව්‍යාපාරයේ** ශක්තියක් සහ දුර්වලතාවයක් දක්වන්න .
4) **වජිරගේ ව්‍යාපාරය අයත් කර්මාන්තය** ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර දෙකක් විස්තර කරන්න
5) **මෙවැනි වූ ව්‍යාපාර** වල දැකිය හැකි සීමා හතරක් **සඳහන් කරන්න** .
6) **වජිරගේ ව්‍යවසායකත්ව** ගති ලක්ෂණ හා කුසලතා තවදුරටත් වර්ධනය කරගත හැකි ආකාර හතරක් පැහැදිලි කරන්න.

| සිද්ධි අධ්‍යයනය 3 |
|---|
| සමන් සහ නිමල් විදේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන කිරිපිටි තොග වශයෙන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යති. කිරිපිටි ආනයන සීමා මත කිරිපිටි වෙළෙඳපොළේ භාණ්ඩ හිගයක් ඇති වූ අතර කිරිපිටි තොග ලබාගැනීමට නොහැකි තත්ත්වයක් ඇතිවිය. Covid-19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරයට මූල්‍ය දුෂ්කරතා රාශියකට ද මුහුණ දීමට සිදුවිය.දිනපතා තම ගනුදෙනුකරුවන් කිරිපිටි මිලදී ගැනීමට ආයතනයට පැමිණීමත්, ඔවුන් ආපසු හරවා යැවීමට සිදුවීමත් , ඔවුන් අපහසුතාවයට පත්කිරීමට හේතුවක් විය.තම ගනුදෙනුකරුවන්ට අවශ්‍ය භාණ්ඩ සැපයීමට නොහැකි වීමත්, කිරිපිටි ආනයනයත්, ව්‍යාපාරයේ අවිනිශ්චිතතාවයත්, මූල්‍ය දුෂ්කරතාත් නිසා සමන් ව්‍යාපාරය වසා දැමීමට තීරණය කළේය.නමුත් ව්‍යාපාරය පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශව හා නිමල් එම තීරණය කෙරෙහි විරෝධය දැක්වූහ. |
| 1) මෙම ව්‍යාපාරය හිමිකාරිත්වය, අරමුණ, පරිමාණය, නිෂ්පාදන අංශය යන නිර්ණායක අනුව වර්ග කරන්න.<br>2) **සමන්ගේ ව්‍යාපාරය** ඉටු කරනු ලබන්නේ පුද්ගල අවශ්‍යතාවයක් ද නැතහොත් වුවමනාවක් ද යන්න කෙටියෙන් විස්තර කරන්න.<br>3) ඉහත ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශව 2ක් නම් කර, එක් එක් පාර්ශවය එසේ උනන්දු වීමට බලපානු ලබන එක් හේතුව බැගින් දක්වන්න.<br>4) **මෙවැනි වූ ව්‍යාපාර** වල දැකිය හැකි සීමා හතරක් **සඳහන් කරන්න**.<br>5) කිරිපිටි ආනයන සඳහා පනවනු ලබන ආනයන (සීමා) තුළින් බලපෑම් ඇති කරනු ලබන පාර්ශව හතරක් නම් කර එම එක් එක් පාර්ශවයට ලැබෙන වාසි 2ක බැගින් සඳහන් කරන්න. |
| |
| - |

සිද්ධිය තුළින් උකහා දක්වා ඇති සිද්ධාන්ත සහ සිද්ධිය තුළින් ප්‍රශ්න ගොඩනැගී ඇති ආකාරය තේරුම් ගැනීම කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීම වැදගත් වෙයි. සිද්ධාන්ත දැනුම ප්‍රායෝගිකව පරීක්ෂාව මෙහි අරමුණ බව ඔබට අවබෝධ විය යුතු අතර ඒ නිපුණතා පිළිබඳ ඔබ අවබෝධ කරගත යුතුයි.

ඔබගේ පිළිතුරු සැපයීමේ හැකියාව පිළිබඳ ස්වයං තක්සේරුවක් කිරීම තුළින් හා පිළිතුරු ලිවීමේ හැකියාව වර්ධනය කරගත යුතු අවස්ථා පිළිබඳ අවබෝධය තුළින් ඉදිරි විභාග කටයුතු සාර්ථකව නිම කිරීමට හැකියාව හිමිවනු ඇත.

**සියලු අභියෝග ජය ගනිමු. ඔබ සියලු දෙනාටම විශිෂ්ට ජයග්‍රහණයක් ප්‍රාර්ථනා කරමි.!!**



මහාචාර්ය සුසීමා වැලිගමගේ
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය




# ලොව "සතුට පිළිබඳ දර්ශකය" ගැන දැනගනිමු.

ආදරණීය දුවේ පුතේ, "සතුට" යන සංකල්පය පිළිබඳව ඔබේ නිර්වචනය කුමක්ද?

මෙම ප්‍රශ්නය ඔබට තරමක් සංකීර්ණ විය හැකියි. ඒකට හේතුව "සතුට" යන්න නිර්වචනය කිරීම තරමක් අපහසු කාරණාවක් නිසා. නමුත් දාර්ශනිකයන්, සමාජ විද්‍යාඥයින්, කවියන් මෙන්ම ආර්ථික විශේෂඥයින් පවා සතුට පිළිබඳ නිර්වචනයන් විවිධ කෝණයන් හරහා ඉදිරිපත් කිරීමේ උත්සාහයක යෙදෙන බව අපට දැකගත හැකියි .

ලොව "සතුට" පිළිබඳ සංකල්පය මෑත කාලීනව කතාබහට ලක්වුණේ "එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන විසඳුම් ජාලය"- "United Nations Sustainable Development Solutions Network" විසින් ප්‍රථම වරට "සතුට" පිළිබඳ දර්ශකයක් (World Happiness Index) ඉදිරිපත් කිරීම තුළින් මෙන්ම "සතුට" සංකල්පය හරහා ලොව රටවල් වර්ගීකරණය කිරීම හරහාය. 2012 වර්ෂයේ "සතුට" පිළිබඳ වාර්තාව (World Happiness Report) මුල්ම වරට ඉදිරිපත් කළ අතර සෑම වර්ෂයකම මාර්තු 20 දින, එනම් "ජාත්‍යන්තර සතුට පිළිබඳ දිනය (World Happiness Day) තුළ ඔවුන් විසින් යාවත්කාලීන වාර්තාවක් ඉදිරිපත් කරනු ලබනවා. මෙම වාර්තාව තුළින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් "සතුට" සංකල්පයේ වැදගත්කම මෙන්ම රටක තිරසාර සංවර්ධනයක් උදෙසා එහි අවශ්‍යතාවය මැනවින් හුවා දැක්වීමක් කරනු ලබනවා.

සතුට සංකල්පය මැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සැලකිල්ලට ගනු ලබන කරුණු මොනවාද?

01) දළ ජාතික නිෂ්පාදිතය - Gross National product

02) සමාජ සංහිඳියාව -Social support

03) සෞඛ්‍ය සම්පන්න ජීවිතය පිළිබඳ අපේක්ෂාවන් - Healthy life expectancy

04) තීරණ ගැනීමේ නිදහස - Freedom to make choices

05) ත්‍යාගශීලී බව - Generosity

06) වංචා සහ දූෂණය සහ අක්‍රමිකතාවන් - Perceived corruption

07) ආකල්ප සහ හැඟීම් - Recent emotions

ඉතින් ඔබට තේරුම් ගැනීමට පුළුවන් දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය පුද්ගලයින්ගේ ආදායම සහ ඔවුන්ගේ මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීමට ඉවහල් වන බව. එසේම, සමාජ සංහිඳියාව, ත්‍යාගශීලී බව, තීරණ ගැනීමේ නිදහස, යහපත් ආකල්ප, දූෂණය සහ අක්‍රමිකතාවන් අවම වීම මෙන්ම නිරෝගී බව මානසික යහපැවැත්ම සහ සතුට වර්ධනය කිරීමට උපකාරී වන බව.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම සාධක සමස්තයක් ලෙස ගෙන දර්ශකයක් සැකසීම තුළින් රටවල් වර්ගීකරණය කරනු ලබන අතර 2020 වර්ෂයේ කරන ලද සමීක්ෂණයන්හි ප්‍රතිඵල තුළින් සහ විශේෂයෙන් Covid 19 වසංගත තත්ත්වය හරහා ජන ජීවිතයට වූ බලපෑමත් සැලකිල්ලට ගනිමින් 2021 වර්ෂයේ වාර්තාව සකස් කොට තිබෙනවා.

ඒ අනුව 2020 වර්ෂයේ දත්ත මත පදනම්ව සතුට පිළිබඳ ඉහළ සහ අවම දර්ශකයන් හිමිවන රටවල් 05 මෙසේ වර්ගීකරණය කර දක්වන්න පුළුවන් .

වගුව 01 - සතුට පිළිබඳ දර්ශකය ඉහළම අගයක් ගන්නා රටවල්

| රට | වර්ගීකරණය | දර්ශක අගය |
|---|---|---|
| ෆින්ලන්තය | 01 | 7.842 |
| ඩෙන්මාර්කය | 02 | 7.620 |
| ස්විට්සර්ලන්තය | 03 | 7.571 |
| අයිස්ලන්තය | 04 | 7.554 |
| නෙදර්ලන්තය | 05 | 7.464 |

මූලාශ්‍රය: World Happiness Report 2021

වගුව 02 - සතුට පිළිබඳ දර්ශකය පහළම අගයක් ගන්නා රටවල්

| රට | වර්ගීකරණය | දර්ශක අගය |
|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | 149 | 2.523 |
| සිම්බාබ්වේ | 148 | 3.145 |
| රුවන්ඩාව | 147 | 3.415 |
| බොට්ස්වානා | 146 | 3.467 |
| ලෙසොතෝව | 145 | 3.512 |

මූලාශ්‍රය: World Happiness Report 2021





ඉහත දත්ත වලට අනුව ලොව මිනිසුන් සතුටින්ම සිටින රටවල් අතරින් පළමු ස්ථානය ෆින්ලන්තයටත් අවසාන ස්ථානය ඇෆ්ගනිස්ථානයටත් හිමිව තිබෙනවා. රටවල් 149ක වර්ගීකරණයක් තුළින් ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ 129 වන ස්ථානය වන අතර  දර්ශක අගය 4.325 . දකුණු ආසියාතික රටවල් අතරින් ශ්‍රී ලංකාව සිටින්නේ බංගලාදේශය, පාකිස්තානය , මාලදිවයින, භූතානය සහ නේපාලය යන රටවල් වලටත් පහළින් වීම කනගාටුවට කරුණක්. ඉතින් ශ්‍රී ලංකාවේ සතුට පිළිබඳ දර්ශකය නම් එතරම් සතුටුදායක මට්ටමක නැහැ.
ආර්ථික විශේෂඥයින්ගේ පෙන්වා දීම අනුව ශ්‍රී ලංකාවේ දේශපාලනික අස්ථාවරත්වය අවම කිරීම, වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළ, රැකියා පරිසරය තුළ දරුවන් සහ වැඩිහිටියන්ගේ මනසේ නිර්මාණය වී ඇති පීඩනය අවම කිරීමට උත්සාහ කිරීම, විනෝදාත්මක වැඩසටහන් වෙනුවෙන් යම් කාලයක් වෙන් කිරීම, යහපත් ආකල්ප හරහා වංචාව, දුෂණය, ළමා අපචාර සහ අක්‍රමිකතා අවම කිරීම මෙන්ම අවංක බව, එකමුතුකම, ස්වභාවධර්මයට ආදරය කිරීම  සහ සමාජ ආචාරධර්ම කුඩා කල පටන් හුරුපුරුදු වීම තුළින් ශ්‍රී ලාංකිකයන් වන අප  සියලු දෙනාටත් අනාගතයේදී ලොව සතුටින්ම මිනිසුන් සිටින රටක් ලෙස ආඩම්බරයෙන් පැවසීමට හැකිවනු නොඅනුමානයි. ඔබගේත් මගෙත් ප්‍රාර්ථනය විය යුත්තේද එයයි.

ජීවිතය විඳින්න. සතුටින් සිටින්න. ඔබට ජය !!!



ගංගා මධුෂාණි මිය
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රශ්නයට ලකුණු උපරිමය ගනිමු

උසස් පෙළ ගිණුම්කරණ 01 හා 02 ප්‍රශ්න පත්‍ර වල දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳ අවබෝධය මනිනු ලබයි. 02 වන ප්‍රශ්න පත්‍රයේදී මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ලබාගත හැකි ලකුණු මගහැරෙන්නේ ලකුණු ලබාදීමේදී අවධානයට යොමු කරනු ලබන ආකාර පිළිබඳ නොදන්නා නිසා විය හැකිය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී,

ව්‍යාපාරයේ නම,ගිණුම් කාලපරිච්ඡේදය,මුදල් ප්‍රවාහ ප්‍රකාශය යන්න මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඉහළින් ලිවීමට අමතක නොකරන්න.

මෙහෙයුම්,ආයෝජන,මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේ දී පිළිතුර වැරදි යැයි ඔබටම තේරුම් ගියද, ශුද්ධ මුදල් ප්‍රවාහ දක්වමින් ඔබට ලැබුණු පිළිතුරු යොදමින් අභ්‍යාසය පිළියෙල කර අවසන් කරන්න .

ඔබට බොහෝවිට අප ලකුණු ප්‍රදානය කරනුයේ නියම පිළිතුරු ම නොව ලද අගය පදනම් කරගෙනයි.

**මේ වනවිට මේ දරුවන් LKAS 07 ප්‍රමිතය හොඳින් අධ්‍යයනය කර ඇතැයි මම සිතමි. පහත නිර්වචනයන් පාඩම් කරගැනීම පළමු ප්‍රශ්න පත්‍රයට වැදගත් වනු ඇත.**

මුදල්
මුදල් හා සමාන දෑ
මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ඒ යටතට ගැනෙන අයිතම
ආයෝජන ක්‍රියාකාරකම් හා ඒ යටතට ගැනෙන අයිතම
මූල්‍ය ක්‍රියාකාරකම් හා ඒ යටතට ගැනෙන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන ආකාරය අනුව පිළියෙල කරන ක්‍රම 02 කි .

1. සෘජු ක්‍රමය
2. වක්‍ර ක්‍රමය

මා ඔබට අභ්‍යාසයක් ඉදිරිපත් කරන අතර ඒ සඳහා විසඳුම සෘජු ක්‍රමයට හා වක්‍ර ක්‍රමයට ඉදිරිපත් කර ඇත.





**මෙම අභ්‍යාසය ඔබ තනිව විසඳන්න.**

සීමිත ගෙට්වෙල් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශ පහත පරිදි ඔබට ලබාදී ඇත.

((2021.03.31)) දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් | | 8000 |
| විකුණුම් පිරිවැය | | (3500) |
| දළ ලාභය | | 4500 |
| ඉඩම් විකුණුම් ලාභය | | 500 |
| ක්ෂය - යන්ත්‍ර | 600 | |
| ගොඩනැගිලි | 400 | |
| අනෙකුත් වියදම් | 1500 | (2500) |
| බදු පෙර ලාභය | | 2500 |
| ආදායම් බද්ද | | (500) |
| කාලපරිච්ඡේදයේ ලාභය | | 2000 |

සීමිත ගෙට්වෙල් පොදු සමාගම
2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2021 | 2020 |
|---|---|---|
| ඉඩම් | 8000 | 10000 |
| ගොඩනැගිලි (පිරිවැය) | 8000 | 8000 |
| ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම | (3400) | (3000) |
| යන්ත්‍ර (පිරිවැය) | 9000 | 6000 |
| යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම | (2600) | (2000) |
| තොගය | 1500 | 1200 |
| වෙළඳ ලැබිය යුතු | 800 | 1300 |
| මුදල් | 2000 | 800 |
| | 23300 | 22300 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 17600 | 17000 |
| රඳවාගත් ඉපයුම් | 3500 | 2000 |
| වෙළඳ ගෙවිය යුතු | 2000 | 3000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 200 | 300 |
| | 23300 | 22300 |

සියලු විකුණුම් හා ගැනුම් ණය පදනම මත සිදුවේ.

- ඉඩම් කොටස විකුණා ඇත්තේ අත්පිට මුදලටය.
- යන්ත්‍ර අත්පිට මුදලට ලබාගෙන ඇත.
- වසර තුළ අතුරු ලාභාංශ ගෙවා ඇත.

පිළිතුර- සෘජු ක්‍රමය

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබීම් | | 8500 |
| සැපයුම් කරුවන්ට ගෙවීම් | | (4800) |
| මෙහෙයුම් වියදම් | | (1500) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | | 2200 |
| ගෙවූ බදු | | (600) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | | 1600 |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| ඉඩම් විකිණීම | 2500 | |
| යන්ත්‍ර ගැනුම් | (3000) | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | (500) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| සාමාන්‍ය කොටස් නිකුත් කිරීම | 600 | |
| ලාභාංශ ගෙවීම | (500) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් | | 100 |
| මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ වෙනස | | 1200 |
| 2020.04.01 මුදල් හා මුදල් සමාන දෑ | | 800 |
| 2021.03.31 මුදල් හා මුදල් සමාන දෑ | | 2000 |

**වක්‍ර ක්‍රමය - පිළිතුර (මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම පමණක් වෙනස් වන බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් පමණක් මෙහිදී ඉදිරිපත් කෙරේ)**

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| බදු පෙර ලාභය | | 2500 |
| ඉඩම් විකුණුම් ලාභය | (500) | |
| ක්ෂයවීම් | 1000 | 500 |
| | | 3000 |
| තොගය වැඩිවීම | (300) | |
| වෙළඳ ලැබිය යුතු අඩුවීම | 500 | |
| වෙළඳ ගෙවිය යුතු අඩුවීම | (1000) | (800) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | | 2200 |
| ගෙවූ බදු | | (600) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | | 1600 |

- **පෙරවැඩ යටතේ ණයගැති පාලන, ණයහිමි පාලන හා ආදායම් බදු ගිණුම් සැකසීම මගින් ණයගැති ලැබීම්, ණයහිමි ගෙවීම් හා ආදායම් බදු ගෙවීම් සොයාගත හැක.**



පී.එල්.විරාජ් සාගර
ගිණුම්කරණ විෂයභාර ආචාර්ය
මහින්ද රාජපක්ෂ විද්‍යාලය, හෝමාගම



# උසස් පෙළ පන්තියට පෙරවදනක්

ශ්‍රී ලංකාවේ පවත්වන්නා වූ ඉතාමත් තරගකාරීම විභාග දෙකක් වශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ.) විභාගය හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ.) විභාගය දක්වන්නට පුළුවන්. මේ අතුරිනුත් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වන කඩයිම තීරණය කරනු ලබන්නේ අ.පො.ස. උසස් පෙළ විභාගයේ දක්ෂතාවයන් මත වන බව ඔබ සැම දන්නා කරුණක්. මෙම තත්ත්වය උදෙසා සියලුම දුවා දරුවන් මෙන්ම ඔවුන්ගේ ආදරණීය දෙමාපියන් පවා මහන්සි වන බව නම් රහසක් නොවෙයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අනුව දළ වශයෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා ආසන්න වශයෙන් අයදුම්කරුවන් 350 000 පමණ මුහුණ දෙන අතර ඉන් සමත් වන ප්‍රතිශතය 71% කි. සරලවම කිවහොත් උසස් පෙළ සඳහා සුදුසුකම් ලබන්නේ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසු දරුවන්ගෙන් 71% ක් බව ඔබට පැහැදිලි වනවා ඇති. එසේම උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ දරුවන් අතුරින් විභාගය සමත් වී විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබාගන්නේද 71% ක් ආසන්න ප්‍රමාණයකි. ඒ අතුරිනුත් රාජ්‍ය විශ්ව විද්‍යාල වලට ඇතුළු වීමට සුදුසුකම් ලබන්නේ 30 000 කට ආසන්න දුවා දරුවන් පිරිසක් වන අතර ප්‍රතිශතයක් ලෙස එය 18 % කට ආසන්න වෙයි. මේ කරුණු මෙලෙස ඉදිරිපත් කරන්නේ ඔබට ඇති ගමන් මාර්ගය නිසි පරිදි පැහැදිලි කිරීමට විනා බය කිරීමට නොවන බව වටහා ගන්න.

සාමාන්‍ය පෙළ සමත් වී ඔබ උසස් පෙළ පන්තියට පිය නගන්නේ දැඩි බලාපොරොත්තු ගොන්නක් තුරුළු කරගෙනය. ඇතැම් දරුවන් A9, A8 ගනිමින් දැඩි ආත්ම විශ්වාසයකින්, ඉහළ තක්සේරුවකින් යුතුව උසස් පෙළ සඳහා පිය නගන අතර ඇතැම් දරුවන් අවම ප්‍රතිඵල සහිතව යම් ඉච්ඡාභංගත්වයකින් යුතුව උසස් පෙළ සඳහා යොමු වනවා අප දැක ඇත. සත්‍ය ලෙසම ගතහොත් සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵලය, උසස් පෙළ විභාග ප්‍රතිඵලය සඳහා බල නොපාන අතර, උසස් පෙළ පන්තියට ඇතුළු වීමට සුදුසුකමක් බව නම් මතක තබා ගත යුතුය. එහෙමනම් අපිට වරදින්නේ කොතැනද යන්න කියන කාරණාව පොඩ්ඩක් අපි විමසා බලමු.

උසස් පෙළ විභාගය සඳහා ඔබ විසින් විෂය ධාරාවක් තෝරා ගත යුතු බව ඔබ සැම දන්නා කරුණක්. විද්‍යා, ගණිත, වාණිජ, කලා, තාක්ෂණය ආදී වශයෙන් ඔබට තෝරා ගත හැකි පුළුල් විෂය ක්ෂේත්‍ර කිහිපයකි. මෙම විෂය ක්ෂේත්‍ර තෝරා ගැනීමේදී සිදුකරන වැරදි මත දුවා දරුවන් උසස් පෙළ විභාගයේ ඉහළ ප්‍රතිඵල වලට නොයන බව තේරුම් ගත යුතුය.

බොහෝ විට ඔබ උසස් පෙළ විෂය ධාරාව තෝරා ගන්නේ සාමාන්‍ය පෙළ විභාගයේ A9, A8 යන විභාග ප්‍රතිඵලය මතය, එසේත් නැතිනම් පවුලේ / දෙමාපියන්ගේ බල කිරීමටය, නැතිනම් ඔබේ යහළුවන් එකී විෂය ධාරාව තෝරා ගත් නිසාය, එසේත් නැතිනම් උසස් පෙළ සඳහා විෂයක් තෝරා ගත යුතු නිසාය. එසේත් නොමැතිව තර්කානුකූලව සිතා බලමින් විෂය ධාරාව තීරණය කරනු ලබන ශිෂ්‍යයන් අල්පය.

සත්‍ය ලෙසම සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵලයෙන් පසු ඔබ කල යුත්තේ ඔබ ගැනම ස්වයං අධ්‍යයනයක් කිරීමය. සරල ලෙසම ඔබගේ ශක්තීන් හා දුර්වලතා කාණ්ඩ ගත කිරීමය. ඒ හරහා ඔබට ඔබවම හඳුනාගත හැකි වෙයි. උදාහරණ ලෙස,

- A9ක් ගත් ශිෂ්‍යයෙක් ස්වයං අධ්‍යයනයේදී තමා වඩාත් කැමති හා දක්ෂ කලා විෂය ධාරාවන් වලට බව හඳුනාගනී. එවැනි දරුවෙක් විද්‍යා / ගණිත විෂය ධාරා තෝරා ගැනීමට වඩා කලා විෂය ධාරාව තෝරා ගැනීම හරහා ඉහළ ප්‍රතිඵල ලැබිය හැකිය.

- A9 ක් A8 ක් ගත් ශිෂ්‍යයෙක් ස්වයං අධ්‍යයනයේදී තමා වඩාත් කැමති හා දක්ෂ කොටස් ලෙස තර්කනය හා ගණිත වැනි ක්ෂේත්‍රයක් නම් උසස් පෙළ විෂය ධාරාවට ගණිතය තෝරා ගැනීම ඉතාමත් ඵලදායක වනු ඇත.

●එසේම වාණිජ විෂය ඇතුළුව A4 ක් පමණක් ගත් ශිෂ්‍යයෙක් තමන්ගේ දැඩි කැමැත්ත හා ශක්‍යතාව මත වාණිජ විෂය ධාරාව තෝරා ගන්නේ නම් ඉන් ඉහළ ප්‍රතිඵල ලබා ගත හැකි වනු ඇත.

●A9 ක් ගත් ශිෂ්‍යයෙක් ස්වයං අධ්‍යයනයේදී තමා වඩාත් කැමති හා දක්ෂ ව්‍යාපාර අධ්‍යයනය ආදී විෂයන්ට නම් එවැනි දරුවෙක් වාණිජ විෂය ධාරාව තෝරා ගැනීමෙන් ඉහළ ප්‍රතිඵල ලැබිය හැකිය.

ඉහත දක්වා ඇත්තේ උදාහරණ සිද්ධි 4 ක් පමණක් බව මතක තබා ගන්න. ඔබ විසින් කළ යුත්තේ ඔබ කැමති හා දක්ෂ විෂය තෝරා ගැනීම බව මතක තබා ගන්න. කලින් කොටසෙහි ශක්තීන් (strengths) හා දුර්වලතා (weaknesses) හඳුනාගන්නට කීවේ ඒ නිසාය. ඒ හරහා සැබැවින්ම ඔබට, ඔබ කවුද යන වග විමර්ශනය කිරීමට හැකි වන අතර එය ඔබගේ අනාගතය තීරණය වීමෙහි ලා ද ධනාත්මකව බලපානු ඇත. ඒ අනුව ස්වයං අධ්‍යයනය හරහා ඔබ විසින් පවුලේ අය / සමාජය සතුටු කිරීමට හෝ ලෝක අපවාදයන්ගෙන් බේරීමට උසස් පෙළ විෂය ධාරාව තෝරා ගැනීම නොකල යුතු අතර කළ යුත්තේ තර්කානුකූලව, ප්‍රඥානුකූලව, තමා කැමති, තමා දක්ෂ, තමාට ගැලපෙන විෂය ධාරාව තෝරාගැනීමයි.

එසේම ඔබ විසින් මෙම තීරණ ගැනීමේදි ඔබේ අනාගත ඉලක්ක පිළිබඳ යම් සැලස්මක් ගොනු කර ගැනීමත්, විෂය ක්ෂේත්‍ර තෝරා ගැනීමට පිටිවහලක් වනවා ඇත. මන්දයත් ඔබ විසින් වෛද්‍යවරයෙක් වනවා නම් විද්‍යා විෂය ධාරාව ද, ඉංජිනේරුවරයකු වීමට නම් ගණිත විෂය ධාරාව ද, වරලත් ගණකාධිකාරීවරයෙක් වීමට වාණිජ විෂය ද, තෝරා ගත යුතු නිසාය. (එසේ වුවද සැබෑ දක්ෂයෙක් ට පසුකාලීනව විෂය ක්ෂේත්‍ර දෙකක් තුළ වුවද නිපුණ විය හැකි බවත් එවැනි පිරිස් සමාජය තුළ විරල බවත් මතක තබා ගන්න.)

මේ අනුව ආදරණීය දුවේ පුතේ ඔබ විසින් කළ යුත්තේ ඔබේ නිසි ඉලක්ක පිහිටුවා ගනිමින් එය යථාර්ථයක් බවට පත්කර ගතහැකි දක්ෂ හා කැමති විෂය ධාරාවක් හරහා ඉදිරියට යාමය. කිසිදු විෂය ධාරාවක් උසස් හෝ පහත් නොවන බවත්, එකී විෂය ධාරාව තුළ සමර්ථයෙක් වීම ඔබ අත පවතින බවත් අමතක නොකළ යුතුය. මේ දක්වා කතා කරන ලද කරුණු කාරණා ඔබට නිවැරදිව උසස් පෙළ විභාගය සඳහා විෂය ධාරාවක් තෝරා ගැනීමට ඉවහල් වනු ඇතැයි මම විශ්වාස කරනවා.

ආදරණීය දුවේ පුතේ, එසේ නම් උසස් පෙළ කඩයිම සඳහා සූදානම් වන ඔබ සියලු දෙනා ශක්තිමත්ව, ධෛර්යවන්තව, නොපසුබස්නා උත්සාහයෙන්, තමන්ගේ ඉලක්කය වෙනුවෙන් වැඩ කටයුතු නිසි ලෙස අද සිට කළමනාකරණය කරගෙන ඉදිරියට යන්න ශක්තිය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරනවා. ඔබ අද දරනා මහන්සියේ ප්‍රතිඵල නිසැක ලෙසම අනාගතයේ ඔබට නෙලා ගත හැකි වනවා නොඅනුමානයි.

යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං

වැපිරූ තරමට ඔබට අස්වැන්න නෙලාගත හැකිය.

ඔබට ජය !!





එච්. ජේ. ආර්. බුද්ධික
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්ව විද්‍යාලය

# ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන

# මූල්‍ය ආයතන පද්ධතිය

**මූල්‍ය ආයතන**

ආදරණීය දුවේ/පුතේ,

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය යටතේ ආවරණය කළ යුතු මාතෘකාවක් වන මුදල් සහ මූල්‍ය ආයතන යන්නෙහි අනු මාතෘකාවක් වන ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන මූල්‍ය ආයතන පද්ධතිය පිළිබඳව සැකෙවින් ඔබ වෙත ළඟා කරවීම මෙම ලිපියෙහි අරමුණ වේ.

මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ, මූල්‍ය උපකරණ, මූල්‍ය යටිතල පහසුකම් (ගෙවීම්, පියවීම් පද්ධති), ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන වලින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වේ. මෙම බැංකු පද්ධතිය තුළ ක්‍රියාත්මක වන බැංකු හා බැංකු නොවන සියලුම ආයතන මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ.

**1 බැංකු අංශය**

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු




**2 තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන**

- බලපත්‍රලාභී මුදල් සමාගම්
- සමුපකාර ග්‍රාමීය බැංකු
- සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති

**3 විශේෂිත මූල්‍ය ආයතන**

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවන්
- කොටස් තැරැව්කරුවන්
- ඒකක භාර/ ඒකක භාර කළමනාකරණ සමාගම්
- වෙළෙඳපොළ අතරමැදියන්
- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

**4 ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන**

- රක්ෂණ සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
- අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල්
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (2015 මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව)

එසේම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය අනුව මූල්‍ය ආයතන පහත සඳහන් ආකාරයට වර්ග කළ හැකිය.

**ශ්‍රී ලංකා මහා බැංකුවේ අධීක්ෂණය අනුව  මූල්‍යායතන වර්ගීකරණය**

1. **ශ්‍රී ලංකා මහා බැංකුව අධීක්ෂණය කරන ආයතන**

    a. මුදල් තැන්පතු භාර ගැනීමට අවසර ඇති ආයතන

    I. බලපත්‍රලාභී වාණිජ බැංකු
    ii. බලපත්‍රලාභී විශේෂිත බැංකු
    iii. බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

    b. වෙනත් ආයතන

    I. සේවක අර්ථසාධක අරමුදල
    ii. බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්
    iii. ලියාපදිංචි විශේෂිත කල්බදු සමාගම්

2. **ශ්‍රී ලංකා මහා බැංකුව අධීක්ෂණය නොකරන ආයතන**

    a. මුදල් තැන්පතු භාර ගැනීමට අවසර ඇති ආයතන

    I. සමුපකාර ග්‍රාමීය බැංකු
    ii. සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති

    b. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

    I. සේවක භාරකාර අරමුදල
    ii. අර්ථසාධක අරමුදල
    iii. රක්ෂණ සමාගම්

    c. වෙනත්  විශේෂිත මූල්‍ය ආයතන
    I. වණික් බැංකු
    ii. ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්
    iii. ඒකක භාර

**මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට දායක වන ආකාරය**

**ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka)**

ඉහත සඳහන් කළ සියලුම මූල්‍ය ආයතන රටක ආර්ථිකය සඳහා විශාල දායකත්වයක් දක්වන අතර එහිදී ව්‍යාපාර සඳහා ඇති සුවිශේෂී දායකත්වය ඉමහත්ය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියාකරන කේන්ද්‍රීය ආයතනය ශ්‍රී ලංකා මහා බැංකුවයි.(විස්තර සඳහා පිටු අංක 23 - 25 හි ශ්‍රී ලංකා මහා බැංකුව පිළිබඳ ලිපිය පරිශීලනය කරන්න)



**බලපත්‍රලාභී වාණිජ බැංකු (Licensed Commercial Banks)**

ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාම හා මුදල් මැවීමට හැකියාව ඇති මූල්‍ය ආයතන විශේෂයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් මණ්ඩලයේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇති අතර මේවායින් කිහිපයක් රාජ්‍ය අංශයට ද බහුතරයක් පෞද්ගලික අංශයට ද අයත් වේ.

නිදසුන් : රාජ්‍ය අංශයේ වාණිජ බැංකු - ලංකා බැංකුව, මහජන බැංකුව
පෞද්ගලික අංශයේ වාණිජ බැංකු - සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව

**බලපත්‍රලාභී විශේෂිත බැංකු (Licensed Specialized Banks)**

බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතන විශේෂයකි. මෙහි ඇති විශේෂත්වය නම් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට අවසර නො මැති වීමයි. එහෙත් ඉතිරි කිරීමේ ගිණුම් හා කාලීන තැන්පත් ගිණුම් වශයෙන් මහජනතාවගෙන් මුදල් තැන්පත් භාර ගැනීමට අවසර ඇත.

නිදසුන් : ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය

- කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාර ගැනීම
- විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම
- සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කිරීම
- කල්බදු පහසුකම් සැපයීම
- කළමනාකරණ උපදේශන සේවා සැපයීම

**බලපත්‍රලාභී මුදල් සමාගම් (Finance Companies)**

කාලීන තැන්පතු භාර ගැනීම හා එම මුදල් මත ණය දීම සහ ආයෝජනයට පහසුකම් සලසන, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති පොදු සමාගම් විශේෂයකි.

නිදසුන් : එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී., සිංහ පුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී., ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී., සිංගර් ෆිනෑන්ස් පී.එල්.සී.

බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යයන්

- කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
- දේපළ හා ඉඩම් වෙළෙඳාම් කිරීම
- කල්බදු මූල්‍යකරණය
- කෙටිකාලීන ණය සැපයීම
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
- කාලීන තැන්පතු භාර ගැනීම

## සමුපකාර ග්‍රාමීය බැංකු (Co-operative Rural Banks)

සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් කාලීන හා ස්ථාවර තැන්පත් ලබා ගැනීම සහ සිය සාමාජිකයින්ට ණය සැපයීම ප්‍රධාන කාර්යය කොටගත් ආයතනයකි. මෙය විවිධ සේවා සමුපකාර සමිතිවල බැංකු ව්‍යාපාරික අංශයයි.

නිදසුන් : මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ සමුපකාර ග්‍රාමීය බැංකුව

සමුපකාර ග්‍රාමීය බැංකුවල කාර්යයන්

- සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් තැන්පත් ලබා ගැනීම
- උකස් කටයුතු කිරීම
- ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වා ගැනීම
- සාමාජිකයින්ට කෘෂිකර්මය, නිෂ්පාදනය, කර්මාන්ත හා අලෙවි කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම
- සමුපකාර ජීවන ක්‍රමය ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම

සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය (සණස)

ඉතිරිකිරීම් දිරිමත් කිරීමත්, සාමාජිකයින්ට ණය සැපයීමත් අරමුණු කර ගෙන සාමාජිකයින්ගේ ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන, සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියාපදිංචි කළ යුතු ආයතන විශේෂයකි.

නිදසුන් : නෙළුම්කුළම සණස සමිතිය, අත්තනගල්ල සණස සමිතිය

සණස සමිති පහත කාර්යයන් ඉටු කරයි.

- සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම
- සමිතිය නියැලි ක්ෂේත්‍රයේ උපකරණ සහන මිලට අලෙවි කිරීම
  නිදසුන් : ධීවර සමුපකාර සමිති ධීවර ආම්පන්න අලෙවි කිරීම
- තැන්පත් භාර ගැනීම හා සාමාජිකයින්ට ණය සැපයීම

## විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (Special Leasing Companies)

කල්බදුකරණය සඳහා ම මහ බැංකුවේ ලියාපදිංචි වූ සමාගම් විශේෂයකි. ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත කරගත් මූල්‍ය ආයතන විශේෂයකි. අදාළ වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම මෙම ආයතනවල ප්‍රධාන ආදායම වේ.

නිදසුන් : ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්, එල්.ඕ.එල්.සී. මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්, එස්.එම්.බී. ලීසිං පී.එල්.සී., ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්

කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි

- විශාල වටිනාකමකින් යුත් වත්කම්, මුළු මුදල ම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම
- කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම
- යන්ත්‍ර යල්පැනීම නිසා සිදු වන පාඩු හා ප්‍රාග්ධන අලාභ මගහැරීම
- විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපැයීමේ හැකියාව

## ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers)

රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළයි. මෙම ප්‍රාථමික වෙළෙඳපොළට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ.

ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික කාර්යභාරය වන්නේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගී වීමත්, භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ද්විතියික වෙළෙඳපොළේ ගනුදෙනු කිරීමත් ය.
නිදසුන් : කැපිටල් එලායන්ස් සමාගම, සෙලින්කෝ ශ්‍රීරාම් සුරැකුම්පත් සමාගම, ලංකා බැංකුව, සම්පත් සුරැකුම්පත් සමාගම

**කොටස් තැරැව්කාර සමාගම් (Share Brokers)**

සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන තැරැව්කාර සමාගම් ලෙස හැඳින්වේ. කොටස් තැරැව්කරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු ය.

නිදසුන් : ආශා පීපල්ස් සුරැකුම්පත් සමාගම, ඒෂියා සුරැකුම්පත් (පෞද්ගලික) සමාගම, ජෝන් කීල්ස් කොටස් තැරැව්කාර (පෞද්ගලික) සමාගම, ජේ.බී. සෙකියුරිටීස් (පෞද්ගලික) සමාගම

කොටස් තැරැව්කාර සමාගම්වල කාර්යයන්

- ආයෝජකයින්ගේ ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම
- ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම
- කොටස් හා ණයකරවල ආයෝජනය සම්බන්ධ උපදෙස් ආයෝජකයින්ට සැපයීම
- කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම හා වෙළෙඳපොළ සමීක්ෂණ වාර්තා සැකසීම මගින් ආයෝජකයින්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම
- සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම
- සීමාසහිත පොදු සමාගම්වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහාය වීම

**ඒකක භාර/ඒකකභාර කළමනාකරණ සමාගම් (Unit Trust / Unit Trust Management Companies)**

ඒකක භාරයක් යනු ආයෝජකයින්ට ඒකක(Unit) විකිණීමෙන් රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කළඹක යොදවනු ලැබේ. එහි ප්‍රතිලාභ ඒකක භාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයින් අතරේ බෙදා හරිනු ලැබේ.

| | | |
|---|---|---|
| නිදසුන් : ඒකක භාරකරු | - | අරමුදල් කළමනාකරණ සමාගම |
| නාමල් ඒකක භාරය | - | නැෂනල් වත්කම් කළමනාකරණ සමාගම |
| සී බෑන්ක් ඒකක භාරය | - | ද යුනිට් ට්‍රස්ට් කළමනාකරණ (පෞද්.) සමාගම |
| සිලෝන් ඉතුරුම් අරමුදල | - | සිලෝන් වත්කම් කළමනාකරණ සමාගම |

ඒකක භාරවල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

- විවිධාංගීකරණය වූ ආයෝජනවල මුදල් යෙදවීම නිසා අවදානම අඩු වීම
- ආයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලබා ගත හැකි වීම

**වෙළෙඳපොළ අතරමැදියන් : : (Market Intermidieries)**

ප්‍රාරක්ෂකයන්, ආයෝජන කළමනාකරුවන් සහ ආන්තික සැපයුම්කරුවන් මෙයට ඇතුළත් වන අතර මූල්‍ය උපකරණ වෙළෙඳාම් කිරීමේ අතරමැදියන් ලෙස මොවුන් කටයුතු කරයි. මූල්‍ය උපකරණ විකුණා දීමේ සේවය සඳහා සේවා ගාස්තු, මිල දී ගන්නන්ගෙන් සහ විකුණන්නන්ගෙන් අයකර ගනී.

**ප්‍රාරක්ෂකයන් :(Underwriters)**

සමාගමක් මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී නියමිත කාලය තුළ සැලසුම් කළ අරමුදල් ප්‍රමාණය සපයා ගත නොහැකි වූ විට ආයෝජකයින් විසින් මිල දී නොගෙන ඉතිරි වූ සුරැකුම් මිල දී ගැනීම සඳහා ගිවිස ගන්නා ආයතනයි.

ආයෝජන කළමනාකරුවන් යනු මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී ඒ සඳහා විවිධ සේවා සපයන ආයතනයන්ය.
එම ආයතන සපයන සේවා නම්,

- නිකුතුව පිළිබඳ ආයෝජන ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම
- ආයෝජන ඉල්ලුම් පත්‍ර භාර ගැනීම
- ආයෝජකයින්ට සුරැකුම් බෙදා දීම
- නිකුතුව පිළිබඳ මුදල් කළමනාකරණය
- ප්‍රචාරක කටයුතු

ආන්තික සැපයුම්කරුවන් යනු වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළෙඳ ණය අය කිරීම සහ ණය මිල දී ගැනීම (factoring) කරනු ලබන ආයතනය. සාධ්‍යකරණ ආයතන ලෙස ද මේවා හඳුන්වයි.

### ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture Capital Companies)

නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන ආයතන විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිල දී ගැනීම වැනි කටයුතුවල දී අරමුදල් සපයයි.  මීට අමතර ව කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලය කිරීම ආදියෙහි ද යෙදේ.

නිදසුන් :    සෙන්ට්‍රල් ෆිනෑන්ස් වෙන්චර් ෆන්ඩ් ලිමිටඩ්
ලංකා වෙන්චර්ස් ලිමිටඩ්
එන්ඩීබී වෙන්චර් ඉන්වෙස්ට්මන්ට් (පෞද්.) සමාගම

### රක්ෂණ සමාගම් (Insurance Companies)

රක්ෂණ සමාගම්වල විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මගින්  ගොඩනැගෙන අරමුදල් මූල්‍ය වෙළෙඳපොළ ණය දීම හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයක නිරත වන ආයතන වේ.

නිදසුන් : සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, සීමාසහිත සෙලින්කෝ  රක්ෂණ සමාගම, සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම

### අර්ථසාධක හා විශ්‍රාම අරමුදල්

රාජ්‍ය කළමනාකාරිත්වයෙන්  හා පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් විශ්‍රාම අරමුදල් හා අර්ථසාධක අරමුදල් පවතී.

නිදසුන් :

- රාජ්‍ය කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල -
  මෙය ප්‍රතිපත්ති සම්පාදන,ආර්ථික කටයුතු, ළමා හා තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය කෙරේ.
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
  මෙම අරමුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබයි.
- සේවක අර්ථසාධක අරමුදල
  ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලතම විශ්‍රාම අරමුදල වන මෙය කම්කරු කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබයි. අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල් අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල් කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

උසස් පෙළ කඩයිම් විභාගය සාර්ථකව ජය ගැනීමට සුභාශිංසන



ඩබ්. ජී .අයි. දේවින්දි ප්‍රේමරත්න
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය.

# වෙළෙඳපොළ ක්‍රියාවලියට ආණ්ඩුවේ මැදිහත් වීම්

### හැඳින්වීම

නිදහස් වෙළෙඳපොළක් තුළ මිල සහ නිෂ්පාදනය තීරණය කිරීමට සැපයුම් සහ ඉල්ලුම් බලවේගයන්ට රජයන් ඉඩ සැලසෙන අතර පාරිභෝගිකයින්ගේ සහ නිෂ්පාදකයින්ගේ හැසිරීම් වලට බලපෑම් කිරීමට හෝ සීමාකිරීමට ඍජු (උදා. රෙගුලාසි) හෝ වක්‍රාකාර (උදා: සහනාධාර) රජයේ මැදිහත් වීමක් නොමැත. කෙසේ වෙතත්, ස්වේච්ඡානුගත පදනමක් මත සිදුවන මෙම නිදහස් හුවමාරුව තුළ සිදුවන සමතුලිත අගයන් ආර්ථික දෘෂ්ටි කෝණයෙන් කාර්යක්ෂම වුව ද, සමාජයීය හා දේශපාලනික දෘෂ්ටියෙන් බලන කල ඒවා ප්‍රශස්ත ඒවා නොවිය හැකියැයි විශ්වාසය මත, වෙළෙඳපොළ සමතුලිත අගයන් වෙනුවට පාලනය කරන ලද මිල ගණන් හඳුන්වා දීමේ ප්‍රතිපත්තිය විවිධ ආණ්ඩු විසින් අනුගමනය කරනු ලැබේ. මෙසේ, වෙළෙඳපොළ යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය නිෂ්ක්‍රීය කොට, නීති මගින් මිල නියමකිරීමේ කාර්යයට රජය අවතීර්ණවන අවස්ථා වර්තමානයේ බහුලව දක්නට ඇත. මෙම ක්‍රියාමාර්ග උපරිම හා අවම මිල ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වනු ලැබේ. මිල ප්‍රතිපත්ති මගින් කරනු ලබන මැදිහත්වීම් වලට අමතරව, රජය භාණ්ඩ හා සේවා මත බදු පැනවීම සහ සහනාධාර ලබාදීම මගින්ද වෙළෙඳපොළ සමතුලිත අගයන් කෙරෙහි බලපෑම් කරනු ලැබේ.

### 1. උපරිම මිල සීමා (Price Ceiling) නියම කිරීම

උපරිම මිල සීමාවක් පැනවීම යනු භාණ්ඩයක් හෝ සේවාවක් අලෙවිය සඳහා නෛතිකව අය කළහැකි උපරිම මිල තීරණය කරනු ලබන මිල පාලනයකි. උපරිම මිල ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ අරමුණ නම් යම් භාණ්ඩයක හෝ සේවාවක පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සහ හැකිතාක් දුරට පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට භාණ්ඩ හා සේවා ලබාදීමයි. සමතුලිත මිලට වඩා පහළ මිලක් උපරිම මිල සීමාව වශයෙන් නියම කරනු ලැබූ විට, වෙළෙඳපොළෙහි හටගන්නා අසමතුලිත තත්ත්වය අංක (01) රූප සටහනින් පෙන්නුම් කරයි.




1. රූප සටහන - සඵල උපරිම මිල සීමාවක් නියම කිරීම

උපරිම මිල සීමාවන් නියම කිරීමත් සමඟ වෙළෙඳපොළ තුළ පැන නගින භාණ්ඩ හිඟය සමනය කිරීමේ උපක්‍රමයක් වශයෙන් භාණ්ඩ ආනයනය කළ හැකිය. ඊට අමතරව, භාණ්ඩ අතිරික්තව පවතින කාලවකවානු තුළ රඳවාගත් භාණ්ඩ තොග වෙළෙඳපොළට මුදා හැරීමෙන් අධි ඉල්ලුම් තත්ත්ව පාලනය කළහැකි වේ.

ඵලදායි මිල සීමාවක් මඟින් පාරිභෝගික මිල අඩුකරන අතර එමඟින් නිෂ්පාදකයාගේ අතිරික්තය ද අඩුකරන නමුත් සමතුලිත මිලට වඩා අවම බැවින් සැපයුම පහත වැටීමෙන් අලෙවිය අඩු වී එයින් ලැබෙන ප්‍රතිලාභ පෙරට වඩා අවම වේ. එනම්, දිගුකාලයක් සඳහා උපරිම මිලක් පනවා ඇත්නම්, වැඩි පාරිභෝගිකයින් සංඛ්‍යාවක් සඳහා ලබාගත හැකි බව සහතික කිරීම සඳහා රජයකට භාණ්ඩ සලාක කිරීමට සිදුවිය හැකිය. මෙම අකාර්යක්ෂමතා පැහැදිලි කිරීම සඳහා අංක (02) රූපසටහන යොදාගත හැක.




2. රූප සටහන - උපරිම මිල ප්‍රතිපත්තිය නිසා සිදුවන ආර්ථික අකාර්යක්ෂමතා

තවද, මෙම මිල ප්‍රතිපත්තිය නිසා ඇති වන දිගුකාලීන භාණ්ඩ හිඟයන් කළුකඩ වෙළෙඳපොළක් ඇති වීමට හේතු සාධක වේ. උපරිම මිල යටතේ කළුකඩ වෙළෙඳපොළක් බිහි වන ආකාරය පහත අංක (03) රූප සටහනින් පෙන්නුම් කෙරේ.




3. රූප සටහන - උපරිම මිල ප්‍රතිපත්තිය නිසා කළු කඩ මිල පැන නැගීම



**2. අවම මිල සීමා (Price Floor) නියම කිරීම**

අවම මිල සීමාවක් පැනවීම යනු භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා නෛතිකව අය කළ හැකි අවම මිල තීරණය කෙරෙන මිල ප්‍රතිපත්තියකි. අවම මිල ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේදී රජයේ අරමුණ වනුයේ යම් භාණ්ඩයක හෝ සේවාවක නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම ය. තවද, අවම මිලක් ස්ථාපිත කිරීමෙන් රජයක් උත්සාහ කරන්නේ භාණ්ඩ හෝ සේවාවන් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ නිෂ්පාදකයින්ට නිෂ්පාදන කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට සහතික කර ගැනීමයි. ඒ අනුව, ශ්‍රම වෙළෙඳපොළ සඳහා ප්‍රකාශයට පත්කොට ඇති අවම වැටුප් අනුපාතිකයන් අවම මිල ප්‍රතිපත්තියට නිදසුනක් සපයයි.



4.රූප සටහන - සඵල අවම මිල සීමාවක් නියම කිරීම

අවම මිල ප්‍රතිපත්තියක් ඵලදායී වීමට නම් එය නිදහස් වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා වැඩි විය යුතුය. එසේ සමතුලිත මිලට වඩා ඉහළ මිලක් අවම මිල වශයෙන් නියම කරනු ලැබූ විට, නිතරගයෙන්ම එය අසමතුලිත මිලක් වන අතර, එම මිලේ දී අධි සැපයුමක් හෙවත් සැපයුම් අතිරික්තයක් හටගනී. මෙම තත්ත්වය පහත අංක (04) රූප සටහනින් පෙන්නුම් කෙරේ.

මෙවැනි අධි සැපයුම් තත්ත්වයකදී, රජයට මැදිහත් වී මෙම භාණ්ඩ අතිරික්තය මිලදී ගැනීමට හැකියාව ලැබෙන අතර භාණ්ඩ හිගයක් පවතින විට මෙම භාණ්ඩ තොග වෙළෙඳපොළට එකතු කළ හැකිය හැකිය. එසේත් නැතහොත්, මෙම භාණ්ඩ අතිරික්තය අපනයනය කරනු ලැබේ.




ජනනි කෞෂල්‍යා හේවගේ මිය
කථිකාචාර්ය
කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව




# ආර්ථිකයේ ජීවමය හදවත පිළිබඳ ඔබ දැනුවත්ද?

රටක ආර්ථිකයේ ජීවය එනම් සැබෑ මෙහෙයුම්කරු ලෙස සලකනුයේ මහ බැංකුවයි. රජයේ බැංකුකරු, බැංකුවල බැංකුකරු එසේත් නැතිනම් රටක මූල්‍ය පද්ධතියේ ප්‍රධානතම ආයතනය එයයි. ලොව පැරණිතම මහ බැංකුව ලෙස වාර්තාවන්නේ 1668 වර්ෂයේදී එනම් මීට වසර 353 ට පමණ පෙර ආරම්භ වූ ස්විඩනයේ රික්ස් බැංකුවයි. ඉන් පසුව ලොව පුරා විවිධ නම් වලින් ව්‍යාප්ත වන්නට විය. ශ්‍රී ලංකාව තුළ එය මහ බැංකුව ලෙස හැඳින්වූවද  විවිධ රටවල විවිධ නම් වලින් හඳුන්වයි. එනම් මැලේසියාවේ නෙගාරා බැංකුව, ඇමරිකාවේ සංඝීය සංචිත බැංකුව, ඉන්දියාවේ ඉන්දියානු සංචිත බැංකුව, සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරිය වැනි විවිධ නාමයන්ගෙනි.

ශ්‍රී ලංකාවේ මහ බැංකුව 1949 අංක 58 දරණ මුදල් නීති පනත මගින් 1950 අගෝස්තු 28 දින පිහිටවනු ලැබීය. ඇමරිකාවේ නිව්යෝක් නුවර ෆෙඩරල් සංචිත බැංකුවේ ආර්ථික විද්‍යාඥයෙකු වූ ජෝන් එක්ස්ටර් මහතා විසින් 1949 නොවැම්බර් 04 දින ශ්‍රී ලංකාවේ මහ බැංකුවක් පිහිටුවීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ වාර්තාව අනුව ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීය. මහ බැංකුව ආරම්භ කිරීමට පෙර විකල්ප ආයතනයක් ලෙස පැවතියේ ව්‍යවහාර මුදල් මණ්ඩලය වන අතර එහි කාර්යය වූයේ මුදල් නිකුත් කිරීම පමණි.

1950 සිට මේ දක්වා ප්‍රගමනයන් රැසක් සිදු වු අතර මහ බැංකු පරිපාලනය මහ බැංකු අධිපතිවරුන් කිහිපදෙනෙකු යටතේ සිදුවිය.

- 1950-1953 ජෝන් එක්ස්ටර් මහතා
- 1953-1954 දේශමාන්‍ය එන්. යූ. ජයවර්ධන මහතා
- 1954-1959 ශ්‍රීමත් ආතර් රණසිංහ මහතා
- 1959-1967 ඩී. ඩබ්ලිව්. රාජපතිරණ මහතා
- 1967-1971 ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා
- 1971-1979 එච්. ඊ. තෙන්නකෝන් මහතා
- 1979-1988 ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් මහතා
- 1988-1992 ආචාර්ය එච්. එන්. එස් කරුණාතිලක මහතා
- 1992-1995 එච්. බී. දිසානායක මහතා
- 1995-2004 දේශමාන්‍ය ඒ. එස්. ජයවර්ධන මහතා
- 2004-2006 දේශමාන්‍ය සුනිල් මෙන්ඩිස් මහතා
- 2006-2015 අජිත් නිවාඩ් කබ්රාල් මහතා
- 2015-2016 අර්ජුන මහේන්ද්‍රන් මහතා
- 2017-2019 ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා
- 2019-2021 දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා

මේ වන විට නැවතත් මහ බැංකු අධිපති ධූරය දරණුයේ අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසිනි.




**ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන අරමුණු ද්විත්වයක් පෙරදැරිව කටයුතු කරයි.**

2002 මුදල් නීති (සංශෝධන) පනතට අනුව ඵලදායි සම්පත් සංවර්ධනය, වැඩි දියුණු කිරීම හා දිරිමත් කිරීම උදෙසා මහ බැංකුව විසින් මීට පෙර පැවති ප්‍රධාන අරමුණු හතරක් වෙනුවට ප්‍රධාන අරමුණු දෙකක් පෙරදැරිව කටයුතු කරනු ලබයි.

- **ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම.**

මෙයින් මූලික ලෙසම අවධානයට ලක්කරනුයේ ආර්ථිකය උද්ධමන පීඩනයන්ගෙන් මිදී පැවතීම හෙවත් අඩු උද්ධමන වේගයක් කරා ලඟා වීමට මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීමයි.

- **මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පවත්වාගෙන යාම.**

අභ්‍යන්තර හා බාහිර කම්පන හමුවේ නොසැලී සිටිමින් ශක්තිමත් මූල්‍ය ආයතන පද්ධතියක් පැවතීම රටක ආර්ථිකයට සුභ ලකුණක් වන අතරම එමඟින් මූල්‍ය පද්ධතියේ සාර්ථකත්වය කියාපායි. එමඟින් බැංකු කටයුතු, ව්‍යවහාර මුදල් හා ගෙවුම් ශේෂ අර්බුද වලින් තොරව ආර්ථිකය ක්‍රියාත්මක වන අතර තැම්පතු හිමියන්ට මෙන්ම ආයෝජකයින්ටද හිතකර වාතාවරණයක් උදාකර මූල්‍ය අතරමැදිකරණයට සහ ඵලදායි වෙළඳපොල ක්‍රියාකාරිත්වයකට ඉඩ සලසයි.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගනිමින් රටේ සමස්ථ ආර්ථික හා මූල්‍ය පද්ධතිය කළමණාකරණය කිරීම සඳහා මහ බැංකුවේ කාර්යයන් පහත පරිදිය.

- **ප්‍රධාන කාර්යයන්,**

  - ආර්ථික හා මිල ස්ථායිතාව.
  - මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය.
  - අතරමැදි කාර්යයන්.
  - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා කළමණාකරණය කිරීම.

- **නියෝජ්‍යායතන කාර්යයන්,**

  - රාජ්‍ය ණය කළමණාකරණය.
  - විදේශ විනිමය පාලනය.
  - සේවක අර්ථසාධක අරමුදල කළමණාකරණය හා පරිපාලනය.
  - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් හා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳව මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

ඉහත කාර්යයන්ට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ බැංකුකරුවා ලෙසත් බැංකුවල බැංකුකරුවා ලෙසත් විශේෂ කාර්යයක් ඉටු කරනු ලබයි.

රජයේ බැංකුකරුවා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්

- රජයේ ගිණුම් පවත්වාගෙන යාම.
- රජයට ණය සැපයීම්
- රාජ්‍ය ණය කළමණාකරණය.
- රාජ්‍ය මූල්‍ය උපදේශකයා ලෙස කටයුතු කිරීම.
- රජයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීම.

බැංකුවල බැංකුකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්

- වාණිජ බැංකු නමින් ගිණුම් පවත්වාගෙන යාම.

මහ බැංකුව තුළ වාණිජ බැංකු නමින් ජංගම ගිණුමක් පවත්වා ගනිමින් බැංකු අතර ගෙවීම් හා පියවීම් කටයුතු සඳහා පහසුකම් සපයයි. ඒ සඳහා 2003 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි තත්කාලීන දළ පියවීම් පද්ධතියක් (RTGS) පිහිටුවා ඇත.

- අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කිරීම

වාණිජ බැංකු වල ද්‍රවශීලතා ගැටළු වළක්වාගෙන මූල්‍ය ක්‍රමයේ ස්ථාවරභාවය තුළින් ජනතා විශ්වාසය තහවුරු කිරීම සඳහා මහ බැංකුව වාණිජ බැංකු වලට අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කරයි.

- වාණිජ බැංකු වල නිෂ්කාශණ ආයතනය ලෙස කටයුතු කිරීම.

චෙක්පත්, බැංකු අණකර හා අරමුදල් ප්‍රේෂණ වැනි සාමාන්‍ය ගෙවීම් නිෂ්කාශණය සඳහා පහසුකම් සැපයීමට අමතරව චෙක්පත් ඉක්මනින් නිෂ්කාශණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකා ක්ලියර් පුද්ගලික සමාගම හා ඒකාබද්ධ ඡායාගත පිළිබිඹු ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබයි.

වර්තමානය වන විට මහ බැංකුව මුදල් ආමාත්‍යංශය සමග ඉතා කිට්ටුවෙන් කටයුතු කරන අතර මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගනු ලබන්නේ මුදල් මණ්ඩලය මඟිනි. එහි සාමාජිකයන් පස් දෙනෙකු සිටින අතර එනම් මහ බැංකුවේ අධිපතිතුමා, මුදල් ආමාත්‍යංශයේ ලේකම් හා විධායක නොවන සාමාජිකයින් තිදෙනෙකු ලෙසයි. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ ශාඛා ත්‍රිත්වයක් මාතලේ,මාතර හා අනුරාධපුරය යන නගරවල පිහිටා ඇති අතර එමඟින් සමස්ථ ආර්ථිකයේ තීරණ වඩාත් කාර්යක්ෂම කිරීම අපේක්ෂා කරයි. මෙලෙස ආර්ථිකයේ ක්‍රියාකරු නැතිනම් ආර්ථිකයේ ජීවමය හදවත 2020 වර්ෂයේදී සිය 70 වෙනි ජන්ම දිනය සැමරුවේ මහත් ආඩම්බරයෙනි.




කේ.ජී. කාංචනා සමරවීර
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# මොකක්ද මේ වෙළෙඳපොළ ඒකාධිකාරය කියන්නේ?

- ඒකාධිකාරය අකාර්යක්ෂම වෙළෙඳපොලකි. ඒ මන්ද?
- ඒකාධිකාරී ආයතනයක් සම්බන්ධව සැපයුම් වක්‍රයක් නිශ්චිතව දැක්විය නොහැකි මන්ද ?
- ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසේදී පමණක් භාණ්ඩ සැපයුම් නොකරන්නේ මන්ද?
- ඒකාධිකාරී ආයතනයක් යනු මිල තීරකයකි. ඒ මන්ද ?
- ඒකාධිකාරී තත්ත්වයකදී පාරිභෝගිකයා යම්කිසි අසාධාරණයකට ලක් වේ. ඒ මන්ද?

වෙළෙඳපොල ඒකාධිකාරී තත්ත්වයක් ගොඩ නගා ගැනීම අප සිතන තරම් පහසු කාර්යයක් නොවන බව නොරහසකි. මන්ද යත් එම වෙළඳපොල තුළ රැදී සිටිම තබා වෙළඳපොල තුළට පිවිසීමට ද බාධා එල්ල වේ. එනම් බාධාකාරී පිවිසුමක් හා පිටවීමක් දැකිය හැකි අතර සමස්ත වෙළඳපොලම එක් ආයතනයකින් පමණක් සමන්විත වේ.

වෙළෙඳපොලේ සිටින ආයතන දෙකක් හෝ ඊට වැඩි ගණනක් සපයන මිල ගණන් වලට වඩා අඩු මිලකට වැඩි ගුණාත්මක බවින් යුක්තව සමස්ත වෙළඳපොලටම භාණ්ඩ සැපයීමට හැකි නම් එවිට ඒකාධිකාරයක් ගොඩ නැගේ. නමුත් එලෙස වෙළඳපොල මිලට වඩා අඩු මිලකට භාණ්ඩ සැපයීමට කිසිදු ආයතනයකට හැකියාවක් නොමැතිය. එනම් දිගු කාලීනව වෙළඳපොලේ රැදී සිටි ආයතනය අත් පත් කරගෙන සිටින පිරිමැසුම් අලුතින් වෙළඳපොලට ඇතුල් වන ආයතනයන්ට ලබා ගත නොහැකි නිසාවෙන් ඔවුන්ගෙ පිරිවැය ඉහළ මට්ටමක පවතින අතර මිල ගණන් ඉහළ දමමින් පිරිවැය ආවරණය කර ගැනීමට ඔවුන් කටයුතු කරයි. එම නිසා ප්‍රායෝගිකව එලෙස වෙළඳපොලට පිවිසිමට තවත් ආයතනයකට අවස්ථාවක් නොමැත. රජය විසින් පනවන ලද විවිධ නීති රීති නිසාවෙන් මෙන්ම ප්‍රධාන අමුද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම නිසාත් එලෙස වෙළඳපොලට ඇතුළු වීම බාධාකාරී වී ඇත.

භාණ්ඩය නිශ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය එක් ආයතනයක් විසින් හිමිකරගෙන සිටිනම් අනෙක් ආයතන වලට අමුද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කර වේ.

තවද වෙළඳපොලේ සිටින ආයතනය දිගු කාලයේ රැදී සිටින බැවින් සාමාන්‍ය පිරිවැය ඉතා අඩු වේ. එනම් පරිමාණානුකූල පිරිමැසුම් සහිතය. නමුත් අලුතින් එකතු වන ආයතන වලට එවැනි පිරිමැසුම් නොමැතිය. මෙම වෙලඳපොලේ රැදී සිටීමට අපහසු වීමට මෙයද හේතුවක් වේ.

වෙළඳපොල විසින් තිරණය කරන මිල එලෙසම බාර ගැනීම වෙනුවට සිය වෙළඳපොල ප්‍රතිශතය මුළුමනින්ම අහිමි නොවන අයුරින් වෙළඳපොල මිල තීරණය කිරිමේ බලය මොවුන් සතු වේ. නමුත් ඒකාධිකාරී ආයතනයකට වුවද තීරණය කළ හැකි වනුයේ මිල හෝ ප්‍රමාණය යන දෙකින් එකක් පමණි. ඒකාධිකාරීත්වයක් පවතින වෙළඳපොලක අලෙවි වන භාණ්ඩ සඳහා කිට්ටු හෝ වෙනත් ආදේශන නොමැති බැවින් එම නිශ්පාදිතය ලබා ගත හැක්කේ එකම නිශ්පාදකයකුගෙන් පමණි.

එබැවින් පාරිභෝගිකයන්ට තේරීමේ අවකාශයක් නොමැති බැවින් එම භාණ්ඩය මිලට ගැනීමට හෝ භාණ්ඩය නොමැතිව සිටීමට සිදු වේ. එලෙසම තමන් අලෙවිකරන භාණ්ඩ සඳහා ආදේශන නොමැති බැවින් අලෙවිකිරීමට ප්‍රචාරණයන් සිදු නොකරයි. තොරතුරු දැනුම් දීමට පමණක් ප්‍රචාරණයන් සිදු කරයි.

තවද ඒකාධිකාරී වෙළඳපොලක තොරතුරු එනම් භාණ්ඩයේ මිල, භාණ්ඩයේ සැපයුම, නිශ්පාදන ක්‍රියාවලිය

යනාදී තොරතුරු පිරිවැයකින් තොරව ලබාගත නොහැකිය. නිදසුන් ලෙස විදුලිය බෙදාහැරීම සම්බන්ධ කටයුතු, සිගරට් නිශ්පාදන කටයුතු ආදී තොරතුරු අනාවරණය නොකරයි.
ඒකාධිකාරී වෙළඳපොලක පිවිසුම හා පිටවීමට බාධා පවතින නිසාවෙන් දිගු කාලයේදී මෙම ආයතන නිශ්ප්‍රාමාණික ලාභ හෝ අලාභ ලබයි. එනම්,ආර්ථික ලාභ හෝ අලාභ පමණක් ලබමින් නිශ්පාදන කටයුතු වල නිරත වේ.

වර්තමානයේ නිදසුන් වශයෙන් විමසූ විට අපේ රටේ ජල සැපයුම, තැපැල් සේවාව, දුම්රිය සේවාව, විදුලිය සම්පාදනය ආදිය නිදසුන් සපයයි. දුම්රිය ප්‍රවේශ පත්‍ර ගාස්තු ඉහළ නැංවීමට ඉල්ලීම් කල විට වුවද ඒ වෙනුවට දුම්රිය සේවා සපයන තවත් තරගකාරී ආයතන නොමැති බැවින් අදාළ මිලට එම ආයතනයෙන්ම සේවය ලබා ගැනීමට සිදු වේ.

වෙළඳපොල ඒකාධිකාරයක් ඇති වීම පාරිභෝගිකයන්ට අසාධාරණ බැවින් පෞද්ගලික අංශයේ ඒකාධිකාරයක් ඇති වීම වැළැක්වීම සඳහා රජය විසින් තරගකාරී ආයතන පිහිටුවනු ලබයි.

නිදසුන් ලෙස පෞද්ගලික අංශයේ බස් රථ හිමියන්ට සාපේක්ෂව අඩු ප්‍රමාණයකින් වුවද රාජ්‍ය අංශයේ බස් රථ ද ධාවනය කිරීමට කටයුතු කරයි. එලෙස කටයුතු කළ විට ඒකාධිකාරී තත්ත්වයක් ඇති වීම වැළැක්විය හැකිය.

**ඒකාධිකාරය අකාර්යක්ෂම වෙළඳපොලකි. ඒ මන්ද?**

●ඒකාධිකාරයදී ආයතනයේ ඉල්ලුම් වක්‍රය සහ කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය යන දෙකම එකකි. එම නිසා මෙය අකාර්යක්ෂම වෙළඳපොලක් ලෙස හඳුන්වයි. තවද ආයතනයක් සමතුලිතතාවයට පත් වනුයේ ආන්තික ආදායම (MR) ආන්තික පිරිවැයට (MC) සමාන වූ විටදී වන අතර මෙම වෙළඳපොල තත්ත්වයේ දී භාණ්ඩයේ මිල (P) ආන්තික පිරිවැයට (MC) වඩා විශාල බැවින් ද මෙය අකාර්යක්ෂම වෙළඳපොලක් වේ.

**ඒකාධිකාරී ආයතනයක් සම්බන්ධව සැපයුම් වක්‍රයක් නිශ්චිතව දැක්විය නොහැකි මන්ද ?**

● සැපයුම යනුවෙන් අදහස් කරන්නේ මිල ගණන් සහ සැපයුම් ප්‍රමාණය අතර ඇති සැලසුම් සහගත තත්ත්වයක්. නමුත් ඒකාධිකාරී ආයතනයක මිල ගණන් සහ සැපයුම් ප්‍රමාණය අතර සැලසුම් සහගත තත්ත්වයක් නොමැති බැවින් ඒකාධිකාරී ආයතනයකට සැපයුම් වක්‍රයක් නොමැතිය.

**ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසේදී පමණක් භාණ්ඩ සැපයුම් නොකරන්නේ මන්ද?**

●ඒකාධිකාරී ආයතනයක් සමතුලිතයට පත් වන්නේ සිය ලාභය උපරිම වන හෝ අලාභය අවම වන නිමැවුම් මට්ටමේදිය. ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසේදී ආන්තික ආදායම් වක්‍රයක් දැකිය නොහැකි බැවින් ඒකාධිකාරිකරු සමතුලිතයට පත්වන්නේ ඉල්ලුම් වක්‍රයේ නම්‍ය කොටසේ දීය. ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසේදී ආන්තික ආදායම ඍණ අගයක් ගන්නා බැවින් ආන්තික ආදායම් වක්‍රයක් දැකිය හැකි නොවේ. එබැවින් ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසේදී ඒකාධිකාරී ආයතනයක් භාණ්ඩ සැපයුම් නොකරයි.

**ඒකාධිකාරී ආයතනයක් යනු මිල තීරකයකි. ඒ මන්ද ?**

●ඒකාධිකාරී ආයතනයක් යනු වෙළඳපොලේ තීරණය වී ඇති මිල එලෙසම බාර ගන්නවා වෙනුවට වෙළඳපොල මිල කෙරෙහි බලපෑමක් කල හැකි ආයතන වන අතර එය "මිල තීරකයෙක්" යනුවෙන් සඳහන් වේ. තම භාණ්ඩය සඳහා කිට්ටු හෝ ආදේශක නොමැති නිසාවෙන් වෙළඳපොල මිල තීරණය කිරීම සඳහා අවශ්‍ය බලය ඒකාධිකාරී ආයතනයක් සතු වේ.

**ඒකාධිකාරී තත්ත්වයක්දී පාරිභෝගිකයා යම්කිසි අසාධාරණයකට ලක් වේ. ඒ මන්ද?**

● අභිප්‍රේරණය හෙවත් සානුබල මදිකම හේතුවෙන් සහ තරගකාරීත්වය අඩුකම නිසාවෙන් පවතින සම්පත් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට ඇතැම් ආයතන යොමු වී ඇත. එමෙන්ම ඒකකයක පිරිවැයට වඩා වැඩි මිලක් ගෙවීමට ද පාරිභෝගිකයන්ට සිදු වී ඇත. තරගකාරී ස්වභාවයක් නොතිබීම නිසා ගුණාත්මකබව වැඩි කිරීමට කිසිදු පෙළඹවීමක් නොමැති වීම හා ශුභ සාධනය උපරිම නොවීම ආදී හේතු නිසා මෙහිදී පාරිභෝගිකයා යම් අසාධාරණයකට ලක්වන බව කිව හැකිය.



ඩබ්.ඒ.ඩී.එනුෂි කවින්‍යා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# හෙට දවස වෙනුවෙන් පරිභෝජනය කැප කිරීමට ඔබත් සූදානම්ද?



ලොව පසුගිය දශක හතරකට ආසන්න කාලය තුළ දියත් කළ අවිධිමත් හා අස්ථිර සංවර්ධනයේ අනිසි ප්‍රතිඵල අද මිනිස් වර්ගයා ඇතුළු සියලුම ජීවීන් භුක්තිවිඳිමින් සිටිති. මෙම සංවර්ධනයේ අනිසි ප්‍රතිඵල වල බලපෑමේ ප්‍රබලත්වය නිසාම ඒ පිළිබඳ ගෝලීයතලයේ පවතින සංවේදීතාවය තිරසාර සංවර්ධන ප්‍රයත්නයන්හි දැඩි අවශ්‍යතාවය අවධාරණය කරයි. වර්තමානයේ මේ පිළිබඳ අවධානය දැඩිව ලක්වුවද මෙහි ආරම්භය කාර්මික පුනරුදය දක්වා දිව යයි.

**තිරසාර සංවර්ධනයේ සංකල්පීය පරිණාමය**

කාර්මික පුනරුදය නමින් කිරුළු පැළඳි, ඉහළ ආර්ථික හා සමාජීය දියුණුවක් සහිත රටක් 'සංවර්ධිත' යනුවෙන් අර්ථ දැක්වීමට බටහිර ආර්ථික විශ්ලේෂකයෝ යුහුසුළු වූහ. සැබෑ සංවර්ධනය මෙයැයි නිර්ණය වූ පසුබිමක මානව වර්ගයාගේ සඳ තරණය සමග නව නිර්මාණ කරළියට පිවිසෙද්දී තත්වය තරඟකාරී බවක් දක්වා වර්ධනය විය. මේ හරහා අප වටා පරිසරයට, සමාජයට එල්ල වූ තර්ජනය වෙත දෑස් විවර කර වරක් හැරී බලන්නට මිනිස් සංහතියට ක්‍රමයෙන් අමතක වන්නට විය.



මෙහි දී පාරිසරික චින්තනය පසෙක තබා සංවර්ධිත රටවල් කාර්මීකරණය තුළ ඇතිකළ විපත් කතිකාවට පැමිණීමත් සමග සංරක්ෂණවාදීන් ''සංවර්ධනය'' පරිසරයේ සතුරෙකු ලෙස සිතීමට තරම් අන්තගාමී තත්ත්වයකට ඔවුන්ගේ චින්තනය සකස් විය. මීට විසඳුමක් ලෙස චිරාත් කාලයක් තුළ එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෙසට ඇදීගිය ධාරාවන් කිහිපයක් එක් පොදු දිශාවකට යොමු කරමින් මානව සංවර්ධනයත්, භෞතික සංවර්ධනයත්, පරිසර සංරක්ෂකවාදීන්ගේ සංකල්පයන්ගේත් සාරය මුසු කොට ගත් විසඳුමක් කරා යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස තිරසර සංවර්ධනය නම් සංකල්පය බිහිවිය.

**ස්ටොක්හෝම් ප්‍රකාශනයේ වැදගත්කම**

තිරසර සංවර්ධනය පිළිබඳව වරින් වර කතිකාවට ලක් වුවද එය මුළු ලෝකයේ අවධානයට පාත්‍ර වන්නේ වර්ෂ 1972 දී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පැවති පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ මානව පරිසරය පිළිබඳ සමුළුවේදී ය. එම සමුළුවේදී එළිදැක්වූ ස්ටොක්හෝම් ප්‍රකාශය, වගන්ති 26කින් සමන්විත විය. මෙහි ඇති පළමු වගන්තිය මගින් අනාගත පරපුර වෙනුවෙන් පරිසරය රැක ගැනීම පිළිබඳ අදහස දක්වා ඇත.

ස්ටොක්හෝම් ප්‍රකාශය පදනම් කරගනිමින් පසුව වර්ෂ 1983 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එවකට නෝර්වේ අගමැතිනිය වූ හාලම් බෲන්ඩ්ලන්ඩ් මැතිණියගේ ප්‍රධානත්වයෙන් පරිසරය හා සංවර්ධනය සඳහා වූ කොමිෂන් සභාවක් පිහිටුවා වර්ෂ 1987 දී ''අපගේ පොදු අනාගතය'' (Our Common Future) නමින් තිරසාර සංවර්ධනය යන්න වඩාත් හොඳින් නිර්වචනය කළේය. ඉන්පසුව වර්ෂ 1992 දී බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝ නුවර පැවැත්වූ ලෝක මිහිතල සමුළුවේ (Earth Summit) දී තිරසාර සංවර්ධනයේ අවශ්‍යතාවය අවධාරණය කරමින් ඒ සඳහා ආර්ථික, සමාජ හා පාරිසරික අංශ අතර සමබරතාව ආරක්ෂා වන පරිදි සංවර්ධන ක්‍රියාවලිය සිදුවිය යුතු බවට පෙන්වාදෙන ලදී.

**21 වන සියවස වෙනුවෙන් න්‍යාය පත්‍රය.**

ලෝක බලවතුන් විසින් පරිසරය හා ආර්ථික අතර සම්බන්ධතාවය හානිකරන සියලු ප්‍රධාන අංශයන් පිළිබඳ ක්‍රියාකිරීමට සැලැස්මක් ගොඩනංවන ලද අතර එය 21 වන සියවස සඳහා න්‍යාය පත්‍රය ලෙස හැඳින්වේ. තවද, ලෝක පරිසරය සුරැකීම සඳහා සාමූහිකව කටයුතු කිරීමට හා තම රටවල සංවර්ධිත ප්‍රතිපත්ති සැකසීමේදී ක්‍රියාත්මක කිරීමේදීත් කාලගුණ විපර්යාස, ජීවවිද්‍යාත්මක වෙනස්වීම් හා වන සංරක්ෂණය පිළිබඳ ගිවිසුම් බිහිකිරීම අරමුණු ලෙස හඳුනාගත හැකිය.

මෙහිදී වර්ෂ 2015න් ඇරඹුණු වසර 15 සඳහා වූ සංවර්ධන න්‍යාය පත්‍රය (Transforming Our World : 2030 Agenda for Sustainable Development) නමින් වර්ෂ 2015 සැප්තැම්බර් මස 5 වන දින සම්මත කරගනු ලැබීය. පරමාර්ථ 17 කින් සහ ඉලක්ක 169 කින් යුතු එකී සංවර්ධන න්‍යායපත්‍රය මිහිමත දිළිඳුකම හා කුසගින්න තුරන් කිරීම, ලෝකවාසීන්ගේ සෞඛ්‍ය හා අධ්‍යාපන තත්ත්වයන් නගා සිටුවීම, ඔවුන් අතර සමානාත්මතාව තහවුරු කිරීම හා දේශගුණික විපර්යාස හමුවේ ලෝකවාසීන් මුහුණ පා ඇති අභියෝග ජය ගැනීම යනාදී වටිනාකම් රැසක් ප්‍රමුඛ කොටගෙන ඇත. එමගින් එතෙක් මනුෂ්‍ය වර්ගයා පමණක් නොව සතා සිව්පාවෝ, ගහකොළ, ඇළ දොළ, ගංගා, සමුදුරු, කෙත්වතු, වැව් අමුණු ඇතුලු ස්වභාවික හා මිනිසා තැනූ සම්පත් සියල්ලේ ම පැවැත්ම දෙවෙනිකොට කළ කී දෑ පසෙකලා සංවර්ධන ක්‍රියාදාමයට බොහෝ වටිනාකම් එකතු කිරීමේ වගකීම සාමාජික රටවල් වෙත පවරමින් ලෝකය වඩාත් හොඳ අතට පරිවර්තනය කළ හැකි ගමන්මගක ඇරඹුම සනිටුහන් කර තිබේ. බොහෝ කලක් සංවර්ධනය වෙමින් පැවති, වසර 2010 දී පහළ මධ්‍යම පන්තියේ ආදායම් උපයන රටක් ලෙස කාණ්ඩ ගත කෙරුණු ශ්‍රී ලංකාව එකී වගකීම ඉටු කිරීමට, එසේත් නැත්නම් වසර 2030 වනවිට වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් තනන්නට සමත් විය යුතුව තිබේ.

**තිරසර යුගයක දොරටවැඩුම**

"තිරසර යුගයක" ඇරඹුම අප නිල වශයෙන් සනිටුහන් කරන්නේ වර්ෂ 2017 ජනවාරි මස තෙවන දින ය. ශ්‍රී ලංකාව තිරසර යුගයක් වෙත රැගෙන යාමේ වගකීම දැරීම සඳහා උපදේශක මණ්ඩලයක් ද, තිරසර සංවර්ධනය උදෙසා වෙනම අමාත්‍යාංශයක් ද ස්ථාපනය වේ. එසේ වුවද ශාස්ත්‍රීය හා ප්‍රතිපත්තිමය ක්ෂේත්‍ර තුළ තිරසර සංවර්ධනය පිළිබඳ ඉඳහිට නැගෙන කථිකාවන් හැරුණුකොට වසර 2030 වනවිට අපේක්ෂිත ඵල නෙළන්නට තරම් දැඩි උනන්දුවකින් හෝ කැපවීමකින් කටයුතු සිදුවේද යන්න අවිනිශ්චිත ය.

දිළිඳුකම තුරන්කිරීම තිරසර සංවර්ධනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. ඊට සමගාමීව 2017 වසර "දිළිඳුකම තුරන් කිරීමේ වසර" ලෙස නම්කෙරිණි. දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් අනේක විධ වැඩසටහන් දියත් කළ අප වසර 2006 දී පැවති දරිද්‍රතා මට්ටම 15.2% වසර 2012/13 වන විට ඉන් අඩකටත් වඩා අඩු අගයකට පහත හෙළන්නට (6.7% තෙක් අඩු කිරීමට) සමත්ව ඇති බව ගෘහස්ථ ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණ වාර්තාව-2012/13 මගින් හෙළිදරව් වේ. එනයින් බැලූ කළ දිළිඳුකම තුරන් කිරීම සඳහා අප යා යුතුව ඇත්තේ කෙටි දුරකි. නමුත් 2012/13 සඳහා වාර්තා වන ජාතික තලයේ අඩු දරිද්‍රතා මට්ටම 6.7% නිර්ණය වන්නේ ජන ජීවිතය අති දුෂ්කර වූ

වතු හා ග්‍රාමීය අංශවල පවතින ඉහළ දරිද්‍රතා අගයන් පිළිවෙලින් 10.9% හා 7.6% නාගරික අංශයේ පවතින අඩු දරිද්‍රතා අගය 2.1% සමඟ පොදුකරණයට ලක්වීමෙන් බව අමතක නොකළ යුතුය.
ජාතික තලයේ අනෙකුත් සංඛ්‍යාත සම්බන්ධයෙන් තත්ත්වය ද එලෙසම වේ. එබැවින් ජාතික තලයේ සංඛ්‍යාත අනුව අප අනෙකුත් ජාතීන් අතර කවර තරාතිරමක් උසුලනු ලැබුව ද තිරසර සංවර්ධන පරමාර්ථ වෙත ළඟා වීම සඳහා රට තුළ පවතින ව්‍යුහාත්මක අසමානතා ජනනය වීමට පාදක වී ඇති තත්ත්වයන් මැනවින් අවබෝධ කරගැනීමටත් යෝග්‍ය ක්‍රමෝපායන් ඔස්සේ ඊට ආමන්ත්‍රණය කිරීමටත් වග බලා ගත යුතු ය.

## ඉලක්ක පියගැටපෙළ

2030 වසර වනවිට තිරසාර සංවර්ධනයේ ඉලක්ක සපුරාගත යුතුය. එය මුළු ලෝකයේම අනාගත පරපුර වෙනුවෙන් ගන්නා ප්‍රායෝගික ක්‍රියාදාමයකි. රටක් වශයෙන් ශ්‍රී ලංකාව ගත්කල වර්තමාන රජයේ අරමුණු හා ප්‍රතිපත්තිවලට තිරසාර සංවර්ධනයේ ඇති සුවිශේෂ ගුණාංග ඇතුළත් කොට ඇත.

තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වූ දැක්මට 2020 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා යොදා ගත්තේ 2025 දැක්ම වේ. ඒ අනුව 2025 වන විට ශ්‍රී ලංකාව දැනුම පදනම් කරගත් උසස් තරඟකාරී සමාජය එය අලෙවි ආර්ථිකයක් බවට පරිණාමය වෙමින් ඉන්දියානු සාගරයේ කේන්ද්‍රීය පොහොසත් රටක් බවට පත්විය යුතුය. 2025 දැක්ම අනුව වාර්ෂික ඒක පුද්ගල දළ ජාතික ආදායම එ.ජා.ඩොලර් 5000 දක්වා ඉහළ නැංවීමත්, රැකියා දසලක්ෂයක් බිහි කිරීමටත්, වර්ෂයක සෘජු විදේශ ආයෝජන එ.ජ. ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමටත් වර්ෂයක අපනයන වටිනාකම දෙගුණ කර එ.ජා.ඩොලර් බිලියන 20 ක් දක්වා වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල දළ ජාතික ආදායම වැඩි කරගැනීමට හැකියාව ඇතත් Covid-19 වසංගතය හමුවේ අපනයන ආදායම දෙගුණ කිරීමට සෘජු ආයෝජන වැඩි කිරීම දුෂ්කර වී තිබෙන බව දැකිය හැක. තවද මෙම 2025 දැක්මෙහි ඉලක්ක පාරිසරික පැතිකඩයන්ට වඩා ආර්ථික හා සමාජයීය පැතිකඩයන් සමග ඒකාබද්ධ වී ඇති බව නිරීක්ෂණය කල හැකිය. 2019 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරන ලද සෞභාග්‍යය දැක්ම තුළ ද තිරසාර සංවර්ධනය සඳහා 2030 වර්ෂය සඳහා ගමන් කිරීමට ජාතික සැලැස්මක් පිළිබඳ වඩාත් හොඳ පැහැදිලි කිරීමක් අන්තර්ගතව ඇත.

## තිරය පිටුපස කතාව

2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් පරිදි ඵලදායිතාවයේ මන්දගාමී ප්‍රගමනය ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනයක් අත්කරගැනීම සඳහා ප්‍රධාන අභියෝගයකට ලක් ව පවතී. එම නිසා ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අවශ්‍ය වන අයුරින් ඵලදායිතාව වර්ධනයට ඇති බාධක ඉවත් කිරීම සඳහා සැලසුම් සහගත සහ තීරණාත්මක ප්‍රයත්න දැරීම රටට අත්‍යවශ්‍ය වේ. සැමට සමාන ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනයක් සහ ආර්ථික සංවර්ධනය තහවුරු කිරීමේ දී සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම ප්‍රමුඛස්ථානයක් ගනී.

තවද මේ සඳහා ''දැනුමින් පොහොසත් ශ්‍රම බලකාය'' යනු ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවට භාවිත කළ හැකි වැදගත් උත්තේජකයක් ය. එවැනි ශ්‍රම බලකායක් දැනට පවතින සම්පත් උපරිම ප්‍රයෝජනය ගැනීමටත් ඒවා අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීමට සහ නව තාක්ෂණය යොදා ගැනීමට කර්මාන්ත සතු හැකියාව ඉහළනංවා ආර්ථික නවෝත්පාදන ධාරිතාව වැඩි කිරීමට දායක වන අතර රැකියාවල ගුණාත්මකභාවයද ඉහළ නංවයි.

මේ සාකච්ඡාව තුළින් උත්සහ දරන ලද්දේ විටෙක අත්හල විටෙක අත්හැරෙන තිරසාර සංවර්ධනයේ ප්‍රයත්නයක අවශ්‍යතාවය අවධාරණය කිරීමටය. ශ්‍රී ලංකාව තුළ ද ඉහත පරිදි තිරසාර සංවර්ධනයේ බීජ රෝපණය වුවද ඒ සඳහා ශක්තිමත් පසක් තවම නිර්මාණය වී නැත. තවද ශ්‍රී ලංකාවේ වත්මන් ජනපති, තිරසාර සංවර්ධනය



වෙනුවෙන් ආසියා පැසිෆික් කලාපයේ සභාපතිවරයා බව සිහිපත් කල යුතුය. එවන් පසුබිමක අප මෙය වචනයට පමණක් සීමා නොකර ක්‍රියාවෙන් ඔප්පුකොට ලෝකයාටම ආදර්ශයක් විය යුතු නොවන්නේ ද?
මෙම සංකල්පය පිළිබඳ ලිඛිත මූලාශ්‍ර තිබුණ ද එය විධිමත් ලෙස ක්‍රියාත්මක නොවුවහොත් 2030 වර්ෂය වන විට අපට තිරසාර යුගයේ මල් ඵල දරනවා දැකිය නොහැක. මේ සඳහා රටේ ඉහළ රාජතාන්ත්‍රිකය විසින් ක්‍රියාත්මක කරන සියලු වැඩසටහන් ජනතාවට සන්නිවේදනය වියයුතු අතර ජනතාව විසින් ද සක්‍රීය දායකත්වය ලබාදිය යුතුය. වසවිසෙන් තොර කාබනික පොහොර භාවිතය, පිරිසිදු පානීය ජලය අනාගත පරපුර වෙනුවෙන් උරුම කරදීම, තුරුලතා රැකගැනීම ආදී තිරසාර සංවර්ධනයට පීවයක් එකතු කරන දෑ ජනතාව විසින් සිදුකළ යුතුය. එනම් තිරසර යුගයක ඇරඹුම ඵලදායි අවසානය වෙත එළඹෙනු දැකීම ශ්‍රී ලාංකිකයන්ගේ පරම අභිලාෂය විය යුතුයි.



එච්.ඩී එච්.සෙනුරි දුනුකේ
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# “A” සාමාර්ථ තුනකින් නොව “A” සාමාර්ථ හතරකින් උසස් පෙළ ජය ගනිමු !




උසස් පෙළ විභාගය කිවූ සැණින් ම වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළට පෙනී සිටින ඔබ සැමටම වගේ මතක් වන්නේ ව්‍යාපාර අධ්‍යනය, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය යන විෂයන්ය. ඔබ විෂයන් තුනකට රාමු වී උසස් පෙළ කඩඉම ජය ගැනීමට වෙහෙසන අතරතුර ඔබට ඉංග්‍රීසි විෂය මගහැරෙනවා එසේ නොමැති නම් ඔබ මගහරිනවා.

විශ්වවිද්‍යාල සිහිනය සැබෑ කර ගැනීමට වෙර දරන ඔබ සියලු දෙනාම z-score පසුපස හඹා යෑම නිසා උසස් පෙළ විෂය ධාරාවට අදාළ වන ඉංග්‍රීසි විෂය නොවැදගත් විෂයක් විදිහට සැලකීමට බහුතරයක් පෙළඹෙනවා.

**ඉංග්‍රීසි විෂය උසස් පෙළට ඇතුළත් වන්නේ ඇයි ?**

වර්තමානය වන විට මුළු මහත් ලෝකයම එක් විශ්ව ගම්මානයක් මෙන් සලකන අතර කිසිදු රටකට, පුද්ගලයෙකුට මෙම ගෝලීයකරණයෙන් ගැලවී තනි තනිව ජීවත් විය නොහැක. ඉතින් ශීඝ්‍රයෙන් ඉහළට යන, දියුණු වන ලෝකය සමග ගැටීමට ඔබට මුළු මහත් ලෝකයත් සමග ම සන්නිවේදනය කිරීමට සිදුවෙනවා. ඉංග්‍රීසි භාෂාව සියලුම රටවල වාගේ තම පළමු හෝ දෙවන භාෂාව ලෙස භාවිතා වෙනවා. ඉතින් මෙම නිසාම ඉංග්‍රීසි භාෂාව සන්නිවේදනය සඳහා යොදා ගන්නා පොදු භාෂාවක් ලෙස ජාත්‍යන්තරය විසින් පිළිගෙන තිබෙනවා.
උසස් පෙළ අවසන් වනවාත් සමගම ඔබ සියලුම දෙනා පාසල් විය අවසන් කොට උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල වෙත හෝ රැකියා සඳහා වාණිජ ලෝකයට පිවිසෙනවා. ඉතින් මෙම දෙපිරිසටම ඉංග්‍රීසි විෂය ඉතා වැදගත් නිසා උසස් පෙළ විභාගයට ඉංග්‍රීසි විෂය ඇතුළත් වෙනවා.

**අනාගත විශ්වවිද්‍යාල සිසුවෙකු විදිහට ඔබට ඉංග්‍රීසි භාෂාව වැදගත් වන්නේ ඇයි ?**

විශ්වවිද්‍යාලයට ඇතුලත් වීම අනාගත සුබසිද්ධිය වෙනුවෙන් ඔබ විසින් ළඟා කරගන්නා එක් වටිනා කඩඉමකි. විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ සැනින්ම ජීවිතය ජයගත්තා යැයි සිතීම අනුවණ ක්‍රියාවකි. තම අනාගතය ජය ගැනීමට විශ්ව විද්‍යාලය තුළ සිටිනා වසර හතර තුළ අධ්‍යාපන කටයුතු සහ අනෙකුත් බාහිර කටයුතු ඉතා හොඳින් ඉටුකර ගැනීම අනිවාර්ය කටයුත්තකි.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන දේශන තේරුම් ගැනීමට, සටහන් සකසා ගැනීමට, පැවරුම් සාර්ථකව ඉටු කිරීමට සහ විභාග වලට සාර්ථකව මුහුණදීමට ඉංග්‍රීසි අත්‍යවශ්‍යම අංගයක් වෙනවා. විශ්ව විද්‍යාලය යනු දැනුම් තෝතැන්නකි. පුස්තකාල පහසුකම්, අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක විද්‍යාගාර පහසුකම් වලින් පරිපූර්ණ වුණු, ඉගෙන ගැනීමට ප්‍රිය කරන ඔබට ඉතා වටිනා ස්ථානයකි. ඕනෑම විෂය කරුණකට අදාළ පොත් පත් ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල පුස්තකාල සතු වෙනවා. ඊට අමතරව අන්තර්ජාලය හරහා ඔබට ඕනෑම දෙයක් ඉගෙන ගැනීමට වරම් ලැබෙනවා. පොත්පත් සහ අන්තර්ජාලය ඉංග්‍රීසි භාෂාව ඇසුරින් නිර්මාණය වී ඇති නිසා මෙම වටිනා සම්පත් වලින් ප්‍රයෝජන ගැනීම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍යයි.
ඔබ සියලු දෙනාටම අනාගත විශ්වවිද්‍යාල ජීවිතය ඉතා පහසුවෙන් ජය ගැනීමට ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම ඉහත කරුණු වලින් තේරුම් ගනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

**අනාගතයේදී රැකියා සඳහා වාණිජ ලෝකයට පිවිසෙන ඔබට ඉංග්‍රීසි භාෂාව වැදගත් වන්නේ ඇයි ?**

රැකියාවක් සඳහා යොමු වෙනවත් සමඟම පළමු කඩඉම ලෙස රැකියා සම්මුඛ පරීක්ෂණය සමත් වීමට ඔබට සිදු වෙනවා. ඉතින් නූතන ලෝකයේ සියලුම ව්‍යාපාර ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීමට, ලිපිගොනු නඩත්තු කිරීමට ඇතුළු සියලුම ව්‍යාපාර කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාව යොදා ගන්නවා. ඉංග්‍රීසි පිළිබඳ දැනුමක් නොමැතිව ඔබට රැකියා සම්මුඛ පරීක්ෂණ සමත් වීම ඉතා අපහසු කරුණකි. කෙසේ හෝ සම්මුඛ පරීක්ෂණය සමත් වුවත් එම රැකියාව තුළ වැඩ කටයුතු සිදුකරගැනීමට ඉංග්‍රීසි අත්‍යවශ්‍ය වෙනවා. මීට අමතරව රැකියා ප්‍රවර්ධනය සඳහා ඉංග්‍රීසි භාෂාව මනා රුකුලක් වෙනවා.

**ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට සහ වැඩි දියුණු කර ගැනීමට කළ යුත්තේ මොනවාද?**

මෙම ලිපියේ ඉහත සඳහන් සියලු කරුණු මගින් ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම ඔබට වැටහෙනවා යයි සිතනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ රැකියාවක් අපේක්ෂා කරන ඔබ එම කරුණු නිසා අනවශ්‍ය බියක් ඇතිකර ගැනීම අනුචණ කටයුත්තක් බවද අවධාරණය කරනවා. ඉංග්‍රීසි යනු ඉගෙන ගැනීමට ඉතාමත් පහසු භාෂාවකි. ජාත්‍යන්තර භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාවිතා කිරීමට මෙය ද එක හේතුවකි.

ඉංග්‍රීසි ඉගෙන ගැනීමට සහ දියුණු කර ගැනීමට ඉංග්‍රීසි භාවිතය අත්‍යවශ්‍යම දෙයකි. තමාට හැකියාව ඇති අයුරින් ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීම, ඉංග්‍රීසි භාෂාවෙන් සිතීම කළ යුතුයි. ඉංග්‍රීසි භාෂාව යනු අපගේ මව් භාෂාව නොවන නිසා සහ අප ශිෂ්‍යයන් වන නිසාත් ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමේදී සිදු වන අඩුපාඩු පිළිබඳ ඔබ ලැජ්ජ වියයුතු නැත. එමෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් රචිත පොත් පත්තර කියවීම, ඉංග්‍රීසි ගුවන්විදුලි වැඩසටහන් ශ්‍රවණය කිරීම සහ ඉංග්‍රීසි උපසිරැසි භාවිතා කර චිත්‍රපට නැරඹීමද ඔබ විසින් කළ යුතුය. දිනකට අවම වශයෙන් අලුත් වචන පහක් හෝ ඉගෙනගෙන තමා විසින් ශබ්දකෝෂයක් ගොඩනැගීම කළ හැකිය. ඉංග්‍රීසි ව්‍යාකරණ ඉගෙන ගැනීම සඳහා ඔබට අන්තර්ජාලය භාවිතා කර හැක. ඒ වගේම ඔබ ඉගෙන ගන්නා ව්‍යාකරණ නැවත නැවතත් භාවිතා කිරීමෙන් අමතක නොවන කරුණු බවට පත් කරගත හැක. මිතුරන් කණ්ඩායමක් එකතු වීම ඉංග්‍රීසි පණිවිඩ හුවමාරු කර ගැනීම ද ඉතා සාර්ථක ක්‍රමයකි.

ඉහත සියලුම ක්‍රම භාවිතා කර ඔබට ඔබගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කරගත හැක. ලිපියේ සඳහන් සියලුම කරුණු වලින් ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම සහ එය වැඩි දියුණු කර ගත හැකි ආකාරය ඔබට පසක් වූවා යැයි මම බලාපොරොත්තු වෙමි.

**උසස් පෙළ කඩඉම "A" සමාර්ථ තුනකින් නොව "A" සමාර්ථ හතරකින් ජය ගැනීමට ඔබ සැමට සුභ පතමි !**



H P W පමෝද ජයසංඛ
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# රාජ්‍ය අයවැය ලේඛනය

අයවැය ලේඛනයක් යනු කිසියම් රජයක ඉදිරි මුදල් වර්‍ෂය සඳහා ආණ්ඩුවේ අපේක්‍ෂිත ආදායමත්, අපේක්‍ෂිත වියදමත්, අයවැය හිඟයක් ඇත්නම් එය පියවාගන්නා ආකාරයත් ඇතුලත් කරමින් මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනුලබන මුදල් සැලැස්මයි.

රාජ්‍ය අයවැය ලේඛනය සකස් කිරීමේදී ප්‍රථමයෙන් සිදු කරනුයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවල සහ අමාත්‍යාංශවල වැය ලේඛන අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රමුඛත්වයෙන් සැකසීමයි. ඉන්පසු මෙම වැය ලේඛන අදාළ විෂයභාර අමාත්‍යවරයා මහා භාණ්ඩාගාරයට යොමු කළයුතු අතර ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ ප්‍රමුඛත්වයෙන් ප්‍රධාන අයවැය ලේඛනය සකස් කරනු ලැබේ.

අයවැය ලේඛනයක් ආශ්‍රිත සංකල්ප කිහිපයක් පවතී.

❖ විසර්ජන කෙටුම්පත

අමාත්‍ය මණ්ඩලය තුළ අයවැය යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා නැවත මුද්‍රණය කරන ලද අයවැය ඇස්තමේන්තුව මෙයින් හැඳින් වේ. මෙහි අයවැය පිළිබඳ ප්‍රධාන ශීර්ෂයන් පමණක් අතුළත් වේ.

❖ අයවැය පළමුවර කියවීම

විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුවට ප්‍රථමවරට ඉදිරිපත් කිරීම මෙනමින් හැඳින් වේ. මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රධාන අයවැය වාර්තාව පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට දින 10කට පෙර අයවැය පළමුවර කියවීම සිදු කරයි.

❖ අයවැය දෙවනවර කියවීම

මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ දී අයවැය කතාව සිදු කිරීම මෙනමින් හඳුන්වයි. මෙම අයවැය කතාව තුළ වර්තමාන ආර්ථික තත්ත්වය, වර්තමාන අයවැය පෙර අයවැය සමඟ සංසන්දනය කිරීම හා අයවැය යෝජනා ඉදිරිපත් කිරීම යන සංරචකයන් ඇතුළත් වේ.

❖ අයවැය තෙවනවර කියවීම

එක් එක් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල වැය ශීර්ෂ වෙන වෙනම විස්තරාත්මකව සාකච්ඡා කර ගැනීම සහ අනුමත කර ගැනීම අයවැය තෙවනවර කියවීම යන්නෙන් හඳුන්වයි.

❖ අතුරු සම්මත ගිණුම

විවිධ හේතූන් මත විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අවස්ථාවක මාස 3ක් හෝ 4ක් වැනි කෙටි කාලයක් සඳහා රජයේ කටයුතු පවත්වාගෙන යාමට ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා ගැනීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවලියක් අතුරු සම්මත ගිණුමක් ලෙස හඳුන්වයි.



❖ පරිපූරක ඇස්තමේන්තුව

යම්කිසි දෙපාර්තමේන්තුවකට හෝ අමාත්‍යාංශයකට වෙන්කර ඇති මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවනවිට අදාල විෂයභාර අමාත්‍යවරයා විසින් අතිරික්ත මුදල් ලබාගැනීම උදෙසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාව මෙයින් හැඳින් වේ.

❖ අතුරු අයවැය

යම්කිසි ආණ්ඩුවක් විසින් සම්මත කරගෙන ඇති අයවැය ලේඛනය බලරහිත කර තවත් විසර්ජන කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගන්නා ලද නව අයවැය ලේඛනයක් අතුරු අයවැයක් ලෙස හඳුන්වයි.

අයවැය ලේඛනයක ප්‍රධාන ගිණුම් දෙකක් පවතී.

1) වර්තන ගිණුම

යම්කිසි වසරක රජයේ අයභාරය සහ වර්තන වියදම් ඇතුළත්කොට සාදනු ලබන ගිණුම වේ.

2) ප්‍රාග්ධන ගිණුම

ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා රජයේ ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම උදෙසා ඇස්තමේන්තුගත වියදම් ප්‍රාග්ධන ගිණුම මඟින් නිරූපණය කරයි.

ආණ්ඩුව ලද ප්‍රදාන ඇතුළු මුළු අයභාරය සහ රජයේ මුළු වියදම එනම්, වර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් යන අයිතමයන්ගේ එකතුවත් අතර වෙනස මගින් රජය සමස්ත අයවැය ශේෂය ගණනය කරනු ලබයි. ඕනෑම ආර්ථිකයක අයවැය හිඟයක් හෝ අයවැය අතිරික්තයක් පැවතිය හැකිය. ශ්‍රී ලංකාවේ ද 1954 සහ 1955 වසරවල දී අයවැය අතිරික්තයක් පැවති අතර අනෙකුත් සෑම වසරකම අයවැය හිඟයක් පැවතිනි.

අයවැය ලේඛනයේ අයවැය අතිරික්තයක් ඇති වුවහොත් ආර්ථිකයට කුමක් සිදු වේවි ද?

රාජ්‍ය අයභාරය රාජ්‍ය වියදමට වඩා වැඩි වුවහොත් ප්‍රධාන වශයෙන් සමාහාර ඉල්ලුම සංකෝචනය වීම නිසා අවධමනාත්මක තත්වයක් ඇති වේ. එමෙන්ම සමස්ත නිමවුමේ සහ සේවා නියුක්තියේ අඩු වීමක් ද ඇති විය හැකියි. මෙවැනි අවස්ථාවක සමස්ත පොලී අනුපාතයේ පහළ යාමක් සිදුවිය හැකි අතර රාජ්‍ය ඉතුරුම් ඉහළ යාම තුළින් දේශීය ඉතුරුම් මට්ටම ද ඉහළ යයි. එමෙන්ම විදේශ ණය දීම් වැනි කටයුතු සඳහා අයවැය ලේඛනයේ අතිරික්තය භාවිතා කළ හැකිවීම තුළින් ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය විශ්වාසය වර්ධනය කර ගත හැකියි.

අයවැය ලේඛනයේ අයවැය හිඟයක් ඇති වුවහොත් ආර්ථිකයට කුමක් සිදු වේවි ද?

රජයේ මුළු වියදම මුළු අයභාරය ඉක්මවා ගියහොත් ප්‍රධාන වශයෙන් ආර්ථිකයේ සමාහාර ඉල්ලුම ඉහළ ගොස් උද්ධමන පීඩනයක් ඇතිවිය හැකියි. නමුත් සමාහාර ඉල්ලුම ප්‍රසාරණය වීම නිසා සේවා නියුක්තිය සහ නිමවුම් මට්ටම ඉහළ යයි. එමෙන්ම අයවැය ලේඛනයේ හිඟය පියවාගැනීම සඳහා රජය විසින් දේශීය වෙළඳපොලෙන් ණය ලබාගැනීම තුළින් පෞද්ගලික අංශයේ ආයෝජන උදෙසා අරමුදල් හිඟයක් ඇති වී පෞද්ගලික ආයෝජන අධෛර්යමත් වේ. මෙය තෙරපුම් ප්‍රතිවිපාකය වශයෙන් ද හඳුන්වනු ලබයි. රජය විසින් ලබා ගෙන ඇති ණය පියවීම උදෙසා නව තවත් රජයට ණය ලබා ගැනීමට සිදු වීමෙන් ණය පාෂයකට මුහුණ පෑමට රජයට සිදු වේ. එවැනි තත්ත්වයක දී අයවැය හිඟය තව තවත් පුළුල් වන අතර ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය විශ්වාසයේ පළුදු වීමක් ද සිදු වේ. රාජ්‍ය වියදම් වැඩි වීම හේතුවෙන් රාජ්‍ය ඉතුරුම් අඩු වී දේශීය ඉතුරුම් අඩු වන අතර දේශීය මුදල් ඒකකයක බාහිර වටිනාකම ද ක්ෂය වේ. සමස්තයක් වශයෙන් ආර්ථිකය බිඳ වැටීම හරහා ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට බාධා ඇති වේ.



පී.එම්.එන්. දුලංගා විජේසිංහ
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය




# මුදල් වෙළෙඳපොළ

ණය ඉල්ලුම්කරුවන් හා ණය මුදල් සපයන්නන් ඔවුනොවුන්ගේ කෙටිකාලීන අවශ්‍යතා ද්‍රවශීලනය කරන ස්ථානය හෝ අවකාශය මුදල් වෙළෙඳපොළ ලෙස සරලව හැඳින්විය හැක. එනම් සියලුම කෙටිකාලීන මූල්‍ය උපකරණ ගනුදෙනු වන වෙළෙඳපොළ මෙයයි.

**මුදල් වෙළෙඳපොළෙහි උප වෙළෙඳපොළවල්**

01. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ

වාණිජ බැංකු අතර කෙටිකාලීන ණය ඉල්ලුම් හා ණය සැපයුම් සිදුවන වෙළෙඳපොළයි. ද්‍රවශීලතා හිඟයෙන් පෙළෙන බැංකු සිය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට අතිරික්ත ද්‍රවශීලතාවයක් සහිත වාණිජ බැංකු වලින් දින 7ක් හෝ ඊට වඩා අඩු කාලයකින් පියවීමට යටත්ව මුදල් ණයට ගැනීම හෙවත් ඒක්ෂණ ණය ගනුදෙනු සිදුවන වෙළෙඳපොළ අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ ලෙස හැඳින්වේ.

බොහෝ විට මෙම ගනුදෙනු එක් දිනක් තුළ කල් පිරෙන අතර බැංකු පොලී අනුපාතය කෙරෙහි සෘජුව බලපායි. ලංකාවේ සියලුම වාණිජ බැංකු මේ සඳහා සහභාගී වන අතර වාණිජ බැංකු නොවන පහත බැංකු ද ණය සැපයුම්කරුවන් ලෙස සහභාගි වේ.

- ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව

02. දේශීය හා විදේශීය විනිමය වෙළෙඳපොළ

වාණිජ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවලට අදාල වෙළෙඳපොළ යි. ශ්‍රී ලංකා රුපියලේ විදේශ මුදල් වල අගය රඳවා ගැනීමට මෙම වෙළෙඳපොළ උපකාරී වේ.
දැනට ක්‍රියාත්මක වන විදේශ විනිමය පාලන ප්‍රතිපත්ති යටතේ විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම සඳහා අවසර ලැබී ඇත්තේ වාණිජ බැංකු වලට ය.

03. එතෙර බැංකු වෙළෙඳපොළ (FCBU)

වාණිජ බැංකුවල පිහිටුවා ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ගනුදෙනු සඳහා වන වෙළෙඳපොළ මෙයයි.
වාණිජ බැංකුවල විදේශ විනිමය ඒකකවල අනුමත විදේශ ව්‍යවහාර මුදල් වලින් අනුමත පුද්ගලයින්ට, එනම් විදේශිකයින්ට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත දේශීය හා විදේශීය ආයෝජකයින්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් පුද්ගලයින්ට විදේශ ව්‍යවහාර මුදලින් ණය දීමේ බලයක් පවතී.

04. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ

ඉහළ කීර්තිනාමයක් සහිත සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීලතාව සපුරාගැනීමට මාස 6ක් වැනි කෙටි කාලයක් තුළ කල්පිරෙන වාණිජ පත්‍රිකා විකිණීම හා මිලදී ගැනීම සිදුවන වෙළෙඳපොළ මෙයයි.

05. භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ

රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයට අවශ්‍ය කෙටිකාලීන ණය සපයා ගැනීමට මාස 03 /මාස 06 /මාස 12 වැනි කල්පිරීමේ කාලයන් සහිතව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විකිණීම හා මිලදී ගැනීම සිදුවන වෙළෙඳපොළ මෙයයි.

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ පහත පරිදි වර්ගීකරණය කරගත හැක.

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ ප්‍රාථමික හා ද්විතීයික ලෙස වර්ගීකරණය

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ප්‍රාථමික වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුලින්ම භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන විට ඒවා මිලට ගැනීම සිදුවන වෙළෙඳපොළයි.

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ද්විතීයික වෙළෙඳපොළ

ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිලදී ගන්නා භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමට ප්‍රථම වෙනත් පාර්ශවයකට විකුණන වෙළෙඳපොළයි.

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ

ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රති-විකුණුම් ලෙස වර්ගීකරණය

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ ප්‍රතිමිලදී ගැනීම් වෙළෙඳපොළ

මහා බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අළෙවි කරන මෙම වෙළෙඳපොළ නිත්‍ය තැන්පතු පහසුකම් වෙළෙඳපොළ ලෙසද හැඳින්වේ.

භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළෙඳපොළ ප්‍රති-විකුණුම් වෙළෙඳපොළ

මහ බැංකුව ලංසු මත තීරණය වන මිලකට වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් අළෙවිය සිදු කරන මෙම වෙළෙඳපොළ නිත්‍ය ණය පහසුකම් වෙළෙඳපොළ ලෙසද හැඳින්වේ.



ඩබ්. එම්. ඩී. ටානියා ද සිල්වා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ඒක පුද්ගල ආදායම හා ලෝක බැංකු ආර්ථික ශ්‍රේණිගත කිරීම

උසස් පෙළ හදාරන ශිෂ්‍යයෙකු ලෙස ඔබට ඒක පුද්ගල ආදායම යන සංකල්පයත්, ලෝක බැංකුව ආර්ථික වර්ගීකරණය සිදු කරන ආකාරය පිලිබදවත් මනා අවබෝධයක් ආර්ථික විද්‍යා විෂය නිර්දේශය යටතේ ලැබී ඇති බව අවිවාදයෙන් පිලිගත යුතුම නමුත් මෙම ඒක පුද්ගල ආදායම සැබෑවටම ගණනය කරන්නේ කෙසේද? කවුරුන් විසින්ද? ප්‍රායෝගිකව මෙම සංකල්පය භාවිතයෙන් ලෝක බැංකුව විවිධ රටවල් වල ආර්ථිකයන් කාණ්ඩගත කරන්නේ කෙසේද? හා සැබවින්ම මෙම සංකල්පය රටවල් අතර සංසන්දනයන් සඳහා භාවිත කිරීමට සුදුසුද? යන ගැටලු සඳහා පිලිතුරු සපයමින් වඩාත් පුළුල් අවබෝධයක් ලබාදීමට මෙම ලිපියෙන් බලාපොරොත්තු වෙමි.

ඒක පුද්ගල ආදායම (Per-capita income) රටක ආර්ථිකයෙහි කාර්යසාධනය මැනීම සඳහා භාවිතා කළ හැකි සාර්ව ආර්ථික දර්ශකයකි. පැහැදිලිවම මෙය ආදායම් මිනුමක් වන අතර ආර්ථිකයක සමස්ත ආදායම රටේ ජනගහනය අතර සමානුපාතිකව බෙදාහරිනු ලැබුවහොත් එක් පුද්ගලයෙකුට ලැබෙන කොටසේ වටිනාකම ඒක පුද්ගල ආදායම ලෙස සරලවම අර්ථකථනය කළ හැකිය. රටක සැබෑ ආදායම වන්නෙ ''දළ ජාතික ආදායමයි''. එබැවින් ඒක පුද්ගල ආදායම ගණනය කරනුයේ දළ ජාතික ආදායම භාවිතයෙනි. ඒ අනුව යම් කිසි වර්ෂයක පවත්නා මිලට දළ ජාතික ආදායම එම වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙන් ඒක පුද්ගල ආදායම ගණනය කල හැකිය.

$$\text{ඒක පුද්ගල ආදායම} \quad \frac{\text{පවත්නා මිලට දළ ජාතික ආදායම}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$$

ඒක පුද්ගල ආදායම විවිධ රටවල් වල ආර්ථික තත්වයන් සංසන්දනය කිරීමට මෙන්ම රටක ජීවත්වන පුද්ගලයන්ගේ සුබසාධනය මැනීම සඳහා ද විවිධ පුද්ගලයින් අවස්ථානුකූලව යොදාගනු ලබන අතර ශ්‍රීලංකා මහ බැංකුව විසින් මෙය ගණනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ශික ජනගහනය ගණනය කරනු ලබන්නෙ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සපයන සංගණන වාර්තා වලට අනුව ''රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව'' විසිනි.

මීලඟට, ලෝක බැංකුව (International Bank Reconstruction and Development, The World Bank) විසින් ලෝකයෙ විවිධ රටවල් කාණ්ඩ ගත කරන ආකාරය විමසා බලමු.

ලෝක බැංකුව මෙම වර්ගීකරණය සඳහා යොදාගනු ලබන මිනුම වන්නෙ ඒක පුද්ගල දළ ජාතික ආදායමයි. සාමාන්‍යයෙන් ලෝක බැංකුව මේ සඳහා ඇතුලත් කරගනු ලබන්නෙ ලෝක බැංකුවේ සාමාජික රටවල් සහ අනෙකුත් රටවල් අතුරින් සමස්ත ජනගහනය 30,000 ඉක්ම වූ රටවල් පමණි. යම් හෙයකින් ශ්‍රේණිගත කිරීම් සඳහා යොදාගන්නා ආදායම් සීමා හා එම සීමා වලට අනුව රටවල් වල ආදායම් කාණ්ඩයන් වෙනසක් වී ඇත්නම් ඒවා සෑම වර්ෂයකම ජූලි මස පළමුවන දින යාවත්කාලීන කරනු ලබයි.

ඒ අනුව 2021 ජූලි මස පළමුවැනි දින සිට අදාළ වන පරිදි ලෝක බැංකුව විසින් රටවල් කාණ්ඩගත කරනු ලබන සීමා පහත වගුවෙහි දැක්වේ.

| ආදායම් කාණ්ඩ | ඒක පුද්ගල දළ ජාතික ආදායම (නව) 2021 ජූලි 1 දිනට එ.ජ.ඩො | ඒක පුද්ගල දළ ජාතික ආදායම (පෙර) 2020 ජූලි 1 දිනට එ.ජ.ඩො |
|---|---|---|
| අඩු ආදායම් | 1045 ට වඩා අඩු | 1034 ට වඩා අඩු |
| මැද පහළ ආදායම් | 1046 - 4095 ත් අතර | 1035 - 4045 ත් අතර |
| මැද ඉහළ ආදායම් | 4096 - 12695 ත් අතර | 4046 - 12535 ත් අතර |
| ඉහළ ආදායම් | 12695 ට වඩා වැඩි | 12535 ට වඩා වැඩි |

මීළඟට ඒක පුද්ගල ආදායම රටවල් අතර සංසන්දනය කිරීම සඳහා සුදුසු ද නැතිද යන්න විමසා බලමු.

විවිධ රටවල් වල භාණ්ඩ හා සේවා සඳහා වන මිල ගණන් අතර විෂමතාවන් පවතී. එම නිසා පැහැදිලිවම ඒක පුද්ගල ආදායම රටවල් අතර සංසන්දනය සඳහා සුදුසු නොවේ. එමනිසා මෙම අඩුපාඩුව මගහරවාගෙන විවිධ රටවල් අතර නිවැරැදි සංසන්දනයන් සිදුකිරීම සඳහා ලෝක බැංකුව විසින් ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම (Per-capita PPP GNI) යොදා ගනු ලබයි. එමගින් විවිධ රටවල් අතර පවතින ජීවන වියදම් විෂමතා ඉවත්ව යන බැවින් රටවල් අතර ආර්ථිකයන් සංසන්දනය සඳහා මෙය ඉතාම යෝග්‍ය දර්ශකයකි. උදාහරණයක් ලෙස පහත රටවල් දෙක සලකා බලමු.

| රට | ඒක පුද්ගල දළ ජාතික ආදායම (එ.ජ.ඩො) | ක්‍රය ශක්ති සාම්‍ය ඒකපුද්ගල දළ ජාතික ආදායම (එ.ජ.ඩො) |
|---|---|---|
| ලක්සම්බර්ග් | 102,831 | 105,882 |
| කටාර් | 59,331 | 127,523 |

(අගයන් කල්පිත වේ)

උදාහරණයට අනුව ඒක පුද්ගල දළ ජාතික ආදායම අතින් ගත්කල ලක්සම්බර්ග් හි ආර්ථිකය කටාර් රාජ්‍යයේ ආර්ථිකයට වඩා ඉහළ මට්ටමක පවතී. එනම් මෙහිදී කටාර් රාජ්‍යයට හිමිවන්නෙ ලක්සම්බර්ග් දේශයට වඩා පහල ශ්‍රේණිගත කිරීමකි. එසේ සිදු වී ඇත්තෙ ලක්සම්බර්ග් හි මිල මට්ටම කටාර් හි මිල මට්ටමට වඩා ඉහළ අගයක් ගන්නා බැවිනි. නමුත් ක්‍රය ශක්ති සාමාන්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම අතින් ගත් කල කටාර් රාජ්‍ය ලක්සම්බර්ග් අභිබවා ඉදිරියට පැමිණ ඇත.

මින් පැහැදිලි වන්නෙ ඒක පුද්ගල දළ ජාතික ආදායම රටවල් අතර සංසන්දනයන් සඳහා යෝග්‍ය දර්ශකයක් නොවන බවත් ඒ සඳහා වඩාත් යෝග්‍ය වන්නේ මිල මට්ටම් විෂමතා ගැලපුම් කරන ලද ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම බවත් ය.



W.K. දේවින්දි
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# මානව සම්පතේ වටිනාකම කාලීනව ඇගයීම

අතීතයේ දී ව්‍යාපාර සිය වටිනාම සම්පත ලෙස සලකනු ලැබුවේ සිය ගනුදෙනුකරුවන්ය. නමුත් වර්තමානය වනවිට මෙම තත්ත්වය බොහෝ සෙයින් වෙනස් වී ඇත. ව්‍යාපාරයේ අරමුණු පරමාර්ථ ළඟාකර ගැනීම සිහිනයක් නොවන්නට නම් දක්ෂතා, කුසලතා හා හැකියාවන්ගෙන් පරිපූර්ණ සේවක පිරිසක් ව්‍යාපාරයට සිටිය යුතුම වේ. එබැවින් වර්තමානයේ ගණුදෙනුකරුවන් තරමටම සේවකයින්ද ව්‍යාපාරයට වටිනා සම්පතක් ලෙස සලකනු ලබයි.

**මානව සම්පත නැතුවම බැරි ඇයි?**

මානව සම්පත සුවිශේෂී වැදගත්කමකින් හෙබි සම්පතක් වනුයේ මානව සම්පත අතීතයේ සිට වර්තමානය දක්වාම ව්‍යාපාර කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට සමත් වන නිසාය. එනම්, ව්‍යාපාරයේ සියලුම කටයුතු පාලනය, මෙහෙයවීම, සැලසුම් කිරීම ආදී සියලූම කටයුතු මිනිස්බල එසේ නැතහොත් මානව සම්පත මත රඳා පවතින බැවිනි.

අනෙකුත් සම්පත් හැසිරවීම, පාලනය කිරීම, සැලසුම් කිරීම එම සියලුම කටයුතු සඳහා මූලිකත්වය දරනු ලබන ප්‍රධානම සම්පත් අතර මානව සම්පත පවතී. ඒ අනුව මානව සම්පතට සෙසු සම්පත්වලට සාපේක්ෂව සුවිශේෂී වැදගත්කමක් හිමිවේ. මානව සම්පත සතු සුවිශේෂී ලක්ෂණ මෙසේ  දැක්විය හැකිය.

- ✓ සජීවී සම්පතක් වීම නිසාත් ප්‍රතිචාරයක් දැක්වීමට හා සිතීමට හැකිවීම.
- ✓ අනෙකුත් සම්පත් පාලනය කිරීමට හැකිවීම.
- ✓ අධ්‍යාපනය, පුහුණුව, පළපුරුද්ද තුළින් අගය වැඩිකල හැකිය.

ඉහත ලක්ෂණ පදනම් කරගනිමින් ව්‍යාපාරයේ සම්පත් අතුරින් සුවිශේෂී වැදගත්කමක් හිමිවන මානව සම්පත ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය බැවින් එම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මානව සම්පත ව්‍යාපාර ඒකකය තුළ රඳවා ගැනීමේ අවශ්‍යතාවය මෙහිදී පැනනගිනු ඇත. ඒ සඳහා සේව්‍ය පාර්ශව විසින් අති විශාල කාර්යක් ඉටු කරනු ලබයි. ඒ අතරින්,

- සේවකයන් පුහුණු කිරීම.
- සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම.
- කාර්මික සම්බන්ධතා පවත්වාගෙන යාම මූලික වේ.

**සේවක පුහුණුව හා සංවර්ධන ප්‍රතිලාභ හිමිවන්නේ සේවකයාටද සේවා යෝජකයාටද?**

සේවායෝජකයා විසින් පුහුණුව හා සංවර්ධනය මගින් ව්‍යාපාරයේ අරමුණු පරමාර්ථ ළඟාකර ගැනීම උදෙසා සේවකයාගේ හැසිරීමට බලපෑමක් සිදු කරමින් සේවකයා අභිප්‍රේරණය කිරීම සිදුකරයි. මේ තුළින් සේවායෝජකයා විසින් අපේක්ෂා කරනුයේ, සේවකයා තුළ නව දැනුම ජනනය කිරීමත් ඔහු හෝ ඇය තුළ නව කුසලතා උත්පාදනය කිරීම හා ඒවා වැඩිදියුණු කිරීමත්ය.

ව්‍යාපාර ආයතනයක් විසින් සේවකයන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා විශාල පිරිවැයක් දරනු ලබන අතර එම පිරිවැය දැරීම තුළින් එහි ප්‍රතිලාභ ආයතනයට පමණක් නොව සේවකයාගේ දිගුකාලීන වෘත්තිය ජීවිතය සඳහාද හිමිවනු ඇත.

මෙලෙස සිදුකරන පුහුණුව තුළින් සේවකයාට අත්වන ප්‍රතිලාභ ලෙස,

- ✓ සේවකයන්ගේ රැකියා තෘප්තිය වැඩිවේ.
- ✓ පුහුණුව හා සංවර්ධනය නිසා කාර්ය සාධනය ඉහළයාම සිදුවේ
- ✓ සේවකයන්ගේ මූල්‍ය ප්‍රතිලාභ වැඩි වීම
- ✓ පුහුණුවලත් සේවකයන්ට උසස්වීම් ලැබීමට අවස්ථාවන්ද හිමිවේ.

සේවකයාට පමණක් නොව සේවායෝජකයාටද මේ තුළින් ප්‍රතිලාභ හිමිවනු ඇත.

- ✓ ව්‍යාපාරය තුළ සේවක අභිප්‍රේරණය ඇතිවීම.
- ✓ පුහුණුව ලද සේවකයන් අතින් සිදුවන වැරදි හා නාස්තිය අවම වීම.
- ✓ ඒ තුළින් නිමවුමේ ගුණාත්මක බව ඉහළ යාම.
- ✓ ගුණාත්මක නිමවුම් ආයතනය විසින් සැපයීම හේතුවෙන් පාරිභෝගිකයන් ව්‍යාපාරය කෙරෙහි ඇති ඇල්ම වැඩිවීම.
- ✓ සේවකයන් ආයතනය තුළ තෘප්තිමත්ව කටයුතු කිරීම හේතුවෙන් සේවක පිරිවැටුම හා ප්‍රවාසිතාවය අඩුවේ.

පුහුණුව හා සංවර්ධනය සඳහා යම් පිරිවැයක් දැරුව ද කෙටි කාලීනව මෙන්ම දිගු කාලීනවද සේව්‍ය-සේවක දෙපාර්ශවයටම ප්‍රතිලාභ හිමිවේ.

**සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව ආයතනය විසින් අවධානය යොමුකළ යුතුද?**

ව්‍යාපාර ආයතනයක් සිය අරමුණු පරමාර්ථ ඉටුකරගැනීමට යෑමේදී ව්‍යාපාරයක් විසින් තම සේවකයන්ගේ මනා සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. එසේ නොවුනහොත් ව්‍යාපාර කටයුතු වඩාත් කාර්යක්ෂම හා සඵලදායීව ඉටුකිරීමට සේවකයින් අපොහොසත් වනු ඇත.

ආයතනයේ සේවකයින්ගේ තෘප්තිමත් බව හා අභිප්‍රේරණය ඉහළ නංවාලීම උදෙසා සේවක ආරක්ෂාව සලසාදීම ආයතනයක් විසින් ඉටුකල යුතු මූලික කාර්යයකි. මෙලෙස සේවක ආරක්ෂාව ලබාදීම තුළින් සෞඛ්‍ය සම්පන්න සේවක පිරිසක් මගින් ආයතනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දායකවීම සිදුවනු ඇත. එමෙන්ම, සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් සංවිධාන වලට මුහුණ දීමට සිදු වන නීතිමය ගැටලු අවම වීමත්, ආයතනයේ ප්‍රතිරූපය ඉහළයාම හා දක්ෂතා හා කුසලතා ඇති සේවක පිරිස් ව්‍යාපාරය තුල රඳවාගැනීමටත් මෙය උපකාරී වනුඇත.

**සේවකයන් ව්‍යාපාරය තුළ රඳවාගැනීම සඳහා කාර්මික සම්බන්ධතා පදනමක් සපයන්නේ කෙසේද ?**

ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා අනිවාර්ය අංගයක් ලෙස හොඳ සේව්‍ය-සේවක සම්බන්ධතාවක් තිබිය යුතුවේ. සේව්‍ය-සේවක දෙපාර්ශවය අතර පවත්නා වෘත්තිය සම්බන්ධතාවය කාර්මික සම්බන්ධතා ලෙස හැඳින්විය හැකිය. ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා තෘප්තිමත් සේවකයින් අවශ්‍ය වේ.ඒ අනුව සේව්‍ය සේවක දෙපාර්ශවයටම එකිනෙකාට අදාළ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු

කිරීම වැදගත්වේ. මෙලෙස යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතා පවත්වා ගැනීමෙන් ව්‍යාපාරයේ සේවක ඵලදායිතාවය ඉහළයාම, සම්පත් නාස්තිය අවමවීම, අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් ඇතිවීම, සේවක පිරිවැටුම හා ප්‍රවාසිතාවය අඩුකරගැනීම වැනි බොහෝ වාසි ව්‍යාපාරයට අත්වනු ඇත.

ව්‍යාපාරය විසින් ආයතනය තුළට ආකර්ෂණය කර බඳවාගත් සේවකයන් දිගුකාලීනව ව්‍යාපාරය තුළ රඳවාගැනීම මගින් ව්‍යාපාරයේ අරමුණු පරමාර්ථ ළඟාකර ගැනීමට සේවායෝජකයින් විසින් අත්‍යන්ත කාර්යභාරයක් ඉටුකල යුතුවේ.

එලෙස බඳවාගත් සේවකයන් ව්‍යාපාරයට පක්ෂපාතී, ඵලදායි සේවක පිරිසක් බවට පත් කිරීම සඳහා සේවකයින්ගේ අවශ්‍යතා හා වුවමනා සහ ඔවුන්ගේ ගැටලු නිරාකරණය කර ඔවුන්ට තෘප්තිමත්ව කටයුතු කිරීමට අවස්ථාව සලසාදීම තුළින් සේවක පිරිවැටුම හා සේවක ප්‍රවාසිතාවය අවම කර ව්‍යාපාරය අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ කරා පහසුවෙන් ළඟාවීමට හැකිවනු ඇත.

වර්තමානයේ රට තුළ පවත්නා කොවිඩ් තත්ත්වය මත ව්‍යාපාර තුළ නව ප්‍රවණතා මෙන්ම විවිධ වූ අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. එලෙස ඇතිවන නව ප්‍රවණතා හා අභියෝග රාශියක් පවතී.

**නව ප්‍රවනතා**

1)නිවසේ සිට මාර්ගගත (Online) ක්‍රමයට සේවය කිරීම

2)සේවක සෞඛ්‍ය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම

3)මාර්ගගත ක්‍රමයට සේවය කිරීම සඳහා අවශ්‍ය උපාංග හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම

4)මාර්ගගත ක්‍රමයට සේවකයින් පුහුණුකිරීම

5)මාර්ගගත ක්‍රමයට සේවකයින් බඳවා ගැනීම

6)සේවකයන්ගේ ක්‍රියාකාරීත්වය හා සේවා තත්වය අන්තර්ජාලය ඔස්සේ සොයා බැලීම

**අභියෝග**

1)සේවකයන්ගේ මානසික සෞඛ්‍යය මනාව පවත්වාගෙන යාම.

2)ව්‍යාපාරය අරමුණු පරමාර්ථ ළඟාකර ගැනීමට දායකවන සුදුසු නව සේවකයින් බඳවාගැනීම

3)කාර්යක්ෂම සේවක පිරිසක් ඇතිකිරීම

මානව සම්පත හුදෙක් සාමාන්‍ය සම්පතක් යැයි සලකා ව්‍යාපාරයට නොසලකා හැරීමක් සිදුකල නොහැකි අතර ව්‍යාපාරයේ රඳාපැවැත්මට බලපාන ප්‍රධානම සාධකය මානව සම්පත බැවින් එය නිසියාකාරව කළමනාකරණය කර ව්‍යාපාරයේ සාර්ථකත්වය ළඟාකරගැනීම ව්‍යාපාරයේ සේවායෝජකයන් සතු ප්‍රධාන කාර්යයක්වේ.



ඒ.පී.ටී.එස්.ඒ.ගමාච්චි
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ඇත්තටම ව්‍යවසායකත්වය කියන්නේ මොකක්ද?



ගෝලීයකරණයට නතු වූ වත්මන් ලෝකයෙහි ව්‍යවසායකයන් හට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. මධ්‍යකාලීන යුගයේ අභාවයත් සමග ඇතිවූ කාර්මික විප්ලවය හට මග පෙන්වූ ප්‍රබලතම අදෘශ්‍යමාන හස්තය ද ව්‍යවසායකත්වයයි. එහිදී, විශ්මයජනක නව නිපැයුම් දායාද කරවූවන් එදා හැඳින්වූයේ ව්‍යවසායකයන් ලෙස යි. කාර්මික විප්ලවයත් සමග සුපෝෂිත වූ ව්‍යවසායකත්වය වර්තමාන ලෝකයේ හදවත බඳු වී ඇත. රටක වර්ධනයේ මූලික පියවරක් ලෙස මෙය දැකිය හැකි අතර පරපෝෂිත රටක් ස්වයංපෝෂිත කරවීමට ඇති මූලිකම මාර්ගය ව්‍යවසායකත්වයයි.

නව අවස්ථා උදා කරගනිමින්, ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය හෝ නව්‍යතා සම්පාදනය ව්‍යවසායකත්වයයි.

එමෙන්ම ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන, සම්පත් ඒකරාශී කරගෙන, අවදානම් දරමින්, නව්‍යතා සම්පාදනය කරන්නන් ව්‍යවසායකයින් ලෙස හැඳින්වේ.

මෙය බැලූ බැල්මට සරල වුවද ව්‍යවසායකයකු බවට පත්වීම ඉතාම සංකීර්ණ මෙන්ම ඉතාම අපහසු ක්‍රියාවකි. මන්ද, ව්‍යවසායකත්වයේ මූලික ලක්ෂණය අවදානම් දැරීම බැවිනි. බොහෝ පුද්ගලයින් ව්‍යවසායකයකු බවට පත්වීමට කැමැත්තක් දැක්වුවද අවදානම් දැරීමට මැලිවෙයි. තවත් පුද්ගලයන් අසාර්ථකත්වයට බියවෙයි. තවත් පුද්ගලයන් බාධක හමුවේ පසුබසිනු ලබයි. මේ සියල්ලටම නොබියව මුහුණදෙන පුද්ගලයා අවසානයේදී සාර්ථක ව්‍යවසායකයෙකු බවට පත්වේ.

පරිපූර්ණ ව්‍යවසායකයා තුළ,

- ආත්ම විශ්වාසය
- නිර්මාණශීලිත්වය
- නව්‍යතා සම්පාදනය
- ස්වාධීන බව
- නොපසුබට උත්සාහය
- දැක්මක් සහිත බව
- සුභවාදී බව යනාදී ගුණාංග නිසැකයෙන්ම තිබිය යුතු අතර,
- කාල කළමනාකරණය,
- විශ්ලේෂණය,
- සන්නිවේදනය,
- ගණනය,
- උපදෙස් දීම,
- කළමනාකාර හැකියාව යානාදී කුසලතා පැවතීමද බෙහෙවින්ම වැදගත් වේ.

ව්‍යවසායකයකුගේ සාර්ථකත්වය තුළින්, එසේත් නොමැතිනම් සෑම සාර්ථක ව්‍යවසායකයකුම ප්‍රතිලාභ ජනිත කරනුයේ තමාටම පමණක් නොව, මුළු මහත් සමාජයටමය.

- නව රැකියා අවස්ථා බිහිවීම,
- ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම,
- ප්‍රාදේශීය සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම,
- පූර්ණ සේවා නියුක්තිය ඇතිවීම,
- රට තුලට විදේශ විනිමය ගෙන්වා ගැනීමට හැකියාව ලැබීම,
- ආර්ථික වෘර්ධිය ඇතිවීම යනාදිය ඉන් ප්‍රධාන ප්‍රතිලාභ කිහිපයකි.

ගතික ලෝකයෙහි ගතික පරිසරයේ සිදුවන විචලනයන් හට ප්‍රතික්‍රියා දැක්වීමට ඇති විශිෂ්ටතම මාර්ගයක් ලෙස ව්‍යවසායකත්වය දකිමි.

ව්‍යවසායකත්වය අප රට තුල ප්‍රචලිත නොවීමට ප්‍රධානතම හේතු වන්නේ සමාජය තුල ඇති ස්ථිර වැටුප සහ විශ්‍රාම වැටුප නමැති පුහු සංකල්පය, රැකියාවකට යාමෙන් පසු ගතානුගතික ලෝකයක සිරවීම, රැකියාව නැමැති ගතානුගතික ලෝකයේ සිරවූ පසු ඇතිවන මානසික පීඩනයෙන්, පුද්ගලයාගේ නිර්මාණශිලිත්වය අහිමි වීම වේ. බොහෝ විට රටේ අධ්‍යාපන ක්‍රමයෙන් පවා කුඩා කල සිට දරුවකුට මග පෙන්වන්නේ නිර්මාණශීලී ව්‍යවසායකයකු බවට පත්වීමට නොව තවකෙකුගේ අතවැසියකු බවට පත්වන රැකියාවක් සිදු කිරීමටය. එබැවින් පුද්ගලයන්ගේ ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කරවීම සඳහා විවිධ ක්ෂේත්‍ර පිළිබඳව විධිමත් අධ්‍යාපනයක් ලබාදීම, අත්දැකීම් සහ පලපුරුද්ද ලබාදීම, ආදර්ශ චරිත පිලිබඳව පාසැල් අධ්‍යාපනය තුලින්ම ඉගැන්වීම, විදේශගත අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීමට කටයුතු කිරීම, ප්‍රායෝගික පුහුණුව ලබාදීම, වැනි දේ සිදුකිරීමෙන් අනාගත ප්‍රතිලාභයක් ලෙස ආර්ථිකයෙහි තීව්‍ර වර්ධනයක් මෙන්ම භාණ්ඩ සහ සේවා පරිභෝජන ක්‍රියාවලියේ සුපැහැදිලි ස්වයංපෝෂිත බවක් ද දැකිය හැක.
පුද්ගලබද්ධ වූ නිර්මාණාත්මක බව මිනිසා තුලින් අවදි කරවීම යනු නව ලෝකයක් බිහි කරවීම හා සමාන වේ.

ව්‍යවසායකයින් බිහිවීම කෙරෙහි නොයෙක් මතවාද පවතී. මන්ද, ඔවුන් බිහිවන්නේ උපතින්ද එසේත් නොමැතිනම් අධ්‍යාපනය සහ පළපුරුද්ද නැමැති කරුණු තුළින්ද යනාදී ප්‍රශ්න මතය. මේ සඳහා නොයෙක් පර්යේෂණ පවා සිදුකර ඇත. ඉන් තහවුරු වී ඇත්තේ ව්‍යවසායකත්ව පසුබිමක් නොමැති පවුල් වල දරුවන්ට වඩා ව්‍යාපාර පසුබිමක් හිමි පවුල් වල දරුවන් ව්‍යවසායකත්වයට නැඹුරු වී ඇති බවයි. එසේම කිසිදු ව්‍යාපාර පසුබිමක් නොමැති පවුල් වල පුද්ගලයන්ද ව්‍යවසායකත්වයට නැඹුරු වී ඇති අතර ඔවුන් ව්‍යවසායකත්ව කුසලතා බොහොමයක් ලබාගෙන ඇත්තේ අධ්‍යාපනය සහ පළපුරුද්ද තුළින්ය. කෙසේ වුව ද එලෝන් මස්ක්, ස්ටීව් ජොබ්ස්, බිල් ගේට්ස්, ඇල්බට් අයින්ස්ටයින් වැනි පුද්ගලයන්, ඉගැන්වීම තුලින් පමණක් බිහි කළ හැකිද යන්නෙහි පිළිතුර අදටත් විවාදාත්මකයි. කෙසේ වුවද සහජයෙන් බිහිවන ව්‍යවසායකයන් මෙන්ම සහජයෙන් තොරව බිහිවන ව්‍යවසායකයන්ද සමාජය තුල සිටිනා බව නිසැකයෙන්ම පැහැදිලිය.

ව්‍යවසායකයන් බිහි වීමට පසුබිම් වන ප්‍රධාන සාධක ලෙස පවුල් පසුබිම, ස්ව නිර්මාණ කෙරෙහි යොමු වීම, සමාජ ආර්ථික පසුබිම, අත්දැකීම් හෝ පළපුරුද්ද, විනෝදාංශ, අධ්‍යාපනය සහ පුහුණුව, සමාජීය ගැටළු හැඳින්විය හැකිය.

ලෝක ප්‍රසිද්ධ e-bay, Internet, Yahoo, Google, Apple, HP වැනි ලොව සුපතල සමාගම් සඳහා නිඹිරි ගෙය වූ ඇමරිකා එක්සත් ජනපදයේ සිලිකන් වැලි ප්‍රදේශය ව්‍යවසායකයින් සඳහා ලොව නමක් දිනාගෙන සිටියි. එහි පුද්ගලයන් කතා බහ කරන්නේ, අහන්නේ දකින්නේ නවෝත්පාදන පිළිබඳවය. මෙම ප්‍රවණතාව සිලිකන් වැලි ෆීවර් ලෙස බෙහෙවින් ප්‍රසිද්ධය. ඉන් ඇඟවෙන්නේ එම ප්‍රදේශයේ ව්‍යවසායකයින් බිහි වීමට උචිත පරිසරයක් ඇති බවයි. අභියෝග සහ අවධානම් බාර ගැනීම ව්‍යවසායකත්වයේ මූලික ලක්ෂණයක් වුවද, බොහෝ ව්‍යවසායකයන්ගේ ගමන් මගට තිත තබන්නේද විවිධාකාර වූ අභියෝගයන්ය.
පවුල් බර, ආගමික විශ්වාස, සංස්කෘතික හා සමාජ සාධක, මනෝවිභීතිය සහ ගතානුගතික බව ඉන් කිහිපයකි.

කෙසේ නමුත් ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා මූලික වශයෙන් පියවර ගත යුත්තේ රජය විසිනි.

- ✓ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,
- ✓ සුළු ව්‍යාපාර නියාමන අධිකාරියක් පිහිටුවීම,
- ✓ කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම,
- ✓ ව්‍යවසායකයින් සඳහා ණය ආරක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීම,
- ✓ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දිරි දීම වැනි ක්‍රියාමාර්ග මගින් රටේ ව්‍යවසායකත්ව ගමන් මග තවත් ස්ථාවර තත්ත්වයකට පත්වනු ලැබේ.

වර්තමානයේ පවතින අති විශාල වූ ණය බරින් නිදහස් වීමට ඇති කාලෝචිතම මාර්ගය පුද්ගලයාව ව්‍යවසායකත්වය කෙරෙහි නැඹුරුව කොට විදේශ විනිමය උපයා ගැනීමයි. එසේම යම් පුද්ගලයකුගේ ජීවිතයේ පවතින සිහින කන්දරාව රැකියාවක් සිදු කර ඉටුකර ගැනීමද ශ්‍රී ලංකාව වැනි රටක සිහිනයකි.



යූ. වී. කේ. එස්. පෙරේරා
මූල්‍ය අධ්‍යයන අංශය
දෙවන වසර



# ජාතික ගිණුම් අමාරුයිද?

උසස්පෙළ ප්‍රශ්න පත්‍රයේ අනිවාර්‍ය ප්‍රශ්නයක් විදියට වගේම බහුවරණ එහෙමත් නැතිනම් MCQ ප්‍රශ්න වලින් අනිවාර්‍යයෙන්ම සැලකියයුතු කොටසක් මේ ජාතික ගිණුම් වලින් ආවරණය වෙනවා. ඉතින් මේ කොටසින් අපි බලමු ජාතික ගිණුම් ගැන මූලිකව හොඳ අවබෝධයක් ලබාගන්න වගේම නිෂ්පාදන ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදනය ගණනය කරන්න.

**ජාතික ගිණුම්කරණය යනු,**

යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ රටේ සියලු ආයතනික ඒකකයන්ගේ කාර්‍යසාධනය, ආර්ථික හැසිරීම හා සමස්ථ ආර්ථික ව්‍යුහයත්, ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රවාහයන්ගේ වටිනාකම ඇස්තමේන්තු කිරීමයි.
ඕනෑම ආර්ථිකයක ප්‍රධාන ආර්ථිකකාරකයන් දෙකක් හෝ කිහිපයක්ම පවතිනවා. සාමාන්‍ය (සංවෘත) ආර්ථිකයක

- ✓ කුටුම්භ අංශය
- ✓ ව්‍යාපාරික අංශය
- ✓ රාජ්‍ය අංශය යන අංශයන්ගෙන් සමන්විත වන අතර, විවෘත ආර්ථිකයේදී එයට විදේශ අංශය එකතු වේ.

**ජාතික ගිණුම්කරණයේ නිෂ්පාදන ඉම හඳුනාගැනීම.**

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනවිට එයට ඇතුලත් කරන හා නොකරන (බැහැර කරන) ක්‍රියාකාරකම් වෙන්කර හඳුනාගැනීමට සිදු වේ. නිෂ්පාදන ඉම සංකල්පය මගින් ආර්ථිකයක පවතින සියලු ක්‍රියාකරකම් ආර්ථික හා ආර්ථික නොවන ලෙස වෙන්කර හඳුනාගැනීමට පදනමක් සපයයි.

**නිෂ්පාදන ඉමට ඇතුලත් වන ක්‍රියාකාරකම්.**

- ✓ අතරමැදි යෙදවුම් (නිෂ්පාදන ක්‍රියාවලිය තුල උපයෝජනය වන සියලු භාණ්ඩ හා සේවා).
- ✓ තමන් පදිංචි වී සිටින තමන් සතු නිවාස වලින් ලැබෙන නේවාසික සේවය.
- ✓ තම අවසන් පරිභෝජනය සඳහා හෝ දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කර නිෂ්පාදකයා තමන් වෙත රඳවාගන්නා සියලුම භාණ්ඩ.
- ✓ තම අවසන් පරිභෝජනය සඳහා හෝ දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කර නිෂ්පාදකයා තමන් වෙත රඳවාගෙන ඇති දැනුම ගබඩා කලහැකි නිෂ්පාදිත හෙවත් බුද්ධිමය දේපළ.
- ✓ වැටුප් ලබන සේවකයන් විසින් සපයන ගෘහ සේවය සහ පෞද්ගලික සේවාවන්.

**නිෂ්පාදන ඉමට ඇතුලත් නොවන ක්‍රියාකාරකම්**

- ☒ තම නිවස (තමන්ට අයත් පදිංචි වී සිටින) පිරිසිදු කිරීම, නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය හා අලංකාර කිරීම.
- ☒ පවුලේ පරිභෝජනය සඳහා ඇති කල්පවත්නා භාණ්ඩ පිරිසිදු කිරීම, පිළිසකර කිරීම හා සේවා කිරීම.
- ☒ ආහාර පිළියෙළකිරීම හා පිළිගැන්වීම.
- ☒ දරුවන් රැකබලා ගැනීම, පුහුණුකිරීම හා උපදෙස් ලබාදීම.
- ☒ නිවසේ සාමාජිකයන් ගේ බඩු භාණ්ඩ සඳහා ප්‍රවාහන සේවා සැපයීම.
- ☒ පවුලේ වියපත් සාමාජිකයන්, ආබාධිත අය සහ රෝගී අය රැකබලා ගැනීම.

**දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product/ GDP)**

යම්කිසි කාලපරිච්ඡේදයක කිසියම් ආර්ථික ප්‍රදේශයක් තුළ නේවාසික ආයතනික ඒකකයන්ගේ පාලනය හා වගකීම යටතේ සිදුකල සියලුම ආර්ථික ක්‍රියාකාරකම් වල එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතය යි. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා පහත යෙදුම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුවීම ඉතා වැදගත් වේ.

**නිෂ්පාදනය** :- යෙදවුම් අවසන් භාණ්ඩ හා සේවා බවට පත් කිරීමේ ක්‍රියාවලියයි.

**නිමවුම්** :- නිෂ්පාදන ක්‍රියාවලිය අවසානයේ බිහිවන භාණ්ඩ හා සේවාවන් වේ.

**නිමවුමේ දළ වටිනාකම (Gross Value of Output/ GVO)** :- නිමවුම් වල මූල්‍යමය වටිනාකම යි.

**ප්‍රාථමික යෙදවුම්** :- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තරව සපයාගන්නා යෙදවුම් (භාණ්ඩ හා සේවා)
උදා:- භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

**අතරමැදි යෙදවුම්** :- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් සපයාගන්නා යෙදවුම් (භාණ්ඩ හා සේවා)
උදා:- අමුද්‍රව්‍ය, විදුලිය, ජලය, ලිපි ද්‍රව්‍ය

**අතරමැදි පරිභෝජනය (Intermediate Consumption/ IC)** :- අතරමැදි යෙදවුම් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගැනීම යි.

**දළ එකතු කළ අගය (Gross Value Added/ GVA)**

සරලවම දළ එකතු කළ අගය යනු, නිමවුමේ දළ වටිනාකම සහ අතරමැදි පරිභෝජනය අතර වෙනසයි. දළ එකතු කළ අගය ප්‍රවේශයන් දෙකක් යටතේ ගණනය කළ හැක.

**01 නිෂ්පාදන මූලාශ්‍රය අනුව**

දළ එකතු කළ අගය (GVA) = නිමවුමේ දළ වටිනාකම (GVO) - අතරමැදි පරිභෝජනය (IC)

**02 ආදායම් මූලාශ්‍රය අනුව**

දළ එකතු කළ අගය (GVA) = ප්‍රාථමික සාධක ආදායම් + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය

දළ එකතු කළ අගය(GVA) = වැටුප්, බදුකුලී, පොලී, ලාභ + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය



**දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම**

දළ දේශීය නිෂ්පාදිතය = සමස්ථ දළ එකතු කළ අගය + ශුද්ධ වක්‍ර බදු

දළ දේශීය නිෂ්පාදිතය = නිෂ්පාදකයන් ගේ මිල යටතේ දළ එකතු කළ අගය + ආනයන මත බදු
සහනාධාර + වැට් බදු

දළ දේශීය නිෂ්පාදිතය = මූලික මිල යටතේ දළ එකතු කළ අගය + ශුද්ධ වක්‍ර බදු

දළ දේශීය නිෂ්පාදිතය = සාධක මිල යටතේ දළ එකතු කළ අගය + ශුද්ධ වක්‍ර බදු

ශුද්ධ දේශීය නිෂ්පාදිතය (NDP) = දළ දේශීය නිෂ්පාදිතය (GDP) - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (CFC)

**ආර්ථික වෘද්ධි අනුපාතිකය යනු,**

එක් වර්ෂයක සිට ඊළඟ වර්ෂය දක්වා භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස් වීම යි.

$$\text{ආර්ථික වෘද්ධි අනුපාතිකය} = \frac{\text{වර්තමාන වර්ෂයේ මූර්ත ද.දේ.නි.} - \text{පෙර වර්ෂයේ මූර්ත ද.දේ.නි.}}{\text{පෙර වර්ෂයේ මූර්ත ද.දේ.නි.}}$$

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය සහ ස්ථාවර මිල යටතේ දළ දේශීය නිෂ්පාදිත වටිනාකම සැසඳීම හරහා දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ගණනය කරයි.

දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය සහ දළ දේශීය නිෂ්පාදිතයේ ආරෝපිත මිල දර්ශකය යනුවෙන් ද දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය හඳුන්වයි

$$\text{දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය} - \frac{\text{පවත්නා මිලට ද.දේ.නි.}}{\text{ස්ථාවර මිලට ද.දේ.නි.}} \times 100$$



ඒ. ආර්. පී. අයි. යූ. පෙරේරා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# චෙක්පත් ගැන ඔබ දැනුවත්ද?

භාරදීමකින් හෝ පිටසන් කරගැනීමකින් එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට අයිතිය පැවරිය හැකි ලියවිලි, ගනුදෙනුකල හැකි ලියවිලි/ උපකරණ ලෙස හඳුන්වයි. ගනුදෙනු කළ හැකි යන්නෙහි අර්ථය වන්නේ හුදු භාරදීමකින් පැවරිය හැකි බවයි. උපකරණ යන්නෙහි අර්ථය වන්නේ ලිඛිත ලියවිල්ලක් බවයි. ගනුදෙනු කළ හැකි උපකරණ සම්බන්ධයෙන් බලපවත්වන ප්‍රධාන නීතිය වන්නේ, 1927 අංක 25 දරන විනිමය පත්‍ර ආඥා පනතයි.

විනිමය පත්‍ර ආඥා පනතේ නෛතික තත්ත්වය මත ගනුදෙනුකල හැකි ලියවිලි හතරක් හඳුනාගත හැකිය. එනම්,

- චෙක්පත්
- විනිමය බිල්පත්
- පොරොන්දු නෝට්ටු
- බැංකු අණකර

එසේ වුවද, ගනුදෙනු කළ හැකි ගති ලක්ෂණ සහිත වෙනත් ලියවිලි ගනුදෙනුකල හැකි ලියවිලි ගණයට ඇතුළත් කිරීමට නීතියෙන් ඉඩකඩ සැලසී ඇතත් ඒවා සම්ප්‍රදාය හෝ භාවිතය මත හඳුනාගත හැකි ගනුදෙනු කලහැකි ලියවිලි වේ. ඒවා නම්,

- වාණිජ පතිකා
- ලාභාංශ බලපත්‍ර
- ණයකර
- කොටස් බලපත්‍ර
- නෞභාරපත්‍ර

**ගනුදෙනුකල නොහැකි ලියවිලි ලෙස,**

- මුදල් ඇණවුම
- සංචාරක චෙක්පත්
- ගෙවුම් ඇණවුම දැක්විය හැකිය.

**ගනුදෙනු කලහැකි ලියවිල්ලක පැවතිය යුතු ගති ලක්ෂණ කිහිපයකි.**

- පහසුවෙන් පැවරිය හැකි වීම්
- හිමිකම සම්බන්ධයෙන් පැවරුම්ලාභියාට නීත්‍යානුකූල හිමිකමක් ලැබීම.
- ලියවිල්ලට අදාල වටිනාකම ලබා ගැනීමට නීතිමය ලියවිල්ලක් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.

නම සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන්නාට සඳහන් මුදල ගෙවන ලෙස වාණිජ බැංකුවක් වෙත ලිඛිතව අණකරමින් ජංගම ගිණුම් හිමියකු විසින් ඉදිරිපත් කරන නියෝගය චෙක්පතක් ලෙස හඳුන්වයි. විනිමය බිල් ආඥා පනතට අනුව චෙක්පත් යනු බැංකුකරුවකු වෙත අණකෙරුනු, ඉල්ලූ විට ගෙවිය යුතු විනිමය බිලක්, ලිඛිත උපකරණයක් හෝ කොන්දේසි විරහිත ලිඛිත නියෝගයකි. වර්තමාන චෙක්පතක සම්මත ප්‍රමාණය දිග අඟල් 7 ක් සහ පළල අඟල් 3.5 ක් වේ.

චෙක්පතක අනිවාර්යෙන්ම තිබිය යුතු මූලිකාංග කිහිපයකි.

1 දිනය
2 බැංකුව සහ ශාඛාවේ නම (අණලදු)
3 ධාරක චෙක්පතක්ද විධාන චෙක්පතක්ද යන වග
4 ආදායකයාගේ නම
5 මුදල ඉලක්කමින්
6 මුදල අකුරින්
7 අණකරු ගේ අත්සන
8 චෙක්පත් අංකය
9 බැංකුවේ අංකය
10 ශාඛාවේ අංකය
11 ගිණුම් අංකය
12 චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් කලාපය
13 පිළිපත




**චෙක්පත සම්බන්ධ ප්‍රධාන පාර්ශව තුනකි.**

1 ආදායකයා - චෙක්පතෙහි සඳහන් මුදල ලැබිය යුතු පාර්ශවය. එනම්, චෙක්පත් මුහුණතෙහි නම සඳහන් පුද්ගලයා.
2 අණකරු - චෙක්පත ලියා අත්සන් කරන ජංගම ගිණුම් හිමියා.
3 අණලදු - ජංගම ගිණුම පවත්වාගෙන යන බැංකුව.

චෙක්පත් මුහුණතේ ඉහළ අණලද බැංකුවේ නම සහ ලිපිනය මුද්‍රණය වී ඇති අතර අණකරු විසින් ලියා අණලද බැංකුවට අදාල චෙක්පතකට අණකරුගේ ජංගම ගිණුමෙන් හර කරගෙන ආදායකයාට හෝ රැගෙන එන්නාට මුදල් ගෙවීමට වාණිජ බැංකුව බැඳී සිටියි.

චෙක්පත් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. එනම්:

**1 ධාරක / භාරක චෙක්පත්**

චෙක්පත දරන්නාට අයිතිය හිමිවන, භාරදීමකින් පැවරිය හැකි චෙක්පත් ධාරක චෙක්පත් ලෙස හඳුන්වයි. එනම් රැගෙන එන ඕනෑම කෙනෙකු බැංකුවට ඉදිරිපත් කළ විට ඔහුට මුදල් ගෙවීමට බැංකුව බැඳී සිටියි. ආදායකයාගේ නම වෙනුවට 'මුදල්' යන වචනය ලියා තිබීම හෝ ආදායකයාගේ නම ලියා 'හෝ රැගෙන එන්නාට' යන වචනය මුද්‍රණය වී තිබීම හෝ අවසාන පිටසන හිස් පිටසනකින් යුතුව ඇති චෙක්පත් ධාරක චෙක්පත් ලෙස හඳුනාගත හැකිය.

**2 විධාන / ඇණවුම් චෙක්පත්**

ආදායකයාට හෝ ඔහුගේ විධානයට පමණක් මුදල් ගෙවන චෙක්පත් විධාන චෙක්පත් ලෙස හඳුන්වයි. එනම් චෙක්පතේ නම සඳහන් පුද්ගලයාට හෝ ඔහු විධාන කරන වෙනත් පුද්ගලයකුට පමණක් මුදල් ගෙවීමට බැංකුව බැඳී සිටියි. විධාන චෙක්පතක් නම සඳහන් පුද්ගලයා විසින් වෙනත් පුද්ගලයෙකුට පවරන්නේ නම් පිටසන් කිරීම අවශ්‍ය වන අතර, ඒ අනුව විධාන චෙක්පතක් ධාරක චෙක්පතකට වඩා ආරක්ෂාකාරී බවින් වැඩිය. 'හෝ අණට' යන වචන මුද්‍රණය වී තිබේනම්, 'හෝ රැගෙන එන්නාට' යන මුද්‍රිත වචන කපා හැර තිබේනම්, එය විධාන චෙක්පතක් ලෙස හඳුනාගත හැකිය.



වංචනික ක්‍රියාවන් සිදුවීම හා චෙක්පත් අගරුවීම වළක්වා ගැනීම සඳහා චෙක්පතක් ලිවීමේදී අණකරුවකු සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

- චෙක්පත් දිනය ජාත්‍යන්තර සම්මතයට අනුව ලිවීම.
- චෙක්පත් වටිනාකම ඉලක්කමෙන් හා අකුරෙන් වෙනස් කළ නොහැකි ලෙස ලිවීම.
- ආදර්ශ අත්සන නිවැරදිව යෙදීම.
- චෙක්පත් ලිවීමේදී වරදක් සිදුවුවහොත් එය තනි ඉරකින් කපා නිවැරදි කර ඒ සඳහා ආදර්ශ අත්සන යෙදීම්
- හිස් චෙක්පත් අත්සන් කර තැබීමෙන් වැළකීම.
- චෙක්පත් සාරාංශය පිලිපත තුළ ඇතුළත් කිරීම.
- මුදල් චෙක්පත් ලිවීම හැකිතාක් අවම කිරීම.

චෙක්පතක් පැවරීමේ දී චෙක්පතේ මුහුණත නම සඳහන් ආකාරයටම චෙක්පත පිටුපස ආදායකයාගේ නම ලිවීම පිටසන් කිරීම ලෙස හඳුන්වයි. චෙක්පතේ අයිතිය පැවරීම හෙවත් අයිතිය අහෝසි කිරීම, චෙක්පතක් පිටසන් කිරීමේ අරමුණයි.

**චෙක්පත් පිටසන් කිරීමේදී යොදා ගන්නා පිටසන් වර්ග කිහිපයකි.**

**1 හිස් පිටසන**

චෙක්පතෙහි ආදායකයා විසින් මුහුණත නම සඳහන් ආකාරයටම චෙක්පත පිටුපස ආදායකයාගේ නම සඳහන් කිරීම හිස් පිටසනයි. අවසාන පිටසන හිස් පිටසනක් නම් එය ධාරක චෙක්පතක් වන බැවින් කවරෙකුට වුවද මුදල් ලබාගත හැකිය. හිස් පිටසනක් සහිත චෙක්පතක් තවදුරටත් පැවරිය හැකිය.

**2 විශේෂ පිටසන**

නිශ්චිත පුද්ගලයෙකුට හෝ ඔහුගේ විධානයට (අණට) ගෙවිය යුතු බව සඳහන් කරමින් කරනු ලබන පිටසන විශේෂ පිටසනක් ලෙස හඳුන්වයි. විශේෂ පිටසනක් සහිත චෙක්පත් තවදුරටත් පැවරිය හැකි වේ.

**3 සීමාකාරී පිටසන**

නිශ්චිත පුද්ගලයකුට පමණක් මුදල් ගෙවන ලෙස සඳහන් කරමින් මුහුණත නම සඳහන් ආකාරයටම ආදායකයාගේ නම චෙක්පත පිටුපස ලිවීම සීමාකාරී පිටසන ලෙස හඳුන්වයි. සීමාකාරී පිටසනක් යෙදූ විට ඉන් ඉදිරියට චෙක්පත පැවරිය නොහැක. එනම්, තවදුරටත් ගනුදෙනු කිරීම වැළකේ. මෙය වඩා ආරක්ෂාකාරී වේ.

චෙක්පත් පිටසන් කරන අවස්ථා ලෙස විධාන චෙක්පත් තවත් පාර්ශවයකට පැවරීමේදී, චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීමේදී, සහ චෙක්පතක් බැංකු ගිණුමක තැන්පත් කිරීමේ දී, යන අවස්ථා හඳුනාගත හැකිය.

චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම චෙක්පත් රේඛණය ලෙස හඳුන්වයි. සරල සමාන්තර රේඛා දෙකක් සහිතව හෝ රහිතව බැංකුවක නමක් සඳහන් කිරීමෙන්ද චෙක්පත් රේඛනය කළ හැකිය.

බැංකු කවුන්ටරයෙන් සෘජුවම මුදල් ගැනීම වලක්වා චෙක්පතට ආරක්ෂාවක් සැපයීම නැතහොත් චෙක්පතේ ආදායකයාට එහි සඳහන් මුදල නියත වශයෙන්ම ලැබීම සහතික කිරීම චෙක්පත් රේඛනය කිරීමේ ප්‍රධාන අරමුණයි.



**ප්‍රධාන රේඛන වර්ග දෙකකි.**

**1 සාමාන්‍ය රේඛනය**

විවිධ පද සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා සරල හා සමාන්තර රේඛා දෙකක් යෙදීම සාමාන්‍ය රේඛණයයි. එම රේඛා දෙක අතර බැංකුවක නමක් හැර වෙනත් ඕනෑම සම්මත ප්‍රකාශනයක් යෙදිය හැක.

**2 විශේෂ රේඛනය**

සරල සමාන්තර රේඛා දෙකක් සහිතව හෝ රහිතව බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය ලෙස හඳුන්වයි. සමාන්තර රේඛා දෙකක් අතර බැංකුවක නමක් සහිතව වෙනත් ඕනෑම සම්මත ප්‍රකාශනයක් යෙදිය හැකි අතර විශේෂ රේඛනයක අත්‍යවශ්‍ය සාධකය වන්නේ චෙක්පතේ මුහුණත වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීමයි.

රේඛනයක් අන්තර්ගත නොවන චෙක්පත් "විවෘත චෙක්පත්" ලෙස හඳුන්වයි. එනම් අණලත් බැංකුවේ බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකි චෙක්පත්ය. රේඛනයක් අන්තර්ගත චෙක්පත් "සංවෘත චෙක්පත" ලෙස හඳුන්වයි. මෙම චෙක්පත් මුදල් කරගත හැක්කේ බැංකු ගිණුමක තැන්පත් කිරීමෙන් පමණි. රේඛිත චෙක්පතක් ලබාගත් පුද්ගලයකුට එය බැංකු ගිණුමක තැන්පත් කිරීම, අණකරු ලවා රේඛනය අවලංගු කරවාගැනීම හෝ "ආදායකයාගේ ගිණුමට පමණි" යන රේඛනය හැර වෙනත් රේඛනයක් පවතින විට පිටසන් කර පැවරීම සිදුකළ හැකිය.

චෙක්පතක් රේඛනය කල හැකි පාර්ශව වන්නේ අණකරු, ධාරකයා (ආදායකයා හෝ පැවරුම්ලාභියා) හෝ අය රැස්කරන බැංකුව පමණි. චෙක්පතක රේඛනය අවලංගු කිරීමේ බලය ඇත්තේ අණකරුට පමණි. රේඛනය අවලංගු කිරීමේ දී චෙක්පත මුහුණතෙහි "රේඛනය අවලංගු කරන ලදී" යනුවෙන් සඳහන් කොට අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතුය. නමුත් අය රැස්කරන බැංකුවටද තමන් විසින් කරන ලද රේඛනයක් අවලංගු කළ හැකිය.

චෙක්පතක් රේඛනය කිරීමෙන් අණකරුට ලැබෙන වාසි ලෙස හඳුන්වාදිය හැක්කේ චෙක්පතකට ආරක්ෂාවක් ලැබීම, චෙක්පත අතින් අතට මාරුවීම, සීමාවීම සහ චෙක්පතට මුදල් ගෙවීම, ගිණුමක් හරහා සිදුවන බැවින් යම් වංචාවක් සිදු වුවහොත් එය අනාවරණය කර ගැනීමට පහසු වීමය.

"ආදායකයාගේ ගිණුමට පමණයි" යනුවෙන් ලියා විශේෂ රේඛනය කිරීමෙන් චෙක්පතට උපරිම ආරක්ෂාවක් ලබා දිය හැකිය.

චෙක්පතක වලංගු කාලය නිශ්චිතවම සඳහන් කර ඇත්නම් එය වලංගු කාලය වන අතර, නිශ්චිතව සඳහන් කර නොමැතිනම් චෙක්පත් දිනයේ සිට මාස හයක කාලයක් චෙක්පත වලංගු වේ. නමුත් චෙක්පත් දිනයේ සිට වසර හයක් දක්වා චෙක්පත සම්බන්ධයෙන් නීතිය ඉදිරියට යාමේ හැකියාව ඇති බැවින් චෙක්පතක නෛතික වලංගු කාලය වසර හයකි. නිශ්චිතව සඳහන් වලංගු කාලය හෝ චෙක්පත් දිනයේ සිට මාස හයක් ඉක්මවූ චෙක්පත් "යල් පැනගිය චෙක්පත්" ලෙස හඳුන්වයි. යල්පැනගිය චෙක්පතක් ඇති ධාරකයෙකුට අණකරු ලවා කාලය දීර්ඝ කරවාගැනීම හෝ නව චෙක්පතක් ලියවාගැනීම සිදුකළ යුතු අතර එය කළ නොහැකි වුවහොත් තම මුදල් අයකරගැනීමට චෙක්පතෙහි නෛතික වලංගු කාලය වන වසර හයක් තුළ නීතිය ඉදිරියට යාමේ හැකියාව පවතියි.

චෙක්පතක් අස්ථානගතවීම කිසියම් වංචනික ක්‍රියාවක් සිදුවීම හෝ වෙනත් සාධනීය හේතුවක් මත කිසියම් චෙක්පතකට ගෙවීම් සිදුනොකරන ලෙස අණකරුට බැංකුවෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකළ හැකිය. එවැනි චෙක්පත් "ගෙවීම් නතර කළ චෙක්පත්" ලෙස හඳුන්වයි. චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කර ඒ වෙනුවෙන් අදාල මුදල් වටිනාකම ලබා ගත් පසු එය "අවලංගු චෙක්පත්" ලෙස හඳුන්වයි.

අන්තර් බැංකු චෙක්පත් තුලනය කිරීම "චෙක්පත් නිෂ්කාශනය" නම් වේ. චෙක්පතේ සඳහන් මුදල අදාළ බැංකු ගිණුම් හර හා බැර වීම තුළින් ගනුදෙනුව පියවේ. වර්තමානයේදී චෙක්පත් නිෂ්කාශන කරනුයේ ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන ක්‍රමය යටතේය. නිෂ්කාශන සඳහා භෞතික චෙක්පත යැවීම වෙනුවට පරිගණක තාක්ෂණය ඔස්සේ එහි ඉදිරිපස හා පිටුපස ඡායාගත කරන ලද පිළිබිඹුව නිෂ්කාශන ආයතනය වෙත යැවීම සිදු කරයි. පරිගණක ආශ්‍රිතව දත්ත යැවීම හා ගබඩා කිරීමේ ඉඩකඩ අවම වන පරිදි මෙම චෙක්පත් සකස් කර තිබීම මෙහි විශේෂත්වයයි.

වාණිජ බැංකු අතර ගනුදෙනු වන චෙක්පත් නිෂ්කාශනය කරනු ලබන ආයතනය "ලංකා ක්ලියර් පුද්ගලික සමාගම" ලෙස හඳුන්වයි. මෙහි හිමිකාරීත්වය පෞද්ගලික අංශයේ වාණිජ බැංකුවලට 52% සහ ශ්‍රී ලංකා මහ බැංකුව හා රජයේ බැංකුවලට 48% ලෙස පවතී.

චෙක්පත දරන්නා විසින් බැංකුවට ඉදිරිපත් කිරීමේදී බැංකුව විසින් එය ප්‍රතික්ෂේප කරයිනම්, එය චෙක්පතක් අගරුවීම ලෙස හඳුන්වයි. චෙක්පතක් අගරුවීමට බලපාන හේතු ගණනාවකි.

- මතුදාතම චෙක්පතක් වීම.
- යල්පැනගිය චෙක්පතක් වීම.
- ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම.
- අණකරු විසින් ගෙවීම් නතර කර තිබීම.
- චෙක්පත විකල වීම්
- වටිනාකම ඉලක්කමෙන් සහ අකුරෙන් සමාන නොවීම.
- අණකරුගේ ආදර්ශ අත්සන සමඟ නොගැලපීම.

චෙක්පතක් අගරු වීමෙන් අණකරුට අයහපත් ප්‍රතිඵල රැසක් අත්විඳීමට සිදුවේ. ගනුදෙනුකරුවන් සහ බැංකුව අණකරු වෙත තැබූ විශ්වාසය බිඳී යයි. අගරු ගාස්තු ගෙවීමට සිදුවේ. බැංකුවෙන් ලබා දෙන අයිරා සහ වෙනත් පහසුකම් සඳහා ගැටලු ඇතිවේ. එමෙන්ම දිගින් දිගටම චෙක්පත් අගරු වුවහොත් අණකරුගේ ගිණුම වසා දැමීමට බැංකුව පියවර ගනී.

ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන ක්‍රමය යටතේ චෙක්පතක් අගරු වූ විට චෙක්පත වෙනුවට චෙක්පත තැන්පත් කළ ගනුදෙනුකරුට ලබාදෙන දැනුම්දීමේ නිවේදනය අගරු චෙක්පත් නිවේදනය ලෙස හඳුන්වයි. අගරු චෙක්පත් නිවේදනයක් සතු ධාරකයෙකු හට නැවත වතාවක් මුදල් ලබාගැනීම සඳහා එය බැංකුවට ඉදිරිපත් කිරීම, පැවරුම්කරුට ඉදිරිපත් කර ඒ වෙනුවෙන් නව චෙක්පතක් ලබා ගැනීම හෝ චෙක්පත සම්බන්ධයෙන් නඩු පැවරීම යන ක්‍රියාමාර්ග ගත හැකිය.

චෙක්පතකින් ගෙවිය හැකි උපරිම මුදල පිළිබඳ නියමයන් පවතී. එකම බැංකුවේ චෙක්පතක් සම්බන්ධයෙන් ඕනෑම වටිනාකමක් දක්වා චෙක්පතක් ලිවිය හැකි නමුත් ලංකා ක්ලියර් පුද්ගලික සමාගමේ නිෂ්කාශන පහසුකම් යටතේ ගෙවීම් කළ හැකි වන්නේ ඉලක්කම් දහයකින් සමන්විත උපරිම වටිනාකමක් දක්වා පමණි. ඉන් ඉලක්කම් දෙකක් දශමස්ථාන සඳහා වෙන්වේ.

ඒ අනුව චෙක්පතකින් ගෙවීම් කලහැකි උපරිම මුදල රුපියල් නවකෝටි අනූනව ලක්ෂ අනූනව දහස් නවසිය අනූ නවයයි ශත අනූ නවයක් (රු99,999,999.99) පමණි.



I.H.කවීෂ ඉද්දගොඩ
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සංකීර්ණ LKAS 16 සරලව ඉගෙන ගනිමු

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16:දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ වලට අදාළ ගිණුම්කරණ ප්‍රමිතයේ අරමුණ වන්නේ, ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇල්මැති පාර්ශව වෙත සත්‍ය හා සාධාරණ ලෙස තොරතුරු සන්නිවේදනය කිරීමේදී ඉතා වැදගත් වන දේපළ පිරියත හා උපකරණ සම්බන්ධව ඒවා හඳුනා ගැනීමේ, මැනීමේ හා වාර්තා කිරීමේ ගැටලු හා සංකීර්ණතා වලදී අවශ්‍ය මග පෙන්වීම් ඉදිරිපත් කිරීමයි.

දේපළ පිරියත හා උපකරණ ප්‍රමිතයට අදාළ නිර්වචන හඳුනා ගනිමු.

| | | |
|---|---|---|
| **දේපළ පිරියත හා උපකරණ** | : | භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට, බෙදාහැරීමට, පරිපාලනමය කාර්යයන් සඳහා හෝ අන්අයට කුලියට දීම සඳහා තබා ගන්නා එසේම එක් ගිණුම් කාලච්ඡේදයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂිත වත්කම් වේ. |
| **වත්කමක පිරිවැය** | : | වත්කමක් අත්පත් කරගත් අවස්ථාවේදි හෝ අදාළ වත්කම ඉදිකරන ලද අවස්ථාවේදී එය අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම වෙනුවෙන් ගෙවන ලද හෝ ගෙවීමට එකඟ වූ මුදල් හෝ මුදල් සමාන දෑ හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක සාධාරණ වටිනාකම වේ. |
| **ක්ෂයවීම්** | : | වත්කම ක්ෂය කළ හැකි අගය එම වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමවත් ලෙස විභාජනය කිරීම (ලියාහැරීම) වේ. |
| **ක්ෂය කළ හැකි අගය** | : | වත්කමක පිරිවැය හෝ පිරිවැය වෙනුවට හඳුනාගෙන ඇති හෝ ආදේශ කර ඇති අගයෙන් සුන්බුන් අගය / අවශේෂ වටිනාකම අඩුකළ පසු අගය වේ. |
| **ධාරණ වටිනාකම** | : | වත්කමක පිරිවැයෙන් හෝ ප්‍රත්‍යාගණිත අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන අලාභ කිරීමෙන් පසු ලැබෙන අගයයි. |
| **සාධාරණ අගය** | : | වෙළෙඳපොළ සහභාගිකරුවන් අතර සිදුවන විධිමත් ගනුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගය හෝ වගකීමක් බේරුම් කරගත හැකි අගය වේ. |
| **ඵලදායි ජීවකාලය** | : | ව්‍යාපාරය විසින් වත්කම නියමිත තත්ත්වයෙන් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලය වේ. |
| **අවශේෂ වටිනාකම / සුන්බුන් අගය** | : | වත්කමක දැනටමත් වයසින් හා තත්ත්වයෙන් ජීවිත කාලය අවසානයේ පවතියයි අපේක්ෂිත තත්ත්වයට පත්ව ඇත්නම් එය ඉවත් කිරීමෙන් ලබාගත හැකි යැයි ඇස්තමේන්තුගත වටිනාකමෙන් වත්කම ඉවත්කිරීමට (අපහරණයට) දැරීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයයි. |

දේපළ පිරියත හා උපකරණ අයිතම වත්කම් ලෙස හඳුනා ගැනීමේදී පහත කොන්දේසි සම්පූර්ණ විය යුතුය.

1 අයිතම හා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ අනාගතයේදී ව්‍යාපාරය තුළට ගලාඒමේ හැකියාවක් තිබීම.
2 ව්‍යාපාරය විසින් එම වත්කම් වෙනුවෙන් දරන ලද පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි වීම.

ව්‍යාපාරය විසින් දේපළ පිරියත හා උපකරණ සඳහා දරනු ලබන පිරිවැය වර්ග 2කි.

## 1 මුල්වරට දරන පිරිවැය

අදාළ වත්කම අත්පත් කරගැනීමට හෝ මිලදී ගැනීමට මුල්වරට දරන ලද වියදම වේ.
මෙම වියදම් අදාළ වත්කමේ අපේක්ෂිත භාවිතය සඳහා පත්කරන තෙක් අනිවාර්යයෙන් දැරිය යුතුය.
එමනිසා මෙවැනි වියදම් වත්කම් සේ සලකා ප්‍රාග්ධනිත කළ යුතුය.

## 2 පසුකාලීන පිරිවැය

දේපළ පිරියත හා උපකරණ අත්පත් කරගත් පසු දරන වියදම් වර්ග 2කි.

i. ප්‍රාග්ධන වියදම්

වත්කමේ ඵලදායි ජීවිත කාලය, ධාරිතාව (පරිමාණය) හෝ නිෂ්පාදන භාණ්ඩවල ගුණත්වය වැඩි කරලීමට හෝ නිෂ්පාදන වියදම අඩු කරලීමට උපකාරී වන නවීකරණයක් හෝ උපාංගයක් සවිකිරීමට දරන ලද වියදම් වන අතර මෙවැනි වියදම් වත්කම් ගිණුමට හර කළ යුතුය.

ii. අයභාර වියදම්

අදාළ වත්කම් නිසි ලෙස පවත්වාගෙන යාමට දරන මෙවැනි වියදම් ලාභාලාභ ගිණුමට හර කෙරේ.

දේපළ පිරියත හා උපකරණ මිනුම්කරණය පහත ගැලීම් සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කර ගනිමු.




## <u>වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම් තැබීම</u>

වත්කම් ප්‍රත්‍යාගණනයේදී, සමුච්චිත ක්ෂය වත්කමේ දළ ධාරණ අගයට එරෙහිව අහෝසි කර, ප්‍රත්‍යාගණිත අගය වත්කමේ ධාරණ අගය ලෙස සලකනු ලබයි.

### මුල්වරට ප්‍රත්‍යාගණනය කිරීම

- ✓ මෙහිදී ප්‍රත්‍යාගණන ලාභයක් ඇති වුවහොත් එනම්, වත්කමේ ධාරණ අගයට වඩා ප්‍රත්‍යාගණිත අගය වැඩි වුවහොත්,

1 ප්‍රත්‍යාගණන කරන දින දක්වා සමුච්චිත ක්ෂය අදාළ ගිණුම් වලින් ඉවත් කළ යුතුය.

| | |
|---|---|
| අදාළ වත්කමේ සමුච්චිත ක්ෂය ගිණුම | හර xx |
| අදාළ වත්කම් ගිණුම | බැර xx |

2 ඉන්පසුව ප්‍රත්‍යාගණන ලාභය ගිණුම් තැබිය යුතුය.

| | |
|---|---|
| අදාල වත්කම් ගිණුම | හර xx |
| ප්‍රත්‍යාගණන සංචිත ගිණුම (වෙනත් විස්තීරණ ආදායම්) | බැර xx |

✓ මෙහි දී ප්‍රත්‍යාගණන අලාභයක් ඇති වුවහොත් එනම්, වත්කමේ ධාරණ අගයට වඩා ප්‍රත්‍යාගණිත අගය අඩු වුවහොත්,

1 ප්‍රත්‍යාගණන කරන දින දක්වා සමුච්චිත ක්ෂය අදාළ ගිණුම් වලින් ඉවත් කළ යුතුය.

| | |
|---|---|
| අදාල වත්කමේ සමුච්චිත ක්ෂය ගිණුම | හර xx |
| අදාල වත්කම් ගිණුම | බැර xx |

2 ඉන්පසුව ප්‍රත්‍යාගණන අලාභය ගිණුම් තැබිය යුතුය.

| | |
|---|---|
| ප්‍රත්‍යාගණන අලාභය (ලාභාලාභ ගිණුමේ වෙනත් වියදම්) | හර xx |
| අදාල වත්කම් ගිණුම | බැර xx |

**උදා (01) :**

ඒ බී සී සමාගමේ 2021-03-31 දිනට මෝටර් රථවල පිරිවැය රු. 500,000 කි. එදිනට මෙම වත්කමේ සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු 200,000 කි. මෙදින සිදුකළ පළමුවර ප්‍රත්‍යාගණනයට අනුව මෝටර් රථ රු 400,000 කට ප්‍රත්‍යාගණනය කළේ නම් ඊට අදාළ ද්විත්ව සටහන් වනුයේ,

| | |
|---|---|
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම | හර 200,000 |
| මෝටර් රථ ගිණුම | බැර 200,000 |
| (මෝටර් රථවල සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් කිරීම) | |

| | |
|---|---|
| මෝටර් රථ ගිණුම | හර 100,000 |
| ප්‍රත්‍යාගණන සංචිත / වෙනත් විස්තීරණ ආදායම් | බැර 100,000 |
| (මෝටර් රථ ප්‍රත්‍යාගණන ලාභය ගිණුම් තැබීම) | |

මෙහිදී ප්‍රත්‍යාගණන ලාභය / අලාභය ගණනය කරනුයේ වත්කමේ ප්‍රත්‍යාගණිත අගයෙන් ප්‍රත්‍යාගණය කළ දිනට අදාළ වත්කමේ ධාරණ අගය (පිරිවැය - සමුච්චිත ක්ෂය) අඩු කිරීමෙනි.

ඉහත උදාහරණයම සැලකිල්ලට ගෙන 2021.03.31 සිදුකළ මෝටර් රථ ප්‍රත්‍යාගණිත අගය රු.200,000 ක් වුවහොත් ඊට අදාළ ද්විත්ව සටහන් වනුයේ,

| | |
|---|---|
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම | හර 200,000 |
| මෝටර් රථ ගිණුම | බැර 200,000 |
| (මෝටර් රථයේ සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කිරීම) | |

| | |
|---|---|
| ලාභාලාභ ගිණුම (වෙනත් වියදම්) | හර 100,000 |
| මෝටර් රථ ගිණුම | බැර 100,000 |
| (මෝටර් රථයේ ප්‍රත්‍යාගණන අලාභය) | |

**නැවත ප්‍රත්‍යාගණනය කිරීම**

පෙර වසරක ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ පිරියත හා උපකරණ අයිතමයක් දෙවන වර ප්‍රත්‍යාගණනයේදී ගිණුම් තැබීම උදාහරණයක් ඇසුරින් සාකච්ඡා කරමු.

**උදා 02 :-**

ව්‍යාපාරයක ගොඩනැගිල්ලක් මුල්වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු 500,000 ක ලාභයක් ලබා ඇත.
මෙම ගොඩනැගිල්ල නැවත ප්‍රත්‍යාගණනය කිරීමේදී රු 300,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදු වූයේ නම්,

| | |
|---|---|
| ප්‍රත්‍යාගණන සංචිත ගිණුම (වෙනත් විස්තීරණ ආදායම්) | හර 300,000 |
| ගොඩනැගිලි ගිණුම | බැර 300,000 |

ලෙස ප්‍රත්‍යාගණන අලාභය ගිණුම් තබයි.

මෙම ගොඩනැගිල්ල නැවත ප්‍රත්‍යාගණනයෙන් රු. 800,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදු වුවහොත්,

| | |
|---|---|
| ප්‍රත්‍යාගණන සංචිත (වෙනත් විස්තීරණ ආදායම්) | හර 500,000 |
| ලාභාලාභ ගිණුම (වෙනත් වියදම්) | හර 300,000 |
| ගොඩනැගිලි ගිණුම | බැර 800,000 |

ලෙස ප්‍රත්‍යාගණන අලාභය ගිණුම් තැබිය යුතුය. මෙහිදී පෙර ඇතිවූ ලාභයේ අගය දෙවනවර ඇති වූ අලාභය සමඟ හිලවු කිරීමක් සිදුවේ.

මෙම ගොඩනැගිල්ල නැවත ප්‍රත්‍යාගණනයෙන් රු. 500,000 ක ප්‍රත්‍යාගණන ලාභයක් ඇති වුවහොත්

| | |
|---|---|
| ගොඩනැගිලි ගිණුම | හර 500,000 |
| ප්‍රත්‍යාගණන සංචිත (වෙනත් විස්තීරණ ආදායම්) | බැර 500,000 |

ලෙස ප්‍රත්‍යාගණන ලාභය ගිණුම් තැබිය යුතුය.

**උදා 03 :-**

ව්‍යාපාරයක මෝටර් රථ පෙර වසරක ප්‍රත්‍යාගණනයෙන් රු. 200,000 ප්‍රත්‍යාගණන අලාභයක් ලබා ඇත.
මෙම වසරේ මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් රු. 100,000 ක ප්‍රත්‍යාගණන ලාභයක් සිදු වුවහොත්,

| | |
|---|---|
| මෝටර් රථ ගිණුම | හර 100,000 |
| ලාභාලාභ ගිණුම (වෙනත් වියදම්) | බැර 100,000 |

ලෙස ප්‍රත්‍යාගණන ලාභය ගිණුම් තැබිය යුතුය. මෙහිදී පෙර වසරේ සිදුවූ ප්‍රත්‍යාගණන අලාභයේ අගයට මෙම වසරේ ප්‍රත්‍යාගණන ලාභය හිලවු කිරීමක් සිදුවන නිසා වෙනත් වියදම් (ආදායම් ප්‍රකාශනය) අඩුවේ.
මෙම වසරේ මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් රු. 300,000 ක ප්‍රත්‍යාගණන ලාභයක් ඉපයුවේ නම්,

| | |
|---|---|
| මෝටර් රථ ගිණුම | හර 300,000 |
| ලාභාලාභ ගිණුම (වෙනත් වියදම්) | බැර 200,000 |
| ප්‍රත්‍යාගණන සංචිත (වෙනත් විස්තීරණ ආදායම්) | බැර 100,000 |

ලෙස ප්‍රත්‍යාගණන ලාභය ගිණුම් තැබිය යුතුය.

මෙම වසරේ මෝටර් රු 50,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදු වුවහොත්,

| | |
|---|---|
| ලාභාලාභ ගිණුම(වෙනත් වියදම්) | හර 50,000 |
| මෝටර් ගිණුම | බැර 50,000 |

ලෙස ප්‍රත්‍යාගණන අලාභය ගිණුම් තැබිය යුතුය.

## <u>දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම</u>

- ✓ ව්‍යාපාරයක් සරල මාර්ග ක්‍රමයට හෝ හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලබයි.
- ✓ ගිණුම් කාලච්ඡේදයක ආරම්භයේ සිට අවසානය දක්වා පවතින වත්කම් එම වසරේ ආරම්භයේ සිට අවසානය දක්වා ක්ෂය කළ යුතුය. (එනම් මුළු වසරටම ක්ෂය ගණනය කළ යුතුය)

**උදා 04 :-**

ව්‍යාපාරයේ යන්ත්‍ර පිරිවැය රු. 500,000 කි. ව්‍යාපාරය එම යන්ත්‍රය 10% සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි නම් 2021.03.31 න් අවසන් වසර සඳහා වාර්ෂික ක්ෂය වනුයේ,

වාර්ෂික ක්ෂය = 500,000 x 10%
= රු 50,000

මෙම වාර්ෂික ක්ෂය ගිණුම් තැබීමේ ද්විත්ව සටහන වනුයේ,

| | |
|---|---|
| යන්ත්‍ර ක්ෂය ගිණුම (ලාභාලාභ ගිණුම) | හර 50,000 |
| යන්ත්‍ර ක්ෂය වෙන්කිරීමේ ගිණුම | බැර 50,000 |

✓ ගිණුම් කාලච්ඡේදය තුළදී කිසියම් වත්කමක් මිළට ගත්තේ නම් අදාළ වත්කම මිළදී ගත් දින සිට ගිණුම් කාලච්ඡේදය අවසානය දක්වා ගණනය කෙරේ.

**උදා 05 :-**

2021.06.30 දින ව්‍යාපාරයක් රු. 500,000 කට යන්ත්‍රයක් මිළදී ගන්නේ නම් 2021.03.31 න් අවසන් වසර සඳහා වත්කමට අදාල වාර්ෂික ක්ෂය වනුයේ, (ක්ෂය අනුපාතය 10% කි)

වාර්ෂික ක්ෂය = 500,000 × 10% x (9/12) ——— වත්කම අදාළ වර්ෂයේ ව්‍යාපාරය තුළ පවත්නා මාස ගණන

= රු 37,500

ගිණුම් කාලච්ඡේදය තුල කිසියම් වත්කමක් ඉවත් කළහොත් වසර ආරම්භක දින සිට වත්කම ඉවත් කරන දින තෙක් ක්ෂය ගණනය කරනු ලබයි.

**උදා 06 :-**

2020.10.01 දින ව්‍යාපාරය රු 500,000 කට යන්ත්‍රයක් විකුණුවේ නම් (ක්ෂය අනුපාතය 10%) එම වත්කමේ වාර්ෂික ක්ෂය වනුයේ,

වාර්ෂික ක්ෂය = 500,000 x 10% x (6/12) ——— වත්කම අදාළ වර්ෂයේ ව්‍යාපාරය තුළ පවත්නා මාස ගණන

**<u>දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීම</u>**

කිසියම් වත්කමක් විකිණීමේදී හෝ හානිවීම නිසා සිදුකරන ඉවත් කිරීමක දී හෝ වත්කමක් වෙනත් වත්කමක් සමග හුවමාරු කිරීමේ දී අනුගමනය කළ යුතු ගිණුම් තැබීමේ ක්‍රමවේදයන් පහත පරිදි වේ.

1. වත්කමේ පිරිවැය ඉවත් කිරීම.
2. වත්කම ඉවත් කරන දිනට අදාළ සමුච්චිත ක්ෂය ගිණුම් පොත්වලින් ඉවත් කිරීම.
3. වත්කම ඉවත් කිරීමෙන් ලද අගය හෝ වත්කම් හුවමාරුවකදි ලැබෙන නව වත්කමේ අගය ගිණුම් තැබීම.
4. වත්කම ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කිරීම.

මෙහිදී "වත්කම් ඉවත් කිරීමේ ගිණුම" නමින් තාවකාලික ගිණුමක් අවශ්‍ය වේ.

**උදා 07 :-**

ව්‍යාපාරයක් සතුව තිබු පිරිවැය රු 1000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් රු 700,000 කට විකුණන ලදී. විකුණන දිනට අදාළ වත්කමේ සමුච්චිත ක්ෂය රු 500,000 ක් නම් මෙම ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන් වනුයේ,

| | |
|---|---|
| ගොඩනැගිලි ඉවත් කිරීමේ ගිණුම | හර 1,000,000 |
| ගොඩනැගිලි ගිණුම | බැර 1,000,000 |
| (වත්කමේ පිරිවැය ඉවත් කිරීම) | |
| | |
| ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීමේ ගිණුම | හර 500,000 |
| ගොඩනැගිලි ඉවත් කිරීමේ ගිණුම | බැර 500,000 |
| (වත්කම ඉවත් කරන දිනට අදාළ සමුච්චිත ක්ෂය පොත් වලින් ඉවත් කිරීම) | |
| | |
| මුදල් ගිණුම | හර 700,000 |
| ගොඩනැගිලි ඉවත් කිරීමේ ගිණුම | බැර 700,000 |
| (ගොඩනැගිලි විකුණුම් මුදල ගිණුම් තැබීම) | |
| | |
| ගොඩනැගිලි ඉවත්කිරීමේ ගිණුම | හර 200,000 |
| ලාභාලාභ ගිණුම | බැර 200,000 |
| (ගොඩනැගිලි විකිණීමෙන් ලද ලාභය සටහන් කිරීම) | |

වත්කම් ඉවත්කිරීමේ ගිණුම මඟින් වත්කම් විකුණුම් ලාභය හෝ අලාභය හඳුනාගත හැකි වේ.

ගොඩනැගිලි ඉවත් කිරීමේ ගිණුම

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 1,000,000 | ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම | 500,000 |
| | | මුදල් | 700,000 |
| ලාභය | 200,000 | | |
| | 1,200,000 | | 1,200,000 |

**විශේෂ සටහන්**

❖ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් විකිණීමේදී එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණිත සංචිතයේ ඇති අගය රඳවාගත් ඉපයුම් වලට මාරු කළ යුතුය.

❖ ව්‍යාපාරයක් කිසියම් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අදාළ වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය.

❖ සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කිරීමේදී පිරිවැය ක්ෂය අනුපාතයෙන් ගුණ කරන අතර හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය ගණනයේදී වත්කමේ ධාරණ අගය (එනම් පිරිවැය-සමුච්චිත ක්ෂය), ක්ෂය අනුපාතයෙන් ගුණ කරයි.



ටී. වෙනුරි ෆොන්සේකා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය






# නිවැරදිව ආයෝජන තීරණයක් ගනු ලබන්නේ කෙසේ ද?

ආයෝජනය යනු වර්තමානය වන විට බොහෝ ව්‍යාපාර මෙන්ම පුද්ගලයන්ගේ ද දැඩි අවධානයට හා කතාබහට ලක් වන මාතෘකාවකි. කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ දී නිශ්චිත අරමුණක් ඉටු කර ගැනීම සඳහාත් අනාගතයේ දී ප්‍රතිලාභයක් ලැබීම සඳහාත් පිරිවැයක් දරමින් සිදු කරන කාර්යය සමුදායක් ආයෝජන ව්‍යාපෘතියක් ලෙස හඳුන්වයි. අදාළ ආයෝජන ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් යෙදවිය යුතු ද නැද්ද යන්න හෝ ආයෝජන ව්‍යාපෘති කිහිපයක් ඇති විටෙක දී කුමන ආයෝජන ව්‍යාපෘතිය තෝරා ගත යුතු ද යනාදිය තීරණය කිරීම "ආයෝජන තීරණ" යන්නෙන් අදහස් වේ.

ව්‍යාපාරයක කළමනාකරුවන් විසින් ගනු ලබන ආයෝජන තීරණ වලට උදාහරණ කිහිපයක් ලෙස,

- නව වත්කමක් මිල දී ගැනීමේ තීරණ
- පවතින වත්කම් ඉවත් කොට නව වත්කම් මිල දී ගැනීමේ තීරණ
- නව වත්කම් ගොඩනැගීම සම්බන්ධ තීරණ (ගොඩනැගිලි ඉදිකිරීම් වැනි)
- විශාල ප්‍රචාරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණ

ආයෝජනයෙහි මුදල් ඇගයීමට ලක් කිරීමේ දී අදාළ ආයෝජනයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහ පදනම් කර ගන්නා අතර එම මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු කොට ඉන් පසුව සුදුසු ඇගයීමේ ක්‍රමයක් භාවිතා කරමින් ආයෝජන ව්‍යාපෘතියට අදාළ මුදල් ප්‍රවාහ ඇගයීමට ලක් කළ යුතු ය.

**ආයෝජනයකට අදාළ මුදල් ප්‍රවාහය**

ආයෝජනයකට අදාළ අනාගතයේ දී සියලු ම ආකාර වලින් ලැබිය හැකි යැයි අපේක්ෂා කරන මුළු මුදල් ගලා ඒම් සහ අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී දැරීමට සිදුවේ යැයි අපේක්ෂා කරන සියලු ම මුදල් ගලා යෑම් වල සමස්තය ආයෝජනයට අදාළ මුදල් ප්‍රවාහය වන අතර ලැබීම් ප්‍රවාහයන් සහ ගෙවීම් ප්‍රවාහයන් අතර වෙනස ශුද්ධ මුදල් ප්‍රවාහය ලෙස හඳුන්වයි.

**ආයෝජන තීරණයක පියවර**

1.පවතින මුදල් යෙදවිය හැකි විකල්ප ආයෝජන අවස්ථා හඳුනා ගැනීම.
2.එකිනෙක ආයෝජන අවස්ථාවල මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම.
3.සුදුසු ආයෝජන ඇගයීම් ක්‍රමයක් මත ආයෝජනය ඇගයීම.
4.වාසිදායකම ආයෝජනය තෝරා ගැනීම.
5.ආයෝජනය ක්‍රියාත්මක කිරීම.
6.ආයෝජනය පරිපාලනය කිරීම හා නඩත්තු කිරීම.

**ආයෝජනය ඇගයීමේ ක්‍රම**

යම්කිසි ව්‍යාපෘතියකට අදාළ මුදල් ප්‍රවාහය ඇගයීමට ලක් කිරීමේ දී ඒ සඳහා භාවිතා කරන විවිධ ඇගයීම් ක්‍රම අතරින් උසස් පෙළ හදාරන ඔබ ඉගෙන ගත යුතු ප්‍රධාන ඇගයීම් ක්‍රම තුනකි. ඒවා නම්,

✓ පිලිගෙවුම් කාල ක්‍රමය (Pay Back Period Method)
✓ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාත ක්‍රමය (Accounting Rate of Return)
✓ ශුද්ධ වර්තමාන වටිනාකම් ක්‍රමය (Net Present Value Method)

**1. පිලිගෙවුම් කාල ක්‍රමය (Pay Back Period Method)**

ආයෝජන ව්‍යාපෘතියකට අදාළ වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය මගින් ආයෝජන ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල ආපසු පියවා ගැනීම සඳහා ගතවන කාලය නැතිනම් වර්ෂ ගණන පිලිගෙවුම් කාලය වේ.

නැතහොත්,

යම්කිසි ආයෝජන ව්‍යාපෘතියක් සඳහා වැය කළ මුදල ආපසු ලබා ගැනීමට ගතවන කාලය පිලිගෙවුම් කාල ක්‍රමය ලෙස සරලව හැඳින්විය හැක.

පිලිගෙවුම් කාලය ඉහළ අගයක් ගැනීම තුලින් ආයෝජන තීරකයා බලාපොරොත්තු වන මට්ටමේ මුදල් ප්‍රවාහයක් නොලැබීම නිසා ආයෝජිත මුදල ආවරණය කර ගැනීම සඳහා ගතවන කාලය දීර්ඝ වන බව පෙන්නුම් කරයි. එසේම, පිලිගෙවුම් කාලය අවම අගයක් ගැනීම, ආයෝජනයට අදාළ ආයෝජිත මුදල අඩු කාලයක් තුල දී ආවරණය කර ගත හැකි බව පෙන්නුම් කරයි.

එසේනම්, පිලිගෙවුම් කාල ක්‍රමයෙන් ආයෝජන ඇගයීමේ දී වඩාත් යෝග්‍ය වන්නේ, පිලිගෙවුම් කාලය අඩුම ආයෝජන ව්‍යාපෘතිය තෝරා ගැනීම බව ඔබට වැටහෙනු ඇත.

**2. ශුද්ධ වර්තමාන වටිනාකම් ක්‍රමය (Accounting Rate of Return)**

ව්‍යාපෘති ඇගයීම සඳහා වඩාත් දියුණු සහ ඵලදායිම ක්‍රමය ලෙස මෙම ක්‍රමය හැඳින්විය හැකිය. මෙහි දී යම්කිසි ව්‍යාපෘතියකට අදාළ ව පැන නගින අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම සැලකිල්ලට ගෙන ව්‍යාපෘතිය ඇගයීම සිදුවේ.

මුදල්වල ශුද්ධ වර්තමාන අගය යනු යම්කිසි ආයෝජන ව්‍යාපෘතියට අදාළ ව අනාගතයේ දී ලබන මුදල් වල වර්තමාන වටිනාකමත් ගෙවන මුදල් වල වර්තමාන වටිනාකමත් අතර වෙනසයි.

අනාගත මුදල් ප්‍රවාහයන් හි වර්තමාන අගය සෙවීම සඳහා වට්ටම් අනුපාතයක් ලෙස හඳුනා ගනු ලබන ආයෝජනයට අදාළ ප්‍රතිලාභ අනුපාතයකින් මුදල් ප්‍රවාහය වට්ටම් කළ යුතු ය.

එක් එක් වර්ෂයට අදාළ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කොට එය අදාළ වට්ටම් සාධකයෙන් ගුණ කොට ලබා ගන්නා සියලු ම අගයන්වල එකතුව මූලික ආයෝජනයෙන් අඩු කොට ශුද්ධ වර්තමාන අගය ගණනය කරනු ලබයි.

(උසස් පෙළ හදාරන ඔබට අදාළ වට්ටම් සාධක සෑම විටම ප්‍රශ්න පත්‍රයේ ලබා දී ඇත)

එහි දී ලැබෙන අගය ධන අගයක් නම් එයින් කියවෙන්නේ අනාගතයේ දී ලැබෙන මුදල් ප්‍රවාහයෙන් දැරිය යුතු යම් වියදමක් වේ නම් එයද ගෙවීමෙන් පසු ආයෝජනයෙන් යම් මුදල් ප්‍රවාහයක් ලැබෙන බවයි. එසේ නම් ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගන්නා ආයෝජනයක් තෝරා ගැනීම වාසි සහගත බව ඔබට වැටහෙනු ඇත.

**3. ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාත ක්‍රමය (Net Present Value Method)**

ව්‍යාපෘතියේ ආයෝජනය සඳහා ලැබෙන සාමාන්‍ය ගිණුම්කරණ ලාභය අතර අනුපාතයක් ගොඩනගමින් ඉහළම ප්‍රතිලාභ අනුපාතයක් සහිත ව්‍යාපෘතිය තෝරා ගැනීම මෙහි දී සිදු වේ. මුදල් ප්‍රවාහය වෙනුවට ගිණුම්කරණ ලාභය සම්බන්ධ කර ගනිමින් ව්‍යාපාරය පිළිබඳ තීරණ ගැනීම මෙහි දී විශේෂිත ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

$$\text{ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{සාමාන්‍ය ගිණුම්කරණ ලාභය}}{\text{මූලික ආයොජනය හෝ සාමාන්‍ය ආයොජනය}} \times 100\%$$




මෙහි දී ආයෝජන තීරකයා විසින් කල්තියා ප්‍රතිලාභ අනුපාතය ඇස්තමේන්තු කොට ඉන් පසු සත්‍ය ප්‍රතිලාභ අනුපාතය ගොඩනගයි. එහි දී ඇස්තමේන්තු ගත ප්‍රතිඵලයට වඩා සත්‍ය අනුපාතය විශාල වන්නේ නම් හෝ සමාන වන්නේ නම් අදාළ ආයෝජන ව්‍යාපෘතිය තෝරා ගැනීම යෝග්‍ය යැයි තීරණය කරනු ලබයි.

මතකයට,

- ආයෝජනය සිදු කරන වර්ෂය 0 වෙනි වර්ෂයයි
- කාරක ප්‍රාග්ධන වියදම් 0 වෙනි වර්ෂයේ ඍණ මුදල් ප්‍රවාහයක් වන අතර අවසාන වර්ෂයේ ධන මුදල් ප්‍රවාහයක් වේ.
- ආයෝජනය අවසානයේ ඉතිරි කොටස් විකිණීමෙන් ලැබෙන සුන්බුන් අගය ව්‍යාපාරයට මුදල් ගලා ඒමකි. එනම් එය අවසාන වසරේ ධන මුදල් ප්‍රවාහයකි.
- නව වත්කම් මිල දී ගැනීමක දී පැරණි වත්කම විකුණා ඇත්නම් එම මුදල් ලැබීම 0 වෙනි වර්ෂයේ ධන මුදල් ප්‍රවාහයක් ලෙස සලකයි.
- මුදලකට කාලීන අගයක් ඇති බවට සැලකිය යුතු ය.එහි දී මුදලක අද අගය “වර්තමාන අගය” (PV)ලෙසත් මුදලක හෙට අගය “අනාගත අගය” (FV) ලෙසත් සැලකේ.
- වට්නාකම ගණනයට අනාගත මුදලක අගය අඩු කළ යුතුය. ඒ සඳහා අනාගත මුදලක් වට්ටම් කළ යුතු ය.

මේ ආකාරයෙන් පිලිගෙවුම් කාල ක්‍රමය, ශුද්ධ වර්තමාන වට්නාකම් ක්‍රමය, සහ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාත ක්‍රමය යන ආයෝජන ඇගයීම් ක්‍රම භාවිතා කරමින් ඉහළ ප්‍රතිලාභයන්ගෙන් යුතු නිවැරදි ආයෝජන තීරණ ගනු ලබන්නේ කෙසේ ද යන්න ඔබට තීරණය කළ හැකිය.



පි.අයි.එම්.පිහනගේ
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# උද්ධමනය හා එහි හැසිරීම පිළිබඳ ආර්ථික විද්‍යාත්මක විග්‍රහයක්

**උද්ධමනය යනු කුමක් ද? (What is Inflation?)**

උද්ධමනය යනු භාණ්ඩ වල මිල ඉහළ යාම ද? මතුපිට අදහස එය වුවත් එහි නියම අදහස වනුයේ,

"ආර්ථිකයේ පොදු මිල දර්ශකයේ ඇති වන අඛණ්ඩ ඉහළ යාම යි.

මෙය කෙටි කාලයක් තුළ නොව දිගු කාලයක් පුරාවට සිදුවන ක්‍රියාවලියකි. ආර්ථිකයක උද්ධමනකාරී තත්ත්වයක් ඇති වීමට බොහෝ විට හේතු වනුයේ රටේ සමස්ත පාරිභෝගිකයන්ගේ පරිභෝජනය වැඩි වී සමාහාර ඉල්ලුම වැඩිවීම හෝ නිෂ්පාදන පිරිවැය වැඩි වී සමාහාර සැපයුමේ සිදුවන අඩුවීමක් නිසාවෙනි. ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීම සඳහා යොදාගන්නා නිල මිල දර්ශකය වන්නේ ජාතික පාරිභෝගික මිල දර්ශකයයි.

**උද්ධමනය මනින්නෙ කෙසේ ද? (Measuring the Inflation)**

රටක උද්ධමනය මැනීම සිදුකරනුයේ උද්ධමන අනුපාතිකය මගිනි. කිසියම් නිශ්චිත කාල සීමාවක් තුළ, සමස්ත මිල දර්ශකය ඉහළ යන ප්‍රතිශතය උද්ධමන අනුපාතිකය වේ. උද්ධමන වේගය ලෙසද මෙය හඳුන්වයි.
මෙය ප්‍රධාන ආකාර තුනකින් මනිනු ලබයි

1. මාසික උද්ධමන අනුපාතිකය (Monthly Inflation rate)
- අනුයාත මාස දෙකක් අතර මිල දර්ශකවල ප්‍රතිශතාත්මක වෙනස.

2. ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය (Point Inflation rate)
- අනුයාත කාලපරිච්ඡේද දෙකක් අතර මිල දර්ශකවල ප්‍රතිශාත්මක වෙනස.

3. වාර්ෂික උද්ධමන අනුපාතිකය (Annual Inflation rate)
- අනුයාත වර්ෂ දෙකක් අතර මිල දර්ශක වල ප්‍රතිශතාත්මක වෙනස




මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2020

**ආර්ථිකයේ මිල මට්ටම වැඩිවීම උද්ධමනය නම්, මිල අඩුවීම කුමක්ද? (What is Deflation?)**

ආර්ථිකයක් තුළ සමස්ත මිල මට්ටම වැඩිවීමේ තත්ත්වයන් මෙන්ම මිල මට්ටම අඩුවීමේ තත්ත්වයන් ද දැකිය හැකිය. මෙලෙස ආර්ථිකයේ පොදු මිල දර්ශකයේ අඛණ්ඩ පහළ යාම අවධමනය ලෙස හඳුන්වනු ලබයි. සරලවම මෙය උද්ධමනයේ ප්‍රතිවිරුද්ධ තත්ත්වයයි.

මෙලෙස රටක් බොහෝ විට සමස්ත මිල මට්ටමේ පහළ යාමකට මුහුණ දෙනුයේ සමාහාර ඉල්ලුමේ අඩුවීමක් හෝ සමාහාර සැපයුමේ සිදුවන වැඩිවීමක් නිසාවෙනි.

ව්‍යාපාර චක්‍රයේ පසුබැසීමේ අවධිය තුළින් අවධමනකාරී තත්ත්වයක් නිරූපණය කරනු ලබයි. රටක් අවධමනකාරී තත්ත්වයකට පත්ව ඇති විට සමස්ත නිෂ්පාදනයේ පහළ බැසීමක්, සේවා නියුක්තිය පහළ යාමක්, මුදල් සැපයුමේ අඩුවීමක් වැනි ආර්ථික සංසිද්ධීන් වලට මුහුණ දෙනු ලබයි.

උදා :2007-2008 කාලවකවානුවේදී ඇ.එ.ජ. ආර්ථිකය විසින් මුහුණ දුන් අවධමනය.

**මතුපිට උද්ධමනයට එරෙහිව මූලික උද්ධමනය (Headline Inflation Vs. Core Inflation)**

ආර්ථික විශ්ලේෂකයන්ගේ අවශ්‍යතාවය අනුව උද්ධමනය යන සංකල්පය විවිධ ආකාරවලට බෙදා නිර්වචනය කර ඇත. එලෙස උද්ධමනය නිර්වචනය කර ඇති ආකාර දෙකක් ලෙස මතුපිට උද්ධමනය හා මූලික උද්ධමනය දැක්විය හැකියි.

මතුපිට උද්ධමනය යනු ආර්ථිකයක පොදු මිල මට්ටම සැබෑ වශයෙන් ඉහළ නැග ඇති අනුපාතිකයයි. නැතහොත් සමස්ත උද්ධමනය පෙන්නුම් කරනු ලබන දර්ශකයයි.

ආර්ථිකයක් තුළ සිදුවන තාවකාලික සැපයුම් කම්පන සහ මිල ගණන්වල සිදුවන තාවකාලික මිල ඉහළ යාම් මතුපිට උද්ධමනය තුළ ඇතුළත් වේ.

එමෙන්ම
පාලන මිල ගණන් ඉහළ යාම්,
ආනයන මිල ගණන් ඉහළ යාම්,
අයහපත් කාලගුණික තත්ත්ව නිසා ඇතිවන සැපයුම් සීමා වැනි කරුණු නිසා මිල මට්ටමට වන බලපෑම මෙම මතුපිට උද්ධමනය තුළ ඇතුළත් විය හැකිය.

මතුපිට උද්ධමනය ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතු වැදගත්ම කරුණ නම් මතුපිට උද්ධමනය තුළ ආහාර, ඉන්ධන හා බලශක්ති වියදම් වල මිල ගණන් ඇතුළත් කරයි.

මූලික උද්ධමනය යනු මතුපිට උද්ධමනයේ පවතින තාවකාලික මිල වෙනස්කම් සමනය කිරීම සඳහා ගළපන ලද උද්ධමන අනුපාතිකයයි. එනම්,

මූලික උද්ධමනය ගණනය කිරීමේදී ඇතුළත් කෙරුණු තාවකාලිකව මිලෙහි උච්චාවචනයන් ඇති කරනු ලබන ආහාර, ඉන්ධන හා බලශක්ති වියදම් වල මිල ගණන් ඉවත් කර ගණනය කර ඇති උද්ධමන අනුපාතිකයයි. ලෝකයේ බොහෝ රටවල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගනු ලබන්නේ මතුපිට උද්ධමනයෙන් නොව මූලික උද්ධමනයේ හැසිරීම අනුවයි.

**ආර්ථිකයක උද්ධමනයක් හටගන්නේ කෙසේ ද? (Causes for Inflation)**

ආර්ථිකයක පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාම අපි උද්ධමනය ලෙස පෙර දී සාකච්ඡා කළෙමු. මෙලෙස ආර්ථිකයක සමස්ත මිල මට්ටමේ නොනවතින ඉහළ යාමට හේතු මොනවා ද? මෙයට හේතු පැහැදිලි කිරීම සඳහා යොදාගනු ලබන ප්‍රවේශයන් දෙකකි.

1. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය **(Demand – Pull Inflation)**

ආර්ථිකයක සමාහාර සැපයුමට සාපේක්ෂව සමාහාර ඉල්ලුම ඉහළ යාම නිසා ආර්ථිකයෙහි ඇති සියලුම භාණ්ඩ හා සේවා වල මිල ඉහළ යාම මගින් සමස්ත මිල මට්ටමේ හටගන්නා අඛණ්ඩ ඉහළ යාමයි. මෙවැනි තත්ත්වයක් ආර්ථික විශේෂඥයින් විසින් පහදනු ලබන්නේ" සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස අති විශාල මුදල් ප්‍රමාණයක් හඹායාමක්" ලෙසටයි.

ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය හටගැනීමට පහත හේතූන් බලපානු ලබයි

- මුදල් සැපයුම ප්‍රසාරණය වීම නිසා පරිභෝජනය ඉහළ යාම.
- පොලී අනුපාතිකය පහළ වැටීම නිසා ආයෝජන දිරිමත් වීම.
- ජනතාවගේ වැයකළ හැකි ආදායම ඉහළ යාම
- වත්කම් හා හිමිකම් ඉහළ යාම.



ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය

## 2. පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය (Cost push Inflation)

පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමන න්‍යායට අනුව මිල මට්ටම් ඉහළ යාමට හේතුව වන්නේ සමස්ත සැපයුමේ සංකෝචනයක් ඇති වීමයි. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා සමාහාර සැපයුම පහළ ගොස් සමස්ත භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාමෙන් පොදු මිල මට්ටමෙහි හටගන්නා අඛණ්ඩ ඉහළ යාම මෙය වේ.

පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයට පහත සාධක බලපානු ලබයි.



පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය

- ✓ රජය විසින් පනවන වක්‍ර බදු
- ✓ වැටුපෙන් තල්ලුවුණු උද්ධමන පීඩන නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
- ✓ ලාභයෙන් තල්ලුවුණු උද්ධමන පීඩනය.
- ✓ අමුද්‍රව්‍ය වල හෝ බලශක්ති යෙදවුම්වල හදිසි හෝ අනපේක්ෂිත මිල වැඩිවීම් නිසා ඇතිවන සැපයුම් කම්පන.

## ආර්ථිකයක උද්ධමනය නිසා ඇතිවිය හැකි ප්‍රතිවිපාකයන් (Consequences of Inflation)

- ❖ උද්ධමනය නිසා රටක ප්‍රධාන වශයෙන්ම සිදුවන්නේ මුදලේ අගය පිරිහීමට ලක්වීමයි. එනම් ආර්ථිකයක මුදල් ඒකකයකින් මිලදීගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය පහළ යාමයි. මෙම හේතුව නිසා ආර්ථිකයක පහත සඳහන් ප්‍රතිවිපාකයන් හටගනියි.
- ❖ උද්ධමන තත්ත්වයකදී රටක ස්ථාවර ආදායම් ලබන්නන්ගේ මූර්ත ආදායම අඩු වෙයි. මෙයට හේතුව වන්නේ උද්ධමන අනුපාතිකයට සාපේක්ෂව ඔවුන්ගේ වැටුප් හා වේතන ඉහළ නොයාමයි. එයට ප්‍රතිවිරුද්ධව විචල්‍ය ආදායම් ලබන්නන් ඔවුන්ගේ ආදායම උද්ධමන අනුපාතිකයට සරිලන ආකාරයට හැඩගස්වාගනු ලබයි.
- ❖ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා ඉතුරුම්වල මූර්ත අගය පහළ යනු ලබයි. එමෙන්ම උද්ධමනයකදී මූර්ත පොලිය පහළ යන බැවින් ඉතුරුම් අධෛර්යමත් වනු ලබයි.
- ❖ උද්ධමනයකදී ඉතුරුම් පහළ යන බැවින් ආයෝජන පහළ යනු ලබයි.
- ❖ ණයහිමියන්ට උද්ධමනය අවාසි සහගත වෙයි. එයට හේතුව උද්ධමනය නිසා මුදලේ අගය පිරිහෙන බැවින් ණයට දුන් මුදල ආපසු ලබා ගැනීමේ දී එම මුදල්වල ක්‍රය ශක්තිය අඩුවී පැවතීමයි.
- ❖ ණයගැතියන්ට උද්ධමනය වාසි සගහත වෙයි. මන්ද යත් ස්ථිර පොලී අනුපාතිකයක් යටතේ ණය ලබාගෙන සිටින ණයගැතියන්ට උද්ධමන තත්ත්වයක් හේතුවෙන් ගෙවීමට ඇති පොලිය සහ ණය වාරිකයේ මූර්ත අගය අඩුවන බැවිනි.
- ❖ සේවා වියුක්තිය සහ උද්ධමනය අතර පවතිනු ලබන්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි. උද්ධමනය නිසා භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදකයින් සැපයුම ඉහළ නැංවීමට උත්සාහ කරනු ලබයි. එබැවින් සේවා නියුක්තිය ඉහළ ගොස් සේවා වියුක්තිය පහළ බසියි. මෙය පිලිප්ස් වක්‍රය මගින් පැහැදිලි කෙරෙයි.




ටී.එම්. සකුණ තෙන්නකෝන්
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය




පිලිප්ස් වක්‍රය




# COVID-19 වසංගතයේ ආර්ථික බලපෑම වෙළෙඳපොළ සමතුලිතයට බලපෑවේ කෙසේද?

පවත්නා කොවිඩ්-19 වසංගත තත්වය සමග වෙළඳපොල සමතුලිතයට සිදු වූ ප්‍රායෝගික බලපෑම පිළිබඳ විමසුමක් මෙහිදී සිදු කරනු ලබයි.

වෙළෙඳපොළ සමතුලිතය වෙළඳපොලේ සිටින ගැනුම්කරුවන්ගේ මිලදී ගැනීමේ සැලසුම් සහ විකුණුම්කරුවන්ගේ අලෙවිකරණ සැලසුම් එකිනෙකට තුලිත වන අවස්ථාවක් ලෙස සරලව නිර්වචනය කල හැක. වෙළඳපොල සමතුලිතය ප්‍රධාන වශයෙන් ඉල්ලුම් හා සැපයුම් බලවේග මත තීරණය වෙයි. ඉල්ලුමේ හා සැපයුමේ සිදුවන්නා වූ වෙනස්කම් මත සමතුලිත මිල හා ප්‍රමාණය ද විවිධ වූ වෙනස්කම් වලට කාලානුරූපීව ලක්වන බව දැකිය හැකිය.

## තෝරගත් භාණ්ඩ කිහිපයක් ඇසුරින් වෙළඳපොල සමතුලිතයට වූ බලපෑම විමසීම.

වසංගතය උද්ගත වූ මුල් කාලයේ KN-95 මුඛ ආවරණ සඳහා අධික ඉල්ලුමක් පැන නැගුන නමුත් එකී ඉල්ලුම පූරණය කිරීමට තරම් ප්‍රමාණවත් සැපයුමක් නොවූ හෙයින් වෙළඳපොල තුල මුඛ ආවරණ සඳහා ඉහළ මිලක් නියම වී තිබුණි. නමුත් කලානුරූපීව මුඛ ආවරණ නිෂ්පාදනය ද ක්‍රමානුකූලව වර්ධනය වූ බැවින් පෙර පැවති ඉහළ මිල වෙනුවට වෙළඳපොල තුල මුඛ ආවරණ සඳහා අඩු මිලක් නියම වූයේය. එම වෙළඳපොල සමතුලියතයෙහි වෙනස් වීම පහත ඉල්ලුම් සැපයුම් වක්‍ර මගින් නිරූපණය වෙයි.




වසංගතය ආරම්භ අවස්ථාවේ පැවති තත්වය




කාලයත් සමග සැපයුමේ වැඩි වීමෙන් පැවති තත්වය

මෙහි A ලක්ෂ්‍ය මගින් වසංගතයට පෙර මුඛ ආවරණ සඳහා වූ සමතුලිත මිල හා ප්‍රමාණය ද B ලක්ෂ්‍ය මගින් වසංගතය ආරම්භයේ දී මුඛ ආවරණ සඳහා වූ සමතුලිත මිල හා ප්‍රමාණය ද නිරූපණය වෙයි. C ලක්ෂ්‍යය මගින් පසුකාලීනව වෙළඳපොලේ මුඛ ආවරණ සඳහා නියම වූ සමතුලිත මිල හා ප්‍රමාණය ද නිරූපණය වෙයි.

මෙම සිදුවීම පිලිබඳ විමසීමේ දී වසංගත තත්වය ඉල්ලුම් තීරකයක් ලෙස ප්‍රබල බලපෑමක් සිදුකර ඇති අතර වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා සෞඛ්‍ය උපදෙස් මත මුඛ ආවරණ භාවිතයට පාරිභෝගික රුචිය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස එකවර සැලකිය යුතු ලෙස ඉල්ලුම ඉහළ ගිය නමුදු එකී ඉල්ලුම් සපුරාලීමට තරම් ප්‍රමාණවත් සැපයුමක් වෙළඳපොල තුල නොවූ නිසා පාරිභෝගිකයාට ඉහල මිලක් යටතේ මුඛ ආවරණ මිලදී ගැනීමට සිදු විය. නමුත් පසුකාලීනව

- නව සැපයුම්කරුවන් වෙළඳපොලට අවතීර්ණ වීම
- නිෂ්පාදන සාධක සුලභත්වය
- තාක්ෂනික දියුණුව

යන සැපයුම් තීරක වල වෙනස් වීම මූලික කොටගෙන සැපයුම්කරුවන්ගේ සමස්ථ සැපයුම වර්ධනයක් වූ නිසා B ලක්ෂයේ සිට C ලක්ෂ්‍යය දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය විචලනය වී ඇත.

වසංගතයත් සමග ජංගම දුරකථන වෙළඳපොලෙහි හැසිරීම ගත් විට අධ්‍යාපන කටයුතු මාර්ගගත ආකාරයෙන් සිදුවීම නිසා ජංගම දුරකථන සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේය. එවැනි පසුබිමක රජය පැනවූ ආනයන සීමාව හේතුවෙන් ආනයනකරුවන්ට වෙළඳපොලේ සැපයුම ස්ථාවරව පවත්වා ගත හැකි නොවීම නිසා සමස්ථ සැපයුම අඩු වී ජංගම දුරකථන සඳහා පවතින මිල විශාල වශයෙන් ඉහළ ගියේය. ඉල්ලුම් සැපයුම් වක්‍ර මගින් එම සිදු වීම පහත පරිදි නිරූපණය කළ හැකිය.




A ලක්ෂ්‍යය මගින් ජංගම දුරකථන වෙළඳපොලේ පෙර පැවති සමතුලිත මිල හා ප්‍රමාණය නිරූපණය වෙයි. මෙහිදී පාරිභෝගික ඉල්ලුම වසංගතය සමඟ ඉහල යාම D1 ඉල්ලුම් රේඛාවෙන් නිරූපණය වන අතර (B) ලක්ෂ්‍යය මගින් නව ඉල්ලුම් ප්‍රමාණය නිරූපණය වෙයි. මහ බැංකුව විසින් පනවනු ලැබූ ආනයන සීමා කිරීම මගින් ආනයනකරුවන් අධෛර්යමත් විය. මේ හේතුවෙන් ඉල්ලුම වැඩි වුවද ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් සැපයුම අඩු වන නිසා සමතුලිත ප්‍රමාණය පැවති තත්වයට වඩා අඩු වී සමතුලිත මිල විශාල ලෙස ඉහළ ගියේය. එය C ලක්ෂයෙන් නිරූපණය වෙයි.



## ආනයන සීමා කිරීම සහ විනිමය වෙළඳපොල සමතුලිතය

තෝරාගත් භාණ්ඩ 623ට භාණ්ඩ ආනයනය කිරීමේදී 100% ක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවයක් වහාම ක්‍රියාත්මක වන පරිදි පැනවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් පාලන මණ්ඩලය පසුගිය සැප්තැම්බර් (08) වන දින පැවති රැස්වීමේ දී තීරණය කළේය. මෙසේ ආනයන සීමා පැනවීමට මූලික හේතුව රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගැනීමයි. රුපියල හා ඩොලරය අතර විනිමය අනුපාතික මිල තීරණය වීමට ද බලපානුයේ විනිමය අනුපාතික වෙළඳපොල සමතුලිතය යි. වසංගත තත්වයත් සමග ලංකාවේ විදේශ විනිමය සැපයුමට බලපාන කරුණු වන

- විදේශීය සංචාරකයින් මවි රටට පැමිණෙන විට ගෙනෙන විදේශ මුදල්
- විදේශිකයන් ස්වදේශීය රටේ බැඳුම්කර හා කොටස් සඳහා කරන ඍජු ආයෝජන
- විදේශිකයන් අපේ අපනයන හරහා ස්වදේශීය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ලැබෙන විදේශ මුදල්

යනාදියේ සැලකිය යුතු අඩු වීමක් සිදුවිය. නමුත් ලංකාවේ විදේශ මුදල් ඉල්ලුම සාමාන්‍ය පරිදි පැවතුනි. මෙම හේතුව නිසා රුපියල හා ඩොලරය අතර පවතින සමතුලිත මිල වැඩි වී රුපියල අවප්‍රමාණය වීමට පටන් ගැනුණි. පහත ඉල්ලුම් සැපයුම් වක්‍ර මගින් ඒ පිළිබඳව නිරූපණය වෙයි.




මෙම හේතුව මත මහ බැංකුව ආනයන සීමා පනවමින් රුපියල අවප්‍රමාණය වීම වලක්වා ගැනීමට කටයුතු කළේය. ආනයන සීමාව විනිමය අනුපාතික වෙළඳපොල සමතුලිතයට සිදුකල බලපෑම පහත පරිදි නිරූපණය කල හැක.




මෙහි A මගින් වසංගතයට පෙර සමතුලිතය ද B මගින් වසංගතය නිසා සිදු වූ සැපයුම් පහල යාම නිසා රුපියල අවප්‍රමාණය වූ අයුරු ද C මගින් ආනයන අධෛර්‍යමත් වී රුපියල යලි පෙර පැවති තත්වයට ගෙන ඒමට ගත් උත්සාහය ද නිරූපණය වෙයි.

මෙලෙස වෙළඳපොල සමතුලිතයෙහි ප්‍රායෝගික තත්වයන් වර්තමාන ආර්ථික පරිසරය ආශ්‍රයෙන් අප හට අධ්‍යයනය කල හැකිය.




ආර්.ඒ ආර්.ඒ.රාජපක්ෂ
මූල්‍ය අධ්‍යයන අංශය
පළමු වසර

# "සිප්වරණ" ප්‍රශ්නෝත්තර තරඟාවලිය

- "ශිල්ප" අ.පො.ස. උසස් පෙළ සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව පවත්වනු ලබන සිප් වරණ ව්‍යාපාර අධ්‍යයනය විෂයානුබද්ධ ප්‍රශ්නෝත්තර තරඟාවලිය සඳහා බහුවරණ ප්‍රශ්න (50) කින් සමන්විත ප්‍රශ්ණාවලියක් ඔබට ලබා දී ඇත.

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

## ප්‍රශ්නාවලියට පිවිසීම සඳහා පහත පියවර අනුගමනය කරන්න.

- පහත සඳහන් QR කේතය (Code) ස්කෑන් (Scan) කර හෝ සබැඳිය (Link) ඔස්සේ ප්‍රශ්නාවලියට පිවිසිය හැකිය.

http://form-timer.com/start/250184f8

- ඉන්පසු ඔබගේ තොරතුරු ඇතුලත් කිරීමට ගූගල් (Google Form) පෝරමයක් දිස්වේ.

- එහි ඔබගේ නම,විද්‍යුත් තැපැල් ලිපිනය,පාසල දිස්ත්‍රික්කය හා දුරකථන අංකය ඇතුලත් කරන්න.

- පිළිතුරු සැපයීම සඳහා පැය (01) විනාඩි (15)ක කාලයක් හිමිවන අතර එක් ශිෂ්‍යයෙක් සඳහා එක් අවස්ථාවක් පමණක් හිමි වේ.

- පිළිතුරු සැපයීමෙන් පසුව ප්‍රශ්ණාවලිය අවසානයේ ඇති **Submit button** එක **Click** කරන්න.

- නියමිත කාල සීමාව තුල පිළිතුරු සැපයිය යුතු අතර ප්‍රමාද වී ලබාදෙන පිළිතුරු භාරගනු නොලැබේ.

- ප්‍රශ්න සියල්ලටම නිවැරදිව පිළිතුරු ලබාදුන් ජයග්‍රහකයන් පස් දෙනෙකු දෙවන සම්මන්ත්‍රණ දින අවසානයේදී ප්‍රකාශයට පත් කරන අතර එම ජයග්‍රහකයින් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (Institute of Chartered Accountants of Sri Lanka) විසින් එක් අයෙකුට රු.13200 වටිනා ශිෂ්‍යත්වයන් 5ක් පිරිනමනු ලබයි.

**අනුග්‍රහය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය.**

CA
THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# අවුරුදු 23 දී ඩිහාන් වරලත් ගණකාධිකාරීවරයකු ලෙස සුදුසුකම් ලබයි !

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ
පාඨමාලාව වසර 3ක් තුළ නිමා කිරීමට ඔහුට හැකි නම්,

## ඔබටත් එය කළ හැක.

අ.පො.ස. උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින්
සාමාන්‍ය සාමාර්ථ 3 ක් මත ලියාපදිංචි විය හැක.



“ මේ ඩිහාන්ගේ කතාව....

ගණකාධිකරණය පිළිබඳ හොඳම වෘත්තීය සුදුසුකමෙන් සන්නද්ධව වෘත්තීය ගණකාධිකරණ ක්ෂේත්‍රයේ ආරම්භයක් ගැනීමට මට අවශ්‍ය වුණා. ඒ නිසයි මම උසස් පෙළ විභාගයට පෙනී සිටි වහාම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාඨමාලාව හා සම්බන්ධ වුණේ. 2016 වර්ෂයේ දී මම මගේ පළමුවන විභාගයට පෙනී සිටියා. ඒ වර්ෂයේ දීම මට **Executive Level** විභාගයත් සමගින් **Business Level**

**විෂයයන් දෙකක් සම්පූර්ණ කිරීමට හැකියාව ලැබුණා.**
පසුව, 2017 දී මට විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීමට හැකියාව ලැබුණා. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාඨමාලාව හැදෑරීම තුළින් මා ලබාගත් දැනුම උපාධි අපේක්ෂකයකු ලෙස මගේ අධ්‍යයන කටයුතුවලදී බොහෝ උපකාරී වුණා. මම විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට පෙර සිටම ප්‍රායෝගික පුහුණු කටයුතුවල උනන්දුවෙන් යෙදී සිටි නිසා එය වරලත් ගණකාධිකරණ ආයතන පාඨමාලාවේ **Strategic Level**
**අධ්‍යාපනවලදී ඉතා ප්‍රයෝජනවත් වුණා. මේ ආකාරයෙන් උපාධියත්, ශ්‍රී ලංකා වරලත්** ගණකාධිකරණ ආයතනයේ වෘත්තීය සුදුසුකමත් එකවර සම්පූර්ණ කිරීමට මට හැකියාව ලැබුණා.

අද වන විට, වයස අවුරුදු 23ක් වන මම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පාඨමාලාව සාර්ථකව නිමා කර ඇති බව පවසන්නේ හද පිරි සතුටින්. ”

CA
THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS OF SRI LANKA

අමතන්න
සුජීවා - 0710235241, අරුණ - 0710235248

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
30 A, මලලසේකර මාවත, කොළඹ 07


ACCA
ACCA + BSc (Hons) Degree in Applied Accounting within two and a half years.
Become a globally recognised finance professional with ACCA
Register now at yourfuture.accaglobal.com
Make use of this great opportunity and expand your career mobility.
Call 0112424801 or 0773874247 for more details.
ACCA Sri Lanka, Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2.
Think Ahead



Empowering future generations with knowledge and skills to enter and command in the new world of Banking & Finance...........
CLASSES
ONLINE
FREE
IN PRESENCE
WITH A FEE
අභියෝගාත්මක
අනාගත ලෝකයේ
බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ
අද්විතීය වෘත්තිකයෙක් වීමට
දැනුම හා කුසලතා වර්ධනය
සඳහා ශ්‍රී ලංකා
බැංකුකරුවන්ගේ
ආයතනය
හා අත්වැල් බැඳගන්න.
වෘත්තීය ජීවිතයේ අඛණ්ඩ
ප්‍රගතිය සඳහා මාවත
උසස් පෙළින්
පසු ලියාපදිංචි
වන්න
ශ්‍රී ලංකා
බැංකුකරුවන්ගේ
ආයතනය
1979 අංක 26 දරණ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (සංස්ථාපනය) පනත යටතේ පිහිටුවා, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු, සම්මාන හා ආශ්‍රිත සාමාජිකයින් නියෝජනය වන පාලක මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබන ආයතනයකි.
IBSL
INSTITUTE OF BANKERS OF SRI LANKA
CREATING STARS
01124 25 777
www.ibsl.lk
facebook.com/ibsl.lk
80A, ඇල්විටිගල මාවත, කොළඹ 08

# සංවිධායක කමිටුව - මූල්‍ය විමසුම



එන්. ඒ. සිනෙත්
නෙත්තසිංහ



ඒ.ආර්.පී.ඉමේෂා
පෙරේරා



පමෝද ජයසංක



ඊ.පී. දිනුෂි
ඇල්ලේපොළ



ජී.වී.මලින්
විජයන්ත



ආර්.එම්.සචිනි
රත්නායක



ඊ.ඩබ්ලිව් . දුලංජන
සෙනෙවිරත්න



ජී.ජයනී පෙරේරා



කෝලිත වීරසිංහ



ආර්.එච්.එම්.කවීශ
තිමිර



යූ.පී.එච්
අරුණෝද්‍යා වීරසිංහ



කේ.ඒ.චාරුක
කුමාරසිංහ



ඩබ්ලිව්. ශාරධා
දිල්ෂානි



ජී.වී.ඒ. ෂෙලෝමි
පීරිස්



ඊ.ඒ.ඩී.තරුෂි
මල්ශා



එස්.කේ.රුසිරු
නිම්සර



ඩබ්ලිව්.වයි.සෙනාලි
ඩී සිල්වා



කේ.ඒ.එරන්දී
නිමාශා



ජී.ඒ. චමිඳු ඉෂංක



තාරක ඉලංගරත්න



එච්.ඩී.එච්.සෙනුරි
දුනුකේ



ආර්.එල්.ඒ.රොෂාන්
රත්නායක



එම්.ආර්.කේ.
ශ්‍යාමිකා ධර්මප්‍රිය

මූල්‍ය අධ්‍යයන අංශයේ ප්‍රකාශනයකි.